**GAVESHANA** ISSN 1391-8168

**දේශීය පර්යේෂණ සංස්කෘතියක් සඳහා** **2009 ජනවාරි - ජූනි** **14 වන කලාපය** **මිල රු. 60/-**

● **ප්‍රධාන සංස්කාරක/Chief Editor** ආචාර්ය ගොඩ්වින් කොඩිතුවක්කු/ Dr. Godwin Kodituwakku *(BEd, MA(Ed), PhD)* ● **නියෝජ්‍ය සංස්කාරක/ Deputy Editor** වෛද්‍ය චෙස්මාල් සිරිවර්ධන/Dr. Chesmal Siriwardhana *(MD)* ● **සංස්කාරක මණ්ඩලය/Editorial Board** වෛද්‍ය ගෝමින්ද පොන්නම්පෙරුම/Dr. Gominda Ponnamperuma *(MBBS)*, වෛද්‍ය අතුල සුමතිපාල/ Dr. Athula Sumathipala *(MBBS,DFM.MD,MRCPsych, CCST, PhD(Lond.)*, වෛද්‍ය සුවින් හේවගේ/Dr. Suwin Hewage *(MBBS)* , වෛද්‍ය රෝහණ දයාරත්න/Dr. Rohana Dayaratne *(MBBS, MSc, MD)*, වෛද්‍ය නිහාල් අබේසිංහ/ Dr. Nihal Abeysinghe *(MBBS, MSc, MD)*, වෛද්‍ය සිසිර සිරිබද්දන/ Dr. Sisira Siribaddana *(MBBS, MD)*, වෛද්‍ය සුදත් සමරවීර/Dr. Sudath Samaraweera *(MBBS, MSc, MD)*, එන්. බී. නෙවිල්/Mr. N. B. Nevil *(BSc, Eng M.I.E.E.E)*,වෛද්‍ය ශාන්ත හෙට්ටිආරච්චි/Dr. Shantha Hettiarachchi *(MBBS, DFM)* ● **සංස්කරණ සහාය/Editorial Assistance** මනෝරි විමලසේකර/Ms. Manouri Wimalasekara, ප්‍රභාත් චින්තක මීගොඩගේ /Mr. Prabath Chinthaka Meegodage ● **ගිණුම්කරණ සහාය/Accounts Assistance** ලක්ෂ්මී අබේගුණවර්ධන/Ms. Lakshmi Abeygoonawardana ● **සම්බන්ධීකරණ සහාය/Coordinating Assistance** චමාලි ජයසිංහ/ Miss. Chamali Jayasinghe ● **පරිගණක ලිපි සැකසුම/Type setting** නිලන්ති ප්‍රියදර්ශනී/Miss. Nilanthi Priyadarshani ● **පිට කවරය/Cover Page** විනී හෙට්ටිගොඩ/Mr. Winnie Hettigoda ● **පිටු සැලසුම්/P age Layout** තනුජ දයාල්/Mr.Thanuja Dayal ● **ප්‍රකාශනය/Published by** පර්යේෂණ හා සංවර්ධන පර්ෂදය/ Forum For Research & Development ● **ලිපිනය/Address** 762/4 බී, පන්නිපිටිය පාර, බත්තරමුල්ල/ No. 762/4 B, Pannipitiya Road, Battaramulla ● **විද්‍යුත් තැපෑල/ E-mail** gaveshanajournal@gmail.com ● **වෙබ් අඩවිය/ Web site** www.ird.lk ● **දුරකථනය/ෆැක්ස්/ Tel/ Fax** 011 2884431 ● **මුද්‍රණය/Printed by** වයි.එන්. ප්‍රින්ටර්ස් නො.135ඒ, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල. /YN Printers No.135A, Anderson Rd, Nedimala, Dehiwala.

# ඇතුළත/INSIDE

**ප්‍රතිචාර** ........ 02

**සංස්කාරක සටහන** ........ 03

புதியதோர் மாற்றம் ........ 04

Editorial ........ 05

**සංඛ්‍යා දත්ත** ........ 06

**තේමාව / Theme**

යුද්ධයෙන් පසු "යුද්ධය" ජය ගන්නේ කෙසේද ? ........ 07

දේශය නැවත ගොඩනැගීම:
විද්වත් ප්‍රජාව හමුවේ ඇති අභියෝගය ........ 08

Rebuilding the nation:
A post-conflict challenger for scientific community 08

දේශය ගොඩනැගීමට විද්‍යාත්මක ප්‍රවේශයක් ........ 10

ත්‍රස්ත තර්ජිත ගම්මානයක ජීවිතයෙන් බිඳක් ........ 12

පාසල ළමයා සඳහාය: ළමයා පාසල සඳහා නොවේ ........ 14

සමාජමය සිතීමක් උදෙසා ........ 15

ළමයින්, ළමයින් බවට ........ 16

பிள்ஊ பிள்ஊகளுக்க அக ........ 18

පශ්චාත් යුධ ශ්‍රී ලංකාවේ
ජනමාධ්‍ය භූමිකාව කෙසේ විය යුතුද? ........ 20

Health System
Reconstruction and Nation-Building ........ 23

**ජයග්‍රහණ**

ලක් දැයේ පහන් ලොව දිනූ වගයි ........ 26

**අත්වැල**

පිළිතුරු සෙවීමේ මාර්ග: පර්යේෂණ ක්‍රම ........ 27

**ජන මාධ්‍ය**

විජ්ජා සන්නිවේදනයක් නොවිය යුතු විද්‍යා සන්නිවේදනය ........ 29

**චරිත**

සමාජ පර්යේෂණ ජීවිතය කරගත් ඔහු:
මහාචාර්ය නන්දසේන රත්නපාල........ 31

**පොතක වත** ........ 32

**සත්ව ලෝකය**

වෛද්‍ය විද්‍යාලයට නොගිය සත්ව ලෝකයේ වෛද්‍යවරු...... 33

**Horizons**

Cuban science: a jewel in the Caribbean crown .... 35

**පාසල් ව්‍යාපාති**

ළමා කායික දණ්ඩනය අවශ්‍යමද? ........ 37

විද්වත් විවරණය ........ 38

මග හොඳින් පෙනේ නම් යනෙන දැනුමත් තිබේ නම් ........ 39

විද්වත් විවරණය ........ 40

# ප්‍ර ති චා ර

## ලංකාවේ විද්වත් ප්‍රජාවට දැක්මක් අවශ්‍ය කර තිබේ

පොදුවේ ගතහොත් අපේ රටේ විද්වත් ප්‍රජාව ලාංකේය බිමෙහි පය තබා නොගත් පිරිසකි. ඔවුන් තමන් වෙතින් තම උපන් බිමට සිදු කළ යුතු මෙහෙවර නිසි ලෙස ඉටු කළේ නම් අපේ රට මෙතරම් පසුගාමී තත්ත්වයක නොසිටිනු ඇති බව මගේ අදහසයි. අපේ රටේ විද්වත් ප්‍රජාව රට පිළිබඳ දැක්මකින් යුතු සහ සාමූහික අරමුණකින් යුතු පිරිසක් වී නම් නිදහසින් පසු අපේ රටේ ඉතිහාසය තුළ ප්‍රබල භූමිකාවක් නිරූපණය කරමින් අපේ රටේ දේශපාලනය කෙරෙහි තීරණාත්මක බලපෑමක් සිදුකරන්නට හැකියාව තිබිණි. එසේ වී නම් මේ රටේ දේශපාලකයින්ට අත්තනෝමතික ලෙස කටයුතු කරමින් අපේ රට බහු විධ වශයෙන් විනාශය කරා ගෙනයන්නට නොහැකි වන බව නිසැක ය. මෙබඳු පසුබිමක, විද්වතුන්ගේ කුඩා කුලකයත් ලෙස ඔබ සංවිධානය සිදු කරගෙන යන කාර්යභාරය වෙත මේ රටේ විද්වතුන් වඩ වඩාත් ගොනු කර ගැනීම සිදු කළ යුතු ය. ඒ සාමූහිකත්වය පිළිබඳ දැක්ම සම්පාදනය කිරීමට "ගවේෂණ" මැදිහත් විය යුතු ය. ■

**අනිල් ගුණසේකර**
කිරිබත්ගොඩ

## නව නිපැයුම්කරුවන්ට නොසලකන ජාතිය...

අපේ රටේ නව නිපැයුම්කරුවන්ගේ නව නිපැයුම් සමාජගත කිරීම සඳහා වගකිවයුතු අංශවලින් ලැබෙන සහයෝගය ඉතා ම අල්ප ය. රජයේ වගකිවයුතු අංශවල අකටයුතුකම් නව නිපැයුම්කරුවන්ගේ ධෛර්යය බිඳ දමන සුලු ය. දැනට වසර කිහිපයකට පෙර අපේ රටේ "නිරන්ජන් නානායක්කාර" නමැති විශිෂ්ට නව නිපැයුම්කරුවකු සිටි අතර ඔහු ජාත්‍යන්තර තරගවලින් පවා ජයග්‍රණය ලැබුවකු විය. ඔහු කළ එක් සුවිශේෂ නිර්මාණයක් වූයේ ඉවතලන පොලිතීන්වලින් පෙට්‍රල් නිපදවීමයි. නමුත් ඔහුගේ නිර්මාණකරණ හැකියාවට, වගකිවයුතු අංශවල නිසි සහාය නො ලැබිණ. අද මේ තරුණ නව නිපැයුම්කරුවා කුමක් කරන්නේ ද? ඊනියා "තරු" සංස්කෘතියක ගිලුණු අපේ රටේ ජනමාධ්‍යවලට එබඳු සැබෑ තරු සොයා යාමේ වුවමනාවක් නැති බව පැහැදිලි ය. කෙසේ වෙතත් මෙබඳු නව නිපැයුම්කරුවන් කොතෙකුත් අපේ රටේ සිටිනු බවට සැක නැත. මේ අලුත් නිපැයුම් කරන මිනිසුන් නො සලකා හැර අපට ජාතියක් ලෙස ලොව හමුවේ නැඟී සිටිය හැකි ද? ■

**කේ.එල්. දිසානායක**
කුරුණෑගල

## ගවේෂණ සිදු කරන කාර්යය කාලෝචිතයි

"ගවේෂණ" සඟරාව මගින් මෙරට සමාජයට සිදු කරන මෙහෙවර කාලෝචිත වූත් අත්‍යවශ්‍ය වූත් එකක් බව මාගේ අදහසයි. ලංකාවේ හා ලෝකයේ සිදු වන නව පර්යේෂණ පිළිබඳ ව ගවේෂණය කරමින් එම නව දැනුම "ගවේෂණ" තුළින් අප වෙත ලබාදෙන්නට කටයුතු කරන ලෙසට සංස්කාරක මඬුල්ලට යෝජනා කරන්නට කැමැත්තෙමි. ■

**සුසන්ත ප්‍රේමරත්න**
මාතර

## අ.පො.ස. (උ.පෙළ) ව්‍යාපෘති වාර්තා සහ වංචා

අ.පො.ස. (උ.පෙළ) අධ්‍යාපනය සඳහා නියමිත ව්‍යාපෘති ඉතාම වැදගත් අංගයකි. නමුත් මෙම ව්‍යාපෘති සිදු කිරීම මේ වන විට එක්තරා වංචාවක් වී ඇති බව කනගාටුවෙන් වුවත් පෙන්වා දීමට සිදුව ඇත. ව්‍යාපෘති වාර්තා මිල දී ගන්නට තිබෙන අතර ඇතැම් ශිෂ්‍ය ශිෂ්‍යාවෝ මේවා මිල දී ගෙන තමන් කළ ව්‍යාපෘතියෙහි වාර්තාව ලෙස පාසලට ඉදිරිපත් කරති. මෙම තත්වය එක් අතකින් සැබැවින් ම ව්‍යාපෘති සිදු කරන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට බලවත් අසාධාරණයකි. අනෙක් අතින්, ව්‍යාපෘතියක් කිරීම තුළින් ළමයකුට ලබාගත හැකි පුළුල් දැනුම හා අවබෝධය නො ලැබියාමකි. මේ නිසා පාසල් ව්‍යාපෘති පිළිබඳ ව වැඩි අවධානයක් යොමු කොට එහිදී සිදුවන වංචා වැළැක්වීමට කටයුතු කිරීම පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට කරන විශාල සේවයකි. ■

**සමන්මලී ජයවික්‍රම**
මීගමුව

## ව්‍යාපෘතිවල වැදගත්කම අවබෝධ කළේ "ගවේෂණ" යි

අපගේ පාසල් ව්‍යාපෘති ගැන අපේ රටේ අධ්‍යාපන ප්‍රකාශනවලින් වැඩි අවධානයක් යොමු කර නැත. එහෙත් "ගවේෂණ" සඟරාව ව්‍යාපෘති ගැන පමණක් නො ව ඉන් එහාට ද යමින් පර්යේෂකයකු වන්නේ කෙසේ ද යන්න ගැන අප දැනුවත් කිරීමට ගන්නා උත්සාහය විශිෂ්ටය. මෙම ව්‍යාපෘතියක් යනු පාසල් අධ්‍යාපන අංගයකට එහා ගිය ජීවිතයට සුවිශේෂ අත්දැකීමක් මෙන් ම අනාගත වෘත්තියකට මඟ හෙළි කරගැනීමක් ද වන බව මට අවබෝධ වුණේ "ගවේෂණ" නිසා බව නොපැකිලව සඳහන් කරමි. ■

**ඉන්දීවරී රණසිංහ**
මතුගම



**ගවේෂණ සඟරාව පිළිබඳව පාඨක ඔබේ අදහස් උදහස් යෝජනා චෝදනා මෙන් ම රටේ පර්යේෂණ ක්ෂේත්‍රය පිළිබඳව ඔබේ අදහස් ද අපට ඉතා ම වැදගත්.**

***ඒ නිසා මේ පිටුව ඔබේ එබඳු ප්‍රතිචාර සඳහා විවෘත යි.***

**සංස්කාරක**
**"ගවේෂණ"**
**පර්යේෂණ හා සංවර්ධන පර්ෂදය,**
**762/4 බී, පන්නිපිටිය පාර, බත්තරමුල්ල.**
**දුරකථනය:**
**0112884431/0115662895**

# ඊයේ, අද සහ හෙට

**"ගවේෂණ"** සඟරාවේ ඊයේ, අද සහ හෙට අපට වැදගත් වන්නේ ගවේෂණ සඟරාව 6 වන වසරට පා තබන නිසා ය. ඉතා අඩු සම්පත් ප්‍රමාණයක් සමඟ ඊයේ වූ අවශ්‍යතාවක් හොඳින් හඳුනාගෙන අප කළ මූලාරම්භය ගැන අප අද සතුටු වන්නේ, යුගයට අවැසි දෙයකට අතගසා එය අද දක්වා පවත්වාගෙන ආ නිසාම පමණක් නො වේ. "ගවේෂණ" වැනි සඟරාවක අවශ්‍යතාව තහවුරු කර, එය ගුණාත්මක සඟරාවක් බව තහවුරු කිරීමට අපට හැකි වූ නිසා ය. අදටත් වඩා හෙටට අවැසි, දේශයේ විද්‍යාව හා තාක්ෂණයේ සමාජ සංවර්ධනය උදෙසා කළ යුතු කාර්යභාරය පිළිබඳ හඬ අවදි කරන හොරණෑවක් බවට පත් කිරීමේ ඉලක්කය කරා අප ඇදෙමින් පවතින නිසා ය.

"ගවේෂණ" සඟරාවේ අපි මුල සිට ම ජාතික වශයෙන් වැදගත් තේමාවක් මූලික කොට ගෙන විද්‍යාව හා තාක්ෂණය එම තේමාව තුළ ස්ථානගත කළ යුතු ආකාරය ගැන කථා කළෙමු; ඒ සඳහා මූලික වන උපාය මාර්ගද ඉදිරිපත් කළෙමු; දැනුම ඉදිරිපත් කළෙමු.

මෙවර කලාපයෙන් අප ඉදිරිපත් කරන්නේ බෙදුම්වාදී යුද්ධයේ යුදමය පරාජය හා නැවත ජාතිය ගොඩ නැගීමේ දී විද්‍යාව, තාක්ෂණය හා නව දැනුමට උරුම වන ස්ථානය පිළිබඳ ව යි.

යුද්ධයේ දී අවසාන වශයෙන් සිදු වන්නේ ජීවිත හා දේපල විනාශයයි. අවාසනාවකට මෙම බෙදුම්වාදී යුද්ධය පරාජය කිරීමට යුද්ධයම භාවිත කළ යුතුව තිබිණි. ඒ නිසා දෙපැත්තේ ම ජීවිත හා දේපළ හානි සිදු විණි. ඒ සඳහා උසස් තාක්ෂණ හා විද්‍යාත්මක දැනුම යොදා ගැනීම නො වැළැක්විය හැකිවි ය. එහෙත් එම යුද්ධය ජයගත් පසු විද්‍යාව හා තාක්ෂණය සමස්ත ශ්‍රී ලංකාවාසී ජනතාවට, වඩා යහපත් සමාජයක් උරුම කර දීම සඳහා යොදා ගැනීමට අප අදිටන් කර ගත යුතු ය.

විද්‍යාවේ හා තාක්ෂණයේ දැවැන්ත ජයග්‍රහණ වඩා සුබවාදී හෙටක් සඳහා අප යොදා ගත යුතු ය.

මේ සඳහා අපේ අධ්‍යාපන ක්‍රමය තුළ සාධනීය ප්‍රතිසංස්කරණ ඇති විය යුතු ය. ජාතීන් අතර සාමය සමාදානය ඇති කොට විරසකභාවය තුරන් කිරීම සඳහා නූතන දැනුම් සම්භාරය යොදා ගත යුතු ය.
අවසාන වශයෙන් ලාංකේය දේශය ආසියාවේ බුද්ධි භාණ්ඩාගාරය බවට පත් කිරීමේ දැවැන්ත අභියෝගයට මුහුණ දීම සඳහා විද්‍යාව හා තාක්ෂණය යොදා ගත යුතු බව ද අවධාරණය කරමු. ■

# நேற்று, இன்று மற்றும் நாளை

**'கவேசன'** சஞ்சிகையின், நேற்று இன்று மற்றும் நாளை எமக்கு முக்கியம் வாய்ந்தது ஏனெனில் இச்சஞ்சிகை 6 வது ஆண்டிற்கு காலடியெடுத்து வைப்பதனாலாகும். மிகவும் குறைந்த வளங்களுடன் நேற்றைய தினத்தின் தேவைப்பாடொன்றை நன்கறிந்து நாம் மேற்கொண்ட ஆரம்பத்தையிட்டு நாம் இன்று மகிழ்ச்சி அடைவது, யுகத்தின் தேவைக்காக மேற்கொண்ட இந்த சஞ்சிகையை இன்றுவரை மேற்கொண்டு வந்ததால் மட்டுமல்ல; 'கவேசன' போன்ற சஞ்சிகையொன்றின் தேவையை உணர்த்தச்செய்து, அது தரமான சஞ்சிகையொன்று என்பதை எம்மால் நிச்சயப்படுத்த முடிந்ததனாலாகும். இன்றைய தினத்தை விட நாளைய தேவையானது, உலகில் விஞ்ஞானம் மற்றும் தொழில்னுட்பத்தில் சமூக அபிவிருத்திக்காக மேற்கொள்ளவேண்டிய பொறுப்பினை பற்றிக் குரலெழுப்பும் சாதனமாக்கும் இலக்கினை நோக்கி நாம் ஈர்க்கப்படுவத னாலாகும்.

'கவேசன' சஞ்சிகையின் ஆரம்பத்திலிருந்தே நாம் தேசிய முக்கியத்துவம் வாய்ந்த கருப்பொருளை அடிப்படையாகக்கொண்டு, அதில் விஞ்ஞானமும் தொழினுட்பமும் அந்த கருப்பொருளினுள் அமைய வேண்டிய விதம் பற்றியும் நாம் கதைத்தோம். அதற்காக அடிப்படை வழிமுறைகளையும் அறிவினையும் முன்வைத்தோம்.

இந்த முறை இதழில் நாம் பிரிவினைவாத யுத்தத்தின் தோல்வியும் மீண்டும் தேசத்தைக் கட்டியெழுப்பும்போது விஞ்ஞானம், தொழினுட்பம் மற்றும் நவீன அறிவிற்குக் கிடைக்கப்பெறும் இடம் பற்றியே முன்வைக்கின்றோம்.

யுத்தத்தினால் உயிர் மற்றும் உடைமை இழப்பே இறுதியில் ஏற்படுகின்றது. துரதிஷ்டவசமாக இந்தப் பிரிவினைவாத யுத்தத்தினைத் தோல்வியடையச் செய்ய யுத்தத்தையே பயன்படுத்த வேண்டியிருந்தது. அதனால் இரண்டு சாரார்க்கும் உயிர் மற்றும் உடைமை அழிவே ஏற்பட்டது. ஆகவே விஞ்ஞானம் மற்றும் தொழினுட்ப அறிவைப் பயன்படுத்துவதைத் தவிர்க்க முடியாததாக அமைந்திருந்தது. எனினும் யுத்தத்தினை வெற்றிகொண்ட பிற்பாடு விஞ்ஞானம் மற்றும் தொழினுட்பத்தினை முழு இலங்கையர்க்கும் மிகச் சிறந்த சமுதாயமொன்றைக் கட்டியெழுப்பு வதற்காகப் பயன்படுத்துவதற்கு நாம் திடசங்கற்பம் கொள்ளுதல் வேண்டும்.

விஞ்ஞானம் மற்றும் தொழினுட்பத்தின் பாரிய வெற்றியை நாளைய தினத்திற்குச் சார்பாக ஈடுபடுத்திக்கொள்ளுதல் வேண்டும்.

அதனையிட்டு எமது கல்வித் திட்டத்தில் அமைப்புசார் சீர்திருத்தங்கள் ஏற்படுத்த வேண்டியுள்ளது. இனங்களிடையே அமைதியையும் சமாதானத்தையும் ஏற்படுத்தி விரிசல்களை இல்லாதொழிக்கும் வகையில் நவீன கல்வியறிவைப் பயன்படுத்த வேண்டும்.

இறுதியாக இலங்கை நாட்டை ஆசியாவின் அறிவகமாக மாற்றியமைப்பதற்கான பாரிய சவாலை முகங்கொடுப்பதற்காக விஞ்ஞானம் மற்றும் தொழினுட்பத்தினை பயன்படுத்த வேண்டும் என்று வலியுறுத்துகின்றோம்.

# Yesterday, Today and Tomorrow

**'Gaveshana'** is stepping to its sixth year of publication. This is a very significant milestone today for us as we started 'Gaveshana' with a clear vision about a great national need yesterday utilizing scarce resources available to us at the time. We take pride in our journey as we managed to identify the need for a journal like ours and we managed to shape our journal to match the need, to publish a journal of exemplary quality.

The need for 'Gaveshana' is greater for tomorrow as the journal has an immense responsibility to aid the development of science for the betterment of society.

We at 'Gaveshana' always have selected themes that are of national importance, and we have always taken efforts to discuss these themes from a scientific point of view, giving preference to how science and development can play a role within these issues.

In our latest issue, we have considered the all important, burning issue which has been plaguing this country for three decades. We talk about the destructive war that divided this beautiful country, the inevitable military solution to the conflict and the most important of all, the rebuilding of the nation after the war.

Any war causes massive destruction and loss of valuable life and property. Unfortunately, this war in Sri Lanka had to be finished through military means. Both sides of the conflict have suffered immeasurably. The war effort required considerable forays into research and development to develop new military technology. The challenge that faces us today is how we can utilize the same intense efforts in research and development to rebuild the nation destroyed by three decades of war.

The use of research and development for the resurrection of the nation requires dedication and hard work from all those who are concerned, not only scientists and academics but even from the general public. The divisions between us has to be overcome, wounds need to be healed and we have to work as one to revamp and rebuild, to be born again as the intellectual cradle of Asia. ■

# සංඛ්‍යා දත්ත

## 360,000
ලංකාවේ වර්ෂයක් තුළ සිදුවන දරු ප්‍රසූතීන් සංඛ්‍යාව 360,000කි.

## 160,000
ලංකාවේ ජනගහණයෙන් මිලියන හතරක් වන පාසල් ළමුන්ගෙන් 160,000ක් පමණ විවිධ අක්ෂි ආබාධවලට ගොදුරු වී ඇත.

## 388,000
ලංකාවේ වයස අවුරුදු 5ට අඩු ලක්ෂ දහ අටක් වන දරුවන් අතරින් 388,000ක් ඌන පෝෂණ තත්වයෙන් පෙළෙති.

## 2.56
අමෙරිකා එක්සත් ජනපදයේ මිනිසුන් දහසකට සිටින වෛද්‍යවරුන් සංඛ්‍යාව 2.56කි.

## 5.91
කියුබාවේ මිනිසුන් දහසකට සිටින වෛද්‍යවරුන් සංඛ්‍යාව 5.91කි.

## 36,500
කියුබානු රජය විසින් ලොව නොදියුණු රටවල් අසූ එකක කියුබානු වෛද්‍යවරුන් 36,500ක් සේවයේ යොදවා තිබේ.

## 11,000
ඉන්දියාවේ වසරකට අසූ දහසක් පමණ මිනිසුන් සර්ප දෂ්ඨ කිරීම්වලට ලක් වන අතර ඉන් 11,000ක් පමණ මරණයට පත්වෙති.

## 18,000
මිනිසුන්ගේ ක්‍රියාකාරකම් හේතුවෙන් මේ වන විට අභ්‍යවකාශයේ විවිධ සුන්බුන් 18,000ක් පමණ තිබේ. අක්‍රිය වීම නිසා අයාලේ යන චන්ද්‍රිකා, අභ්‍යවකාශ ගත කරන ලද චන්ද්‍රිකාවල සුන්බුන් මේ අතර වේ.

## 293
පසුගිය වසරේදී ලෝකය පුරා මුහුදු මංකොල්ලකරුවන් විසින් කරන ලද මුහුදු මංකොල්ලයන් සංඛ්‍යාව 293කි.

## 23%
අධ්‍යාපන අමාත්‍යාංශයේ වාර්තාවන්ට අනුව මෙරට ජනගහණයේ පරිගණක සාක්ෂරතාව (2007 වසරේදී) 23%කි.



# යුද්ධයෙන් පසු 'යුද්ධය' ජය ගන්නේ කෙසේ ද?



තිස් වසරක් පුරා ලාංකේය දේශය පීඩාවට පත්කළ බෙදුම්වාදී කොටි ත්‍රස්තවාදය යුදමය වශයෙන් පරාජය කිරීමෙන් පසු අප හමුවේ නිර්මාණය වන්නේ අලුත් මොහොතක් බව පැහැදිලි ය. මෙම අලුත් මොහොත ලාංකේය දේශය, ලාංකේය ජාතිය ගොඩ නැඟීම සඳහා කළමනාකරණය කර ගැනීමේ දැවැන්ත අභියෝගය අප හමුවේ තිබේ. මෙම අභියෝගය ජය ගැනීමෙන් තොර ව, රටක් ලෙස ජාතියක් ලෙස අපට ඉදිරිගමනක් නැත. එබැවින් එම අභියෝගය ජය ගැනීම සඳහා වන ප්‍රවේශයන්, භූමිකාවන් කෙසේ සකස් විය යුතු ද යන්න විමසා බැලීම මෙවර "ගවේෂණ" තේමාව ලෙස තෝරා ගතිමු.

## තේ මා ව / THEME

# දේශය නැවත ගොඩ නැඟීම:
# විද්වත් ප්‍රජාව හමුවේ ඇති අභියෝගය



වෛද්‍ය
චෙස්මාල් සිරිවර්ධන

කලෙක ශ්‍රී ලංකාව සැලකුණේ සිංගප්පූරුවටත් වඩා ආර්ථික, සංස්කෘතික හා සමාජ වර්ධනයක් සඳහා ධාරිතාව ඇති රටක් වශයෙනි. එහෙත් අනපේක්ෂිත ලෙස ශ්‍රී ලංකාව පිරිහීමේ ඉලක්ක ළඟා කර ගෙන ඇත. මානව හා භෞතික සම්පත් සපිරුණු ශ්‍රී ලංකාවට තවමත් දකුණු ආසියාවේ ආර්ථික හා සමාජ බලවතකු වීමේ හැකියාව ඇත. බ්‍රිතාන්‍යයෙන් නිදහස ලැබූ දා සිට, රට මුහුණ දුන් දේශපාලන, සංස්කෘතික හා ආර්ථික ව්‍යසන නිසා එය සතු ධාරිතාව උපරිමයෙන් වර්ධනය කර ගැනීමට බාධා ඇති විය.

1948න් පසු ගත වූ පශ්චාත් යටත් විජිත වර්ෂ 60ක කාලය විශ්ලේෂණය කිරීමේ දී ශ්‍රී ලංකාව ජාතිකත්ව අතර නොසංහිඳියාව නමැති නොගැඹුරු ජලයේ ගමන් කර ඇති බව පැහැදිලි ය. අනෙක් පැහැදිලි කරුණ නම් අසමත් දේශපාලන නායකත්වයක් අප රටට උරුම වූ බව ය. දකුණු ශ්‍රී ලංකාව සන්නද්ධ අරගල දෙකකින් ද උතුර හා නැගෙනහිර ආයුධ සන්නද්ධ බෙදුම්වාදී යුද්ධයක් ද වශයෙන් ශ්‍රී ලංකාවේ දේශපාලනය බරපතළ අර්බුද තුනක් පසු කර ඇත්තේ ය. මෙයින් තෙවැන්න මේ වන විටත් ශ්‍රී ලංකාවට දැඩි බලපෑම් කරමින් සිටින්නේ ය. එමගින් දශක තුනක් තිස්සේ කර ඇති විනාශය අතිමහත් ය. ත්‍රස්තවාදීන් විසින් රටේ මර්මස්ථාන වෙත එල්ලකළ ප්‍රහාර නිසා ද ගැටුම් පැවති ප්‍රදේශවලින් පරිබාහිරින් සිදු වූ අනවශ්‍ය වූ ජන ඝාතන නිසා ද යුද්ධය සඳහා වූ රජයේ වැය නිසා ද රටේ සම්පත් අනවශ්‍ය ලෙස විනාශ වී ගියේය. වැදගත් කරුණ වන්නේ මෙසේ විනාශ වූ සම්පත් රටේ දියුණුවටත් සුවිශේෂී ව අධ්‍යාපනයේ හා සෞඛ්‍ය සේවාවේ දියුණුවටත් එමගින් අප සැමගේ යහපත් දිවි පැවැත්මටත් යෙදවිය හැකි වීම ය.

උතුර හා නැගෙනහිර ගැටලුව විසඳීම සඳහා වූ දෙයාකාර ප්‍රතිපත්තියක් පසුගිය දශක තුනේ දී අනුගමනය කෙරිණි. සාමකාමී සාකච්ඡා මග සහ යුද්ධමය මග වශයෙනි. මෙයින් දෙවැන්න පදනම් කර ගෙන නැගෙනහිර ලත් ජයග්‍රහණයේ පසු පියවරක් වශයෙන් ප්‍රාදේශීය දේශපාලන ප්‍රවාහය බලගැන්වී ඇති අතර ස්වකීය සංවර්ධනයේ දිශා කෙරේ යොමු වීමට ද අවකාශය ලැබී ඇත. දෙවැනි උපායමාර්ගය ට අනුව උතුරේ කෙරුණ මෙහෙයුමේ අවසන් ප්‍රතිඵලය, අප මේ වන විට ලබා ඇත.

## Dr. Chesmal Siriwardhana

Sri Lanka, once considered as a country with far more potential for economic, cultural and social growth than Singapore, has travelled on a much unexpected road to decline. A former colony of the British Empire and a country with numerous resources, human and otherwise, Sri Lanka had and still do have the ability to become a South Asian power house in economic and social growth. Since it regained independence in 1948 from the British rule, the country has seen numerous political, cultural and economical calamities that have prevented it from achieving its true potential.

If we were to take a brief historical glance back to the 60 year post colonial period, we can clearly see that the country has wallowed in shallow water of communal disharmony and failed political leadership and tried to move forward despite all these obstacles. The country faced numerous political crises including two attempts of armed Marxist revolution by the country's youth in the southern Sri Lanka and an armed struggle by Tamils in the northern and eastern parts of the country. The latter is still continuing well into the third decade and caused death and destruction in an unprecedented way. There have been many attempts to end this conflict and to bring an end to the destruction of the country to no avail. The regular bombings by rebels of valuable economic establishments, wanton killing of civilians both in the conflict zone and in other parts of the country and the huge military expenditure has all taken a heavy toll in our tiny country's resources. The important fact is that these resources would have been used to expand the economy, education and health of our people and improve the living conditions of each and every one of us. The untold suffering of many thousands of people caught in the conflict and soldiers from both sides of the war and their families cannot be explained in words.

As I mentioned above, numerous attempts have been made by the political and communal leadership during the three decades of civil war to find a solution. Some opted for a military solution and others for political solution while some others opted for both. None has taken off the ground to make any serious difference in the conflict and only succeeded in giving both parties of the conflict some short respite from fighting. Now, however, the thirty year war has come to a close, at least in conventional military terms. The rebel firepower and fighting capabilities have been crushed and their cadre strength and leadership has been eliminated while the government forces have also suffered many loses. The government in its pursuit of peace had this time opted for a military solution followed by a lasting political solution. The first part of the war in eastern province came to a successful military conclusion and the political solution has been implemented with local governments being elected and life returning to a comparable normalcy. In the second part of the war, the government forces have captured all of the areas previously held by the rebels in the Northern Province and have completed the end of conventional military operation phase. The rebels were holding thousands of civilians in a last ditch stand off to counter total defeat and all of them have been rescued. However, three decades of hate, mistrust and fear sowed deeply and rooted firmly in people from both sides of the war still exists.

The challenge for tomorrow is to get rid of the hate, mistrust and fear so that future generations can live in harmony and peace. The chance for various parties to reap fear and hate for political and other gains must simply be eradicated once and for all. That is the crucial and all encompassing challenge that exists before us today.

Despite the civil war and other numerous calamities, despite the third world economic standing, Sri Lanka has an excellent record in health and education and stand shoulder to shoulder with many nations from the developing world. Our health indicators are the best in the South Asian region without dispute. We have a better adult literacy rate than our neighbors in the region. We have almost eradicated many serious infectious diseases such as Malaria, measles and polio. Our immunization programme is one of the best in the world. The most important thing is that these indicators and programs are valid and work in both non-conflict and conflict zones similarly. When it comes to public health and other health care

එහෙත් ප්‍රධාන ගැටලුව විසඳී ඇත්තේ ද? දශක තුනක වෛරය, අවිශ්වාසය හා එකිනෙකා කෙරේ වන බිය මිනිස් හද තුළ ගැඹුරට කා වැදී ඇත්තේ ය. දෙපාර්ශ්වයේ ම හදවත්වල මේ විනිවිද ගිය තුවාලය සුවපත් කරන්නේ කෙසේ ද?

වර්තමාන අභියෝගය වනුයේ මේ තුවාලය සුවපත් කර අනාගත සමාජය වෛරයෙන්, බියෙන්, සැකෙන්, අවිශ්වාසයෙන් තොර වූ සමාජයක් බවට පත් කරන්නේ කෙසේ ද යන්න ය.

දශක තුනක යුද්ධය ද අනෙකුත් ව්‍යසන ද අතරතුර ශ්‍රී ලංකාවේ අධ්‍යාපන හා සෞඛ්‍ය දර්ශක ඉහළ මට්ටමක ඇත්තේ ය. මෙය තුන් වන ලෝකයේ දියුණු වන රටවල් සම්බන්ධයෙන් හොඳ ව්‍යවහාරයක් වන්නේ ය. සාක්ෂරතා අනුපාතය සහ මැලේරියා, සරම්ප, පෝලියෝ රෝග නිවාරණය අතින් ශ්‍රී ලංකාව ලබා ඇති ජයග්‍රහණ විශිෂ්ට ය. මේ ජයග්‍රහණ ගැටුම් පැවති හා නොපැවති ප්‍රදේශවලට පොදු ලක්ෂණයක් වීම ද විශේෂ ලක්ෂණයකි.

එහෙත් පර්යේෂණ හා සංවර්ධන දෘෂ්ටි කෝණයෙන් අප ලබා ඇති ප්‍රගතිය සතුටුදායක නො වේ. දශක තුනක යුද්ධ කාල සීමාවේ දී රජය හා ත්‍රස්තවාදීන් පිටරටින් අවිආයුධ ආනයනය කළ නමුත් ඒවා දේශීයව සංවර්ධනය කිරීම සඳහා පර්යේෂණ කර නැත. එහෙත් දෙවැනි ලෝක සංග්‍රාමයේ දී මෙවැනි පර්යේෂණ යුද්ධය කළ රටවල් අතර පැවතිණි. මේ සඳහා බලපා ඇත්තේ යුද්ධ පර්යේෂණ සඳහා අකමැත්තක් නො ව ඔවුන් සමායෝජනය සඳහා අවැසි දේශපාලන කැමැත්ත හා මග පෙන්වීම ඌන වීම ය. පශ්චාත් යුධ සමාජයේ අපට මුහුණ දීමට තිබෙන ගැටලු ද විවිධාකාර ය.

- **යුද්ධයෙන් අවතැන් වූවන් නැවත පදිංචි කිරීමේ ගැටලු**
- **ඔවුන් මුහුණ පාන දුක්ඛ දෝමනස්සයන්ට අදාළ ගැටලු**
- **ආර්ථික හා මූල්‍යමය ගැටලු**
- **යුද්ධ හමුදාව හා ත්‍රස්තවාදී පිරිස් සාමාන්‍ය සමාජයට අන්තර්ග්‍රහණය කිරීමේ ගැටලු**
- **සිංහල-දෙමළ-මුස්ලිම් ජාතිකත්ව අතර බිඳ වැටුණු විශ්වාසය ගොඩ නැගීමේ ගැටලු**
- **මේ ගැටලු විසඳීම සඳහා මැදිහත් වන විදේශ බලවේගවල සැඟවුණු අපේක්ෂා හඳුනා ගැනීමේ ගැටලු**
- **ඒ මැදිහත් වීම් දේශීය අවශ්‍යතා අනුව අනුහුරු කර ගැනීමේ ගැටලු**

2004 සුනාමි ව්‍යසන අවස්ථාවේ දී රට යථා තත්වයට ගෙන ඒමට ලැබුණු ධෛර්ය හා ක්‍රමවේදය පිළිබඳ අත්දැකීම්, මේ දුෂ්කර අවස්ථාවේ දී ද භාවිතයට ගැනීමට හැකි වේ ය යනු අපේ විශ්වාසය යි.

පර්යේෂණ හා විද්වත් ප්‍රජාවේ වගකීම වන්නේ, මෙකී ක්‍රියාදාමය පර්යේෂණාත්මක ව දියත් කිරීම සඳහා ද ක්‍රියාත්මක කිරීම සඳහා ද සමගි ව හා සක්‍රිය ව කටයුතු කිරීම යි. දේශීය හා විදේශීය උගතුන්ගේ ඥානය හා නිපුණතා ඒකරාශී කිරීමේ බලවේගයක් ද මේ සඳහා අවශ්‍ය වේ. ■

# Rebuilding the nation: A post-conflict challenge for scientific community

services, every nook and cranny in the country are treated and functions the same.

Although we experienced a thirty year civil war, very little effort has gone into research and development related to the war effort. The armed forces import most of the weapons and ammunition from other countries and the rebels smuggle them in through various smuggling rings. Both parties have invested on a minimal scale on local R & D and improved their arsenals and equipment, but we have not seen a dedicated R & D effort such as from America and European countries and not even India on war effort. The fascinating fact is that the country does not lack in brainpower necessary for such endeavors as we produce multitudes of capable and talented scientists and academics by the droves. Although brain drain is a problem faced by Sri Lanka similar to many developing nations, it is the apparent lack of political will and guidance that has not used the available resources.

As the war comes to a close, the thousands of effected populations belonging to several generations and all ethnic groups in the country are facing a myriad of problems. These include resettlement issues, bereavement related issues, war trauma, mental and other health issues, financial and economical issues and many other socio-cultural issues. The reintegration of fighting cadres from both sides to the society is another important issue. The armed forces can be utilized in various ways for the developmental process that will follow the end of conflict. The building of trust between the Sinhala, Tamil and Muslim communities affected by the war is a major concern and the utmost priority for the government as well as all other stake holders. The international community has a firm responsibility in helping the rehabilitation and rebuilding process by providing expertise and resources to the local setting. However it must be mentioned that foreign settings and ideals cannot be imported wholesale and applied locally as numerous local socio- cultural differences and nuances that exist are endemic to Sri Lanka and the northern region. Also it must be said that the helping hand should not come with pre-conditions and hidden agendas of various international forces.

The ability of Sri Lankans to bounce back unscathed from disaster was well proven in the aftermath of 2004 December Tsunami that swept the coasts of both non-conflict and conflict areas. One can hope, therefore, that after the conflict, affected people will bounce back and return to normal lifestyles in the same spirit. The deep scars which may remain will hopefully heal into obscurity with time. The only stimulant they need is relative peace and socio-economic stability that political leadership must provide.

As members of the scientific community, we must utilize our knowledge and ability to help and aid the rehabilitation, rebuilding and reintegration of all people affected by the conflict regardless of their ethnicity and religion. The scientific community should come together to pool their resources to build a sound research and development base for nation building. Expatriate and local academics, scientists, researchers and various other professionals should come forward with innovative ideas and creativity to find lasting solutions for problems faced by the whole country in the post-conflict period. They should share their knowledge in their respective fields and formulate a productive plan for the rebuilding process, putting aside petty grievances and internal squabbling. The path to a nation's prosperity lies in the intellectual contribution by its scientific community and in the post-conflict Sri Lanka, we as academics and intellectuals should play an active and leading role in getting our nation back to its feet. ■

# දේශය ගොඩනැඟීමට විද්‍යාත්මක ප්‍රවේශයක්



**විශේෂඥ වෛද්‍ය අතුල සුමතිපාල**

තිස් වසරකට ආසන්න කාලයක් පුරා මෙරට පැවති යුද්ධය, බෙදුම්වාදී ත්‍රස්තවාදය පරාජයට පත්කොට නිමා කිරීමෙන් පසු ව අපගේ රට නොඑසේ නම් ලාංකේය ජාතිය ගොඩ නැඟීමේ කාර්යය කේන්ද්‍රීය කාරණා දෙකක් යටතේ දියත් කළ යුතු වේ. පළමුවැන්න, යුද්ධයෙන් විනාශයට පත් වූ භෞතික දේවල් නැවත ගොඩ නැඟීමයි. දෙවැන්න, යුද්ධය නිසා බිඳ වැටුණු මානසිකත්වය ගොඩ නැඟීමයි.

යුද්ධයෙන් විනාශයට පත් වූ භෞතික දේ එනම් නිවාස, පොදු ගොඩනැඟිලි, මාර්ග, යටිතල පහසුකම්... ගොඩ නැඟීමේ දැවැන්ත වගකීම පැවරෙන්නේ රජයට ය. එතැනදී අපේ රටේ විද්වතුන්ට ද විශාල කාර්යය භාරයක් පැවරේ. එනම් මෙම භෞතික ගොඩ නැඟීම් මෙරටට උචිත ලෙස සැලසුම් කිරීම සහ ඒවා නිසි සැලසුමට අනුව ක්‍රියාත්මක කරවීමට වග බලා ගැනීමයි. උදාහරණයක් ලෙස, උතුර හා නැඟෙනහිර ප්‍රදේශයන්හි නගර නිර්මාණය කිරීම්වල දී එම ප්‍රදේශවලට ආවේණික උරුමය, සංස්කෘතිය රැක ගනිමින්, පරිසර හිතකාමී ලෙස නූතන තාක්ෂණයට ගැලපෙන පරිදි සැලසුම් කළ යුතු ය. මෙහිදී විශේෂයෙන් ම සාම්ප්‍රදායික සංස්කෘතියේ ජීවත්වන කොටස්වල අවශ්‍යතා පිළිබඳ ව සංවේදී විය යුතු ය. මෙබඳු කාර්යයක දී අප වෙතින් විය හැකි වරදක් නම්, අප විසින් එම ජනතාව මත යම් යම් දේ පටවනු ලැබීමයි. නමුත් ඒ වෙනුවට එම ජනතාවගේ බහුවිධ විවිධතා කෙරෙහි සැලකිලිමත් වෙමින් ඔවුන් ද එම සංවර්ධන වැඩපිළිවෙළෙහි සක්‍රීය දායකයින් බවට පත්කරගෙන එම වැඩපිළිවෙළ දියත් කරන්නේ නම්, මෙම ගොඩනැඟීම, භෞතික සහ මානසික යනුවෙන් දෙකක් බවට පත්වන්නේ නැත. එම භෞතික යටිතල පහසුකම් ගොඩ නැඟීමේ ක්‍රියාදාමය, එම ජනතාවගේ අවශ්‍යතා සමග බද්ධ කරමින්, ජාතිකත්වයන් වශයෙන් අප එකිනෙකා අතර බිඳවැටී තිබෙන විශ්වාසය ගොඩ නැඟීම සඳහා මනාව යොදාගැනීමට පිළිවන. එය අපගේ වගකීමකි. අපේ රටේ බොහෝ අවස්ථාවල සිදුවන්නේ දේශපාලනඥයින් වෙන ම සිතීමත් විද්වතුන් වෙන ම සිතීමත් පරිසරවේදීන් වෙන ම සිතීමත් ය. එසේ නැතිව මෙම විශාල චිත්‍රය දැක ඊට ප්‍රවේශ වුවහොත්, ඉහත සඳහන් කළ පරිදි එක ගලෙන් කුරුල්ලන් දෙදෙනකු දඩයම් කළ හැකි වේ.

ඊළඟට මනස ගොඩ නැඟීම ගතහොත්, අවධාරණය කළ යුතු දෙය නම්



මේ සියලු දෙනා ම මානසික රෝගීන් නොවන බවයි. ජාතිකත්ව දෙකේම මනස දුර්මුඛවීමක් ඇත. ජාතිකත්ව දෙකේම පරම්පරා තුනක් එකිනෙකා නොදැකීමේ ප්‍රශ්නයක් ද එකිනෙකා අතර අවිශ්වාසයක් ද ඇත. මෙබඳු තත්වයකට පත්ව ඇති ඔවුන්ගේ මනස ගොඩ නැඟීම සඳහා යම් යම් මැදිහත්වීම් කළ යුතු වේ. දකුණු අප්‍රිකාවේ එක් අවස්ථාවක පවත්වනු ලැබූ "ට්‍රූත් කොමිෂන්" හිදී, අර්බුදයට මුහුණ පෑ කණ්ඩායම් කැඳවා පැරණි වැරදි සහ වැරැද්ද කළේ කවුරුන් විසින් ද යනාදිය විමසන්නට පටන් ගැනිණ. මෙවැන්නක් අපේ රටට ගැලපෙන්නේ නැත. ඊට හේතුව අපේ රටේ සිංහල හා දෙමළ ජාතිකත්ව දෙක සැලකූවිට එකිනෙකාගෙන් එකිනෙකාට අඩුවැඩි වශයෙන් හිත් රිදවීම් සිදු ව ඇත. දැන් වැදගත් වන්නේ එය මුලින් කළේ කවුද, පසුව කළේ කවුද යන්න විමසමින් සිටීම නොවේ. කෙසේ හෝ එය සිදුව ඇත. ඒ පිළිබඳ ව විමසා බලන්නට ගියහොත් එහි සීමාවක්, නිමාවක් නැත. ඒ නිසා එය එසේ නොවිය යුතු ය. අතීත කාලයෙන් කතා කර අපගේ ජාතිකත්ව දෙකෙහි මනස ගොඩ නැඟීම කළ නොහැකි ය. මෙම බිඳුණු මනස නැවත ගොඩ නැඟිය හැකි වන්නේ වර්තමාන හා අනාගත කාලයෙන් විමසමින් මේ සඳහා ප්‍රවේශ වීමෙනි. එය සිදුකිරීමේදී ළමයින්ට විශේෂයෙන් මුල් තැන දිය යුතු වේ. අප බොහෝ දේ කරන්නේ අනාගත පරම්පරාව වෙනුවෙනි. සමහර විට, මෙම යුද්ධයට මැදිහත්වුණු අයගේ මනස සියයට සියයකින්ම අපට පිරිසිදු කරන්නට නොහැකි වනු ඇත. නමුත් අපේ රටේ අනාගත පරම්පරාව අනිවාර්යයෙන් ම වෛරයෙන්, ද්වේෂයෙන් තොර පරම්පරාවක් බවට පත් කළ හැකි ය. එතැනදී සුවිශේෂ කාර්ය භාරය පැවරී ඇත්තේ සිංහල භාෂාව කතා කරන ජනතාවට ය.

බෙදුම්වාදී කොටි ත්‍රස්තවාදය පරාජය කිරීම සම්බන්ධ ව අපට කිසිදු දෙගිඩියාවක් නැත. එමෙන් ම අප දකින ආකාරයට කොටි සංවිධානයේ මරාගෙන මැරෙන බෝම්බ කරුවන් පවා යම් ආකාරයකට සමාජයීය නිෂ්පාදිතයකි. එය පරාජය කළ යුත්තේ මේ කාරණය පිළිබඳ ව තේරුම් ගෙන ය. මෙහිදී මෙම මරාගෙන මැරෙන බෝම්බ කරුවන්ගේ මව්පියන්ට, තමන් හැදූ දරුවා සමාජයට විනාශයක් කරන්නට කටයුතු කළ බවට

> **දශක තුනක් තිස්සේ රටක් ලෙස දැවැන්ත ව්‍යසනයකට මුහුණ දී රට නැවත ගොඩ නැඟීමට ගන්නා ක්‍රියාදාමය දෙස අප පර්යේෂණ ඇසකින් බැලිය යුතු ය.**

විශාල වරදකාරී හැඟීමක් තිබිය හැකි ය. අප එම වරදකාරී හැඟීමෙන් එම මව්පියන් නිදහස් කළ යුතු ය. මනස ගොඩ නැඟීම සඳහා මේවා පිළිබඳ ව නිසි අවබෝධයෙන් කටයුතු කළ යුතු අතර, එම අන්‍යෝන්‍ය ඒකාබද්ධ කිරීම වචන හරඹයකට සීමා වීමට ඉඩ නොතැබිය යුතු ය.

භෞතික දේවල් ගොඩ නැඟීම, මනස ගොඩ නැඟීම ආදී සියලුම දේවල දී ජාතික අනන්‍යතාව පිළිබඳ ව අවධානයෙන් එය සිදු කළ යුතු අතර ඒ සඳහා ජාතිකමය දායකත්වයක් ලබා ගැනීම අත්‍යවශ්‍ය ය. භෞතික දේවල් ගොඩ නැඟීමේදී අදාළ තාක්ෂණ ක්‍රමවේදයන්හි අප සතු නොවන දැනුමක් විදේශයන් වෙතින් ලබාගැනීමේ වරදක් නැත. නමුත් එය මෙහෙයවීමේ සුක්කානම තිබිය යුත්තේ අප අත ය. එමෙන් ම සුනාමි ව්‍යසනය කාලයේදී රාජ්‍ය නොවන සංවිධාන "උපදේශනය" හරහා විවිධ ආකාරයෙන් මැදිහත් වී මනස් වෙනස් කිරීමට නොයෙකුත් උත්සාහයන් ගත්හ. මේ අවස්ථාවේදී ද රාජ්‍ය නොවන සංවිධාන එබඳු උත්සාහයක් ගනු ඇති අතර ඊට කෙසේවත් ඉඩ දිය යුතු නැත. ශ්‍රී ලාංකිකයින් අතර මේ සඳහා නිපුණත්වය තිබෙන අය සිටිති. එමෙන් ම විදෙස්ගත ශ්‍රී ලාංකිකයින් අතර මේ සඳහා නිපුණයෝ සිටිති. මෙම කාර්යයේ දී ඔවුන්ගේ දායකත්වය ලබා ගත යුතු ය.

දශක තුනක් තිස්සේ රටක් ලෙස දැවැන්ත ව්‍යසනයකට මුහුණ දී රට නැවත ගොඩ නැඟීමට ගන්නා ක්‍රියාදාමය දෙස අප පර්යේෂණ ඇසකින් බැලිය යුතු ය. පර්යේෂණ යනු පරීක්ෂණාගාර තුළ සිදුවන දේවල් පමණක් බවට සමාජයේ අදහසක් තිබේ. නමුත් එය මිථ්‍යාවකි. යුද්ධයෙන් පසුව මේ රට ගොඩ නැඟීමේදී මිනිසුන් කටයුතු කරන්නේ කෙසේ ද, එහිදී මිනිසුන්ගේ මනස සැකසෙන්නේ කෙසේ ද, එකිනෙකාගේ විශ්වාසය අඩුවන්නේ හෝ වැඩිවන්නේ කෙසේ ද යන කාරණා පිළිබඳ ව අපට පර්යේෂණ කළ හැකි ය. ඉන් බොහෝ කරුණු හඳුනාගත හැකි වන බව පැහැදිලි ය.

එමෙන් ම, පරාජය කරන්නට නොහැකි යැයි කියූ බෙදුම්වාදී කොටි ත්‍රස්තවාදය පරාජය කිරීම සඳහා භාවිත වූ දැනුම ද නැවත මේ රට, ජාතිය ගොඩ නැඟීමේ දී අප අත්පත් කරගන්නා දැනුම ද අප ජාත්‍යන්තරයට ගෙන යා යුතු වේ. මෙතෙක් කල් අප කළ හැම දෙයකදී ම යැපුණේ ජාත්‍යන්තර දැනුම මත ය. ලොව ප්‍රධාන පෙළේ වෛද්‍ය විද්‍යාත්මක සඟරාවන්හි පළ කෙරෙන පර්යේෂණ ලිපිවලින් 90%කට වඩා පළ කරනු ලබන්නේ ලෝක ජනගහණයෙන් 10%ක් ජීවත්වන බටහිර රටවල වෘත්තිකයින් විසිනි. දැනුම විදියට අප ඉදිරියට ගෙන එන්නේ එම දැනුම ය. මෙම තත්වය වෙනස් විය යුතු ය. මේ රට, ජාතිය ගොඩ නැඟීමට අදාළ සියලුම කාර්යයන්වල දී අප නිර්මාණය කරන නව දැනුම, ලෝකයේ ජනගහණයෙන් 90%ක් ජීවත්වන සංවර්ධනය වෙමින් පවතින රටවල් වෙත යැවීමේ පූර්ව සැලැස්මක්, සූදානමක් තිබිය යුතු ය. පශ්චාත් යුද වකවානුවේ ලාංකේය ජාතිය ගොඩ නැඟීමේ කටයුතුවල අනිවාර්ය අන්තර්ගතයක් බවට පර්යේෂණ කිරීම පත්විය යුතු ය.

අපේ රටේ ජනතාව නිතරම දෝෂාරෝපණය කරන්නේ දේශපාලනඥයන්ට ය. නමුත් වසර 25-30ක වෘත්තීය අත්දැකීම්වලින් මා වටහාගෙන ඇති දෙයක් නම් දේශපාලනඥයින් සමග වැඩ කිරීම සාපේක්ෂ ව පහසු ය. වැඩ කරන්නට අසීරු වෘත්තිකයින් සමග ය. ඒ නිසා දේශපාලනඥයින්ට දෝෂාරෝපණය කරමින් සිටීම වෙනුවට, වෘත්තිකයින් වශයෙන් අපේ දැනුම, හැකියාව ලාංකේය ජාතිය ගොඩනැඟීම සඳහා සාධනීය ලෙස දායක කළ යුතු ව ඇත. එය අපගේ යුතුකමක් මෙන් ම වගකීමක් ද වන්නේ ය. ■

# ත්‍රස්ත තර්ජිත ගම්මානයක ජීවිතයෙන් බිඳක් ...



**අරුණ වලිසුන්දර**
**පර්යේෂණ සහායක, පර්යේෂණ හා සංවර්ධන ආයතනය**

ගිඩි... ගිඩි... ගිඩි... හඬින් අහස ගිගුම් දෙන්නට පටන් ගැනිණි. "චොපර් එකක්..." අයෙක් කෑ ගසති. මෙතෙක් වේලා ගුරුතුමා උගන්වමින් සිටි පාඩමට අවධානය යොමු කර සිටි අපට, තවදුරටත් එසේ සිටිය නොහැකි විණි. පන්තියේ ළමයි එකිනෙකා දෙසත්, ගුරුතුමා දෙසත් පන්තියේ වහලය හා කොට බිත්ති අතරින් පෙනෙන අහස් ගැබ දෙසත්, වරින් වර බලති. දන් දූන් සිදු වන්නට යන දේ ඉවෙන් මෙන් දනේ. අපේ පංතිය ඇත්තේ පාසලේ ප්‍රධාන ශාලාවේ එක් කෙළවරකට වන්නට ය. අපේ පංතියට වඩා ඉහළ පන්ති කිහිපයක් ම එම ශාලාවේ පවත්වා ගෙන යනු ලබයි. අප සිටින ශාලාවට වම් පසින් පිහිටියේ පාසලේ ක්‍රීඩා පිටියයි. එය ඉතා විශාල ප්‍රදේශයක් පුරා පැතිරී පවතියි.

හෙලිකොප්ටරයේ හඬ ළඟ ළඟ ම ඇසෙන්නට පටන් ගනී. ඒ සමගම ගිලන් රියක නලා හඬ ද ඇසේ. මෙතෙක් වේලා පන්තිවල ගුරුවරුන්ට අවනත වී සිටි සිසුහු තවදුරටත් එසේ ඉන්නට බැරි තැන, ඩෙස් පුටු පෙරළා ගෙන එළියට යන්නට තැත් කරති. පිට වීමට දොරවලින් ඉඩ මදි වූ තැන සමහරු කොට බිත්ති උඩින් ද එළියට පනිති.

කරන්නට කිසිත් නොමැති ව අසරණ ව බලා සිටින්නට ප්‍රධාන ශාලාවේ සිටි ගුරුවරුන්ට ද සිදු විය. ඒ සිසුන් ව මේ අවස්ථාවේ වළකාලන්නට නොහැකි බව අත්දැකීමෙන් ම දන්නා බැවිනි.



මෙතෙක් වේලා ශබ්දය පමණක් ඇසුණු හෙලිකොප්ටරය දර්ශනය වීමට පටන් ගනී. මුළු පාසලේ ම සිටි තුන් හාරදාහක සිසු සිසුවියෝ ක්‍රීඩා පිට්ටනිය වටේටම එක් රොක් වෙති. හෙලිකොප්ටරය රවුම් දෙක තුනක් කැරකී ක්‍රීඩා පිටියට පහත් කරයි.

හෙලිකොප්ටරය බිමට බස්සනවාත් සමඟ ම ආයුධ සහිත හමුදා භටයන් කිහිප දෙනෙක් ක්‍රීඩා පිටිය වෙත දුව ගොස් එයට ආරක්ෂාව සපයති. ඒ සමඟ ම ඊයක වේගයෙන් ආ ගිලන් රිය කෙළින් ම හෙලිකොප්ටරය ළඟට ම යයි. යානයේ සිටි තුවාල කරුවන් කිහිප දෙනකු ගිලන් රථයට දමා ගෙන එය නැවත වේගයෙන් ඉගිලෙයි. ඒත් සමඟ ම හෙලිකොප්ටරය ද එහි පැමිණි භටයින් සමඟ අපගේ හිස් උඩින් පියාඹා ගොස් නොපෙනී යයි.

නගරයේ රෝහල ද ඇත්තේ පාසලට නුදුරිනි. ගිලන් රථය පාර දිගේ ගොස් රෝහලට යන අතර තුර, ඉහළ පන්තිවල සිසුන් සමහරෙක් පාසල් වත්තේ කම්බි වැට උඩින් පැන රෝහල කරා දුවති. ඔවුන් ඒ යන්නේ ගිලන් රියෙන් රෝහල වෙත රැගෙන ගිය තුවාල කරුවන් බැලීමටය. අපි ද සමහර අවස්ථාවල දී එසේ පැන ගියවුන් අතර වීමු. එසේ ගිය දිනයක, බට්ටකු පෑගීම නිසා පාදය වළලුකරින් වෙන් වී ගිය හමුදා සොල්දාදුවකුට ප්‍රතිකාර කළ අන්දම මට අදටත් මැවී පෙනෙයි.

■ ■ ■

තවත් දිනයකි. මගේ කුඩා පාපැදියේ නැගී උදෑසන පාසල කරා යමින් සිටියෙමි. "හේරත් හල්මිල්ලෑවට කොටි ගහලලු.. ගොඩක් මැරිලලු. අද ඉස්කෝලේ නිවාඩු දීලා..." පාසල වෙත ගොස් ආපසු ගෙදර යමින් සිටි සහෝදර සිසුවෙක් මා සමඟ පැවසීය.

ඒත් සමඟ ම දකින්නට ලැබුණේ පෙරහැරක් මෙන් පාසල් සිසු සිසුවියන් ආපසු ගෙදර යන සැටි ය. අහල පහළ ගම්වලට කොටි ත්‍රස්තයන් පහර දුන් දවස්වල අපට පාසලේ නිවාඩු ලැබේ.

■ ■ ■

අප පන්තියේ ළමුන් එක්කාසු වී එදිනෙදා සිදු වීම් පිළිබඳ ව පශ්චාත් කථනයක් කිරීම අපේ සාමාන්‍ය පුරුද්දයි. "පෙරේදා රෑ එකේ කණුවට කොටි ගහපු එකෙන් විසි ගණනක් මැරිලාලු. පොලීසිය

ළඟමයි ගහලා තියෙන්නේ. පොලීසියේ එක්කෙනෙක්වත් කොටි ගහපු පැත්තට ගිහිල්ලා නැහැලු. අඩුම ගානේ තුවාලකාරයන් ගේන්න ගියපු ඇම්බියුලන්ස් එකටවත් පොලිසියෙ අය යන්න දීලා නැහැලු."

"එක ම පවුලේ හත් දෙනෙක් කපලා කොටලා මරලා දාලා... ලේ විලයිලු... ලේ වේලිච්ච නිසා උදළුවලින් මිනිස්සුන් ව වෙන් කරලා තියෙන්නේ."

"කොටි වෙඩි තියපු බුලට් එකක් අපේ ගෙදර බිත්තිය හිල් කරගෙන ඇවිල්ලා කලේ වැදුණා." මේ එක් එක් අය ඉදිරිපත් කරන්නා වූ විවිධ අදහස් ය.

මේ ආකාරයට අපේ පන්තියේ සිටි මිතුරෙකු ද මිය ගිය හැටි මට මතක ය. ඔහුට අප විසින් දී තිබූ නාමය වූයේ බොක්කා ය. "බොක්කා ගෙදර ඉඳලා දුවද්දිත්තලු උන් වෙඩි තියලා තියෙන්නේ." එකෙක් පවසයි. කෙසේ නමුත් ඔහුගේ රුව මට තාම මතක ය. හිත් පිත් නැති කුරිරු ත්‍රස්තවාදය විසින් ඔහු කුඩා කල දී ම අපෙන් වෙන් කරන ලදී.

■ ■ ■

"ගෝන මැරියාවේ දී අනුරාධපුර බස් එකක් කොටි තියපු පීඩන බෝම්බයකට අහුවෙලාලු. හත් දෙනෙක් මැරිලාලු."

"වැලි ඔය කැම්ප් එකට ගහන්න කම්බි වැටවල් කපාගෙන ආපු කොටි කෙල්ලෝ තුන් දෙනෙක් ව හමුදාවෙන් අල්ලාගෙන."

"ඉරපු ලී ගේන්න කැලේට ගියපු විල්සන් මාමගේ ලොරිය ලීත් පටවලා තියෙද්දි ම පුච්චලාලු. විල්සන් මාමලා අනූනවයෙන් බේරිලා තියෙන්නේ."

අපගේ එදිනෙදා ජීවිතය ගෙවෙන්නේ මෙවැනි සිද්ධීන් සමග ය. ගමේ ගොඩේ, කඩේ පිළේ හැම තැනකම මිනිසුන් කතා කරන්නේ මෙබඳු සිදුවීම් ගැන ය. ජීවිත අරමුණු, අධ්‍යාපනය, රට, ලෝකය ගැන කල්පනා කරන්නට පසුබිමක් මෙවැනි ගම්වල නැත.

ඒත් සමග ම කොටි ප්‍රශ්නය සම්බන්ධයෙන් විවිධ අකරතැබ්බවලට මුහුණ දුන් අවස්ථා ද ඇත.

භූමිදානය සඳහා මෘත දේහය කනත්තට රැගෙන යාමට පෙර කැලෑ වැවී ගොස් ඇති පාරවල් දෙපස කපා ශුද්ධ පවිත්‍ර කිරීම සාමාන්‍ය සිරිතයි.

එක් අවස්ථාවකදී කුඩා ළමයෙක් ඒ බව මළ ගෙදරට දන්වන්නට පාපැදියෙන් විත් "ළඟ ම කපාගෙන එනවා" යැයි පවසා නැවත පියාඹා යයි. එය ඇසූ අය සිතන්නේ කොටි ගමට පැන මිනිස්සු කපන බවයි. එවිට මුළු මළ ගෙදර ම සිටි අය හිස් ලූ ලූ අත දිව යති.අවසානයේ දී මළ ගෙදර ඉතිරිව ඇත්තේ මිනිය පමණකි. නැවත කාරණය අවබෝධ වූ පසුව "කපාගෙන එනවා" කිව්වේ "පාර බව" ඔවුහු දැන ගනිති.

■ ■ ■

අහල පහළ ගම්වලට කොටි පහරදෙන විට, ඒ මිනිසුන් අපේ නිවසට ඒම සාමාන්‍ය පුරුද්දයි. ඒ, අපේ නිවස එම ප්‍රදේශයේ මධ්‍යයට වන්නට පිහිටා තිබීමත් අපේ නිවස අසල හමුදා කඳවුරක් පිහිටා තිබීමත් නිසා ය. එවැනි සිද්ධි වන දිනවල ට්‍රැක්ටර් 10-15කින් පිරිස අපේ නිවසට සාමාන්‍යයෙන් පැමිණෙති.

කුරිරු ත්‍රස්තවාදයේ ශාපයෙන් මෙසේ මිය යන්නේ ගම් වැසියන් පමණක් නො වේ. හමුදා සෙබළුන් ගැන ද අපට නිතර අසන්නටත්, දකින්නටත් ලැබේ. අතීතයේ දවසක දී රෝහලේ මෘත ශරීරාගාරයට ගෙනවිත් තිබූ හමුදා සෙබළුන්ගේ මළ සිරුරු දෙකක් බලන්නට මගේ මවත් සමග ගිය ගමන අදට ද මතක ය. එහි විශේෂත්වය වූයේ එක් සෙබළකුගේ හිස කොටින් විසින් කපාගෙන ගොස් තිබීමයි. හිස නැති රුධිර නහර එල්ලී තිබූ ලේවලින් නැහැවී තිබූ හමුදා ඇඳුම් ද සහිත සිරුර ගැන සිහි වන විට මට අදට ද විශාල අමුත්තක් දැනේ.

> **මේ පුංචි රටේ බහුතර සිංහලයන් වන අප එකතු වී අපේ සහෝදර දෙමළ වැසියන්ට උදව් උපකාර කළ යුතු ව ඇත. එවිට ත්‍රස්තවාදීන් විසින් සිංහල ජාතිය කෙරෙහි පෙන්වන්නට උත්සාහ කළ වැරදි සහගත චිත්‍රය මායාවක් වනු ඇත.**

■ ■ ■

මේ, පදවිය ජනපදයේ ත්‍රස්ත තර්ජිත ගම්මාන අසල ගම්වල සිටි මගේ කුඩා කල සත්‍ය අත්දැකීම් ය. මේවා මීට වසර 10කට පමණ පෙර සිදු වූ සත්‍ය සිදුවීම් ය. ඒ කාලයේ දී මේවා ගැන අපට බරපතළකමක් නොදැනුනේ කුඩා සන්ධියේ සිටි බැවිනි.

ත්‍රස්ත තර්ජිත ගම්මාන අසල ගම්මානවල අප සැමට ම මෙවැනි අත්දැකීම් ඕනෑ තරම් ඇත. නමුත් යුද්ධයේ සෘජු බලපෑම්වලට ලක් වූවන්ට, අත්විඳින්නට සිදු වූ සිදු වීම් අති බිහිසුණු විය හැකි ය.

ජාති, ආගම්, කුල භේද නොමැති ව උතුර හා නැගෙනහිර වැසියන් බොහොමයකට මෙවැනි අත්දැකීම්වලට මුහුණ දීමට සිදු වන්නට ඇත. නමුත් අද වන විට මේ ප්‍රදේශ ත්‍රස්ත තර්ජන නැති ප්‍රදේශ බවට පත්ව ඇත. මේ වෙනුවෙන් අප රට වෙනුවෙන් කැප වූ හමුදාවට මෙන් ම ඔවුන් ව මෙහෙයවූවන්ට ද ගෞරව කළ යුතු ය.

කෙසේ නමුත් මෙතැනින් ඔබ්බට ජාති භේදයෙන් තොරව මුළු මහත් සමාජයට ම කළ යුතු, කළ හැකි දේවල් බොහොමයක් පවතින බව මගේ හැඟීමයි. විශේෂයෙන් යුද්ධයෙන් පීඩිත ජනයාගේ මනස වහා සුවපත් කළ යුතු ව ඇත. ඒ වෙනුවෙන් රටේ විද්වත් ප්‍රජාවට විශාල කාර්යභාරයක් ඇත.

මේ පුංචි රටේ බහුතර සිංහලයන් වන අප එකතු වී අපේ සහෝදර දෙමළ වැසියන්ට උදව් උපකාර කළ යුතු ව ඇත. එවිට කොටි ත්‍රස්තවාදීන් විසින් සිංහල ජාතිය ගැන පෙන්වන්නට උත්සාහ කළ වැරදි සහගත චිත්‍රය මායාවක් වනු ඇත. ■

# පාසල, ළමයා සඳහා ය; ළමයා, පාසල සඳහා නො වේ





**ආචාර්ය**
**ගොඩ්වින් කොඩිතුවක්කු**
අධ්‍යක්ෂ, පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකා පාසල් ක්‍රමයේ සාධනීය විශේෂතා නම්,

- **නිදහස් අධ්‍යාපනය ලබා දීම.**
- **පොදු විෂයමාලාවක් නොමිලේ ක්‍රියාත්මක කිරීම.**
- **රට පුරා පාසල් 9765ක් විසිරී පිහිටීම නිසා, ගම්දනව් කරා ද ඉගෙනුම් පහසුකම් පැතිරී පැවතීම.**
- **ස්වභාෂාවෙන් ඉගෙනුමට අවකාශ තිබීම.**
- **ගුරු සම්පතෙහි ප්‍රබල බව.**
- **සමාජ, දේශපාලනික, සංස්කෘතික භේද නොතකා ළමයාට සේවය කරන සම්ප්‍රදායක් පාසලේ තිබීම.**
- **පාසලින් ලබන නිපුණතා පදනම, අන්තර්ජාතික තලයේ භූමිකා ඉටු කිරීමට පවා අවශ්‍ය ශක්තිය ලබා දීමයි.**

මේ සාධනීය ලක්ෂණ අතරතුර තවදුරටත් සංවර්ධනය කර ගත යුතු, නැත හොත් දැඩි අවධානය යොමු කර ප්‍රතිපත්තිමය විසඳුම් හඳුනා ගත යුතු විවාදාපන්න ගැටලු ද පවතී.

- ගුරුවරයා පන්ති කාමරයේ ඉටු කරන භූමිකාවේ ගැඹුර හා නවතාව ප්‍රචාරණය කිරීම සඳහා උචිත යාන්ත්‍රණයක් නැති නිසා, "හුදෙකලා ගුරු භූමිකාවක" සැඟවුණු "නිසල දැනුමේ" ඵල ප්‍රයෝජන රටේ අධ්‍යාපන සංවර්ධනයට භාවිත නො වීම.

- පාසල සහ එහි භූමිකාව පිළිබඳ ව විද්‍යාත්මක දැනුම් පදනමේ ඌනතාව නිසා "හොඳ පාසල" යනු කුමනාකාරයේ පාසලක් ද? ළමයාට පාසලින් ලැබිය යුත්තේ කුමක් ද? යන්න ගැන මිථ්‍යා මත, අධ්‍යාපන ධූරාවලියේ විවිධ තල අතර ද ඒ ඒ තලවල සේවය කරන්නන් අතර ද පැවතීම; මවුපියන් මේ නිසා නගරයේ "ජනප්‍රිය" පාසල් කරා ආකර්ෂණය වූ අධ්‍යාපන ජාලයක් හා ප්‍රතිපත්ති ජාලයක් පැවතීම.

- පාසලක කළමනාකරණයට දැඩි ව බලපාන "විදුහල්පති, ගුරු උපදේශක හා අධ්‍යාපන නිලධාරී" පත්කිරීම්, දේශපාලන පත් වීම් බවට පරිවර්තනය වී තිබීම නිසා ද මේ පත් කිරීම්වලට අදාළ නීති රීති අවුල් සහගත වී ඇති නිසා ද පාසලේ අව්‍යාජ ක්‍රියාකාරිත්වයට හානි වී තිබීම.

- පාසල හා ඊට අදාළ තීරණ, ළමයා මුල් කර ගෙන ගත යුතු වුවත්, ළමයාට වඩා වෙනත් නිර්ණායක පදනම් කර ගෙන තීරණ ගන්නා ප්‍රවණතාවක් පැවතීම. උදාහරණයක් වශයෙන්, පළමු වන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීමේ ප්‍රතිපත්ති සැලකිය හැකි ය.

මේ කරුණු වලට අමතර ව පාසලේ භූමිකාව අභියෝගයට බඳුන් කරන සුවිශේෂී සංසිද්ධියන් වන්නේ උතුරු පළාතේ, මෙතෙක් ත්‍රස්තවාදී ග්‍රහණයෙහි සිටි පාසල් දරුවන්ගේ ප්‍රශ්නය යි. විවිධ පැති ඔස්සේ මේ ප්‍රශ්නය සලකා බලමු. මේ දරුවන් ස්වකීය ජීවිත කාලයේ දී ම පංචේන්ද්‍රියන්ගෙන් ලැබුවේ ශ්‍රී ලංකාවේ පොදු මතය නො වේ. ඔවුහු පොදු විෂයමාලාව අනුගමනය කරන්නට ඇත. ඒ අතර ම ඔවුන් ලබන ලද "අවිධිමත් උගෙනුමෙහි" පෞද්ගලික හා සමාජ බලපෑම කෙබඳු ද? ඒ අනුව ලත් පූර්ව විනිශ්චයේ prejudging රටා කෙබඳු ද? මේ "අවිධිමත් උගෙනුම" පදනම් කර ගෙන, අලුතින් ජීවිතය අරඹන්නට පටන් ගෙන තිබෙන ශ්‍රී ලංකා රජයේ රිද්මය ඔවුන් දකිනු ඇත්තේ කෙසේ ද?

**සිද්ධිය-1**

*ගැටුම් පවත්නා ප්‍රදේශයේ දී වෙඩි ප්‍රහාරයකට ලක් ව තුවාල වූ වයස අවුරුදු 11ක දෙමළ ගැහැනු ළමයෙක් රෝහලකට ඇතුළත් කරනු ලැබුවාය. මේ ගැහැනු ළමයා ළමා සොල්දාදුවරියක ලෙස සේවය කළ බවට ලකුණු කායික ලක්ෂණවල වේ. රෝහලට ඇතුළු වන තැන සිටි පොලිස් නිලධාරියකු දුටු මේ ළමයා තිගැස්සිණි. ඇය පොලිස් නිලධාරීන් ගැන සිතන්නේ මොනවා ද? ඒ සඳහා බලපෑ හේතු මොනවාද? සිතිවිල්ල ශුභදායී බවට පත් කරන්නේ කෙසේ ද?*

- මේ දරුවෝ දැනට අනාථ කඳවුරුවල සිටිති. ඔවුහු "යුද්ධය" අත්දුටු අය වෙති. ඒ හා සබැඳි කම්පනය සහිත වූවෝ වෙති. පාසලේ ගුරු-විදුහල්පති භූමිකාව මේ කම්පනය, සඳහා ආමන්ත්‍රණය කළ යුත්තේ කෙසේ ද? ඒ සඳහා ගුරුවරුන් හා විදුහල්පතිවරුන් ස්වකීය භූමිකා වෙනස් කර ගත යුත්තේ කෙසේද? ඒ සඳහා වූ ක්‍රමවේද මොනවා විය යුතු ද?

- අපට හුරු පුරුදු සාමකාමී පාසලක්, මේ අයට නැත. ඔවුන් සඳහා පන්ති පැවැත්විය යුත්තේ කොතැන ද? කෙසේ ද? පාසලේ පන්තියේ ආකෘතිය කුමක් විය යුතුද?

**සිද්ධිය-2**

*ඉන්දියාවේ බිහාර් ප්‍රාන්තයේ ගැටලුවක් ව පැවතියේ පාසල් යා යුතු වයසේ ළමයින්, ගවයින් බලා ගැනීමට හා උන්ට තණකොළ කැපීමට ගෙදර නැවතීමයි. මීට විසඳුමක් සෙවූ බිහාර් රජය, චර්වාහ (ගොපලු දරු) පාසල ඇති කළේ ය. පාසල් බිමේ කුඹුරක් ද තණකොළ බිම් ද සකස් කළේ ය. ඒ අතර ම වැඩිහිටියන් සඳහා විවිධ වෘත්තීය පාඨමාලා ද ඇරඹී ය. මේ නව පාසලට එන ළමයාට තම නිවසේ ගවයා ද පාසලට රැගෙන ඒමට අවසර දෙන ලදී. ළමයි උගනින අතර ගවයා පාසල් වත්තේ තණකොළ බුදින්නේ ය. පාසල් කාල සටහනේ කාලයක්, ගවයින්ට සවස කෑමට අවශ්‍ය තණකොළ කැපීමට ද වෙන් විය. පාසල ඇරුණු පසු දරුවෝ පාසලේ උගත් දැනුම සමඟ, ගවයා ද, ඌට අවශ්‍ය තණකොළ ද මිටියක් සේ ගෙන ගෙදර යති. ළමයින් පාසල් නොඑවීමේ ගැටලුවට, පවතින සමාජ අවශ්‍යතා ඉටු කරමින් බිහාර් රජය විසඳුම් ලබා දුන්නේ එලෙසය.*

යුද්ධයෙන් අනාථ ව කඳවුරුවල සිටින දරුවන්ට ඉගැන්වීම සඳහා වූ මධ්‍යස්ථානවල ද ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාකාරකම් සංවිධානය විය යුත්තේ දරුවාට මෙන් ම වැඩිහිටියාට ද සහභාගි විය හැකි පරිදි ය. මෙහි දී පොදු විෂයමාලාව, යාන්ත්‍රික ව ක්‍රියාත්මක කරනු වෙනුවට එය ක්‍රියාත්මක කිරීමේ නවීකරණ සොයා බැලීමට-අත්හදා බැලීමට සිදු වේ. මේ කාර්යය, අපේ රටේ දක්ෂ නිර්මාණශීලී ගුරුවරුන්ටත් විදුහල්පතිවරුන්ටත් සාර්ථක ව කළ හැකි වනු ඇත. එමගින් ලබන අත්දැකීම් ප්‍රචලිත කිරීමටත්, එකී නව ව්‍යවහාර උත්පාදනය කරන ගුරුවරුන් හා විදුහල්පතිවරුන් සම්මානයට පාත්‍ර කිරීමටත්, පාසල් ක්‍රමය පිළිබඳ නව ප්‍රතිවේද මේ ව්‍යායාමයෙන් ඉස්මතු කර ගැනීමටත්, ගුරුවරයාගේ හා විදුහල්පතිවරයාගේ භූමිකාවේ විවිධ පැති අනාවරණය කර ගැනීමටත් අවශ්‍ය යාන්ත්‍රණය සැකසීම අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදකවරුන්ගේ යුතුකම හා වගකීම වන්නේ ය. ■

# සමාජමය සිතීමක් උදෙසා



**මල්කාන්ති ගමගේ**

ත්‍රස්තවාදී පදනමකින් ගොඩ නැගුණු අර්බුදකාරී දේශපාලන ක්‍රියාවලියක අවසන් ප්‍රතිඵලය වූයේ, බිහිසුණු යුධ ක්‍රියාවලියකට රට අවතීර්ණ වීම ය. යුද්ධය රටට අහිමි කළ විශාලම සම්පත වූයේ "ජීවිතයයි". ශ්‍රී ලංකාවට තමන්ගේ ම දරුවන් අහිමි කළ යුද්ධය, දැවැන්ත දේපළ විනාශයකට ද මග හෙළි කළා ය. තමන් උපන් භූමිය තුළ ම සරණාගතයන් කරනු ලැබූ යුද්ධයකට ගොදුරු වූ අතිවිශාල සිවිල් ජනකායක් සරණාගත කඳවුරු තුළ සිටිති. අංග විකලභාවයට පත් අත්පා අහිමි වූ ජන සංඛ්‍යාව අතිවිශාල ය. වැන්දඹු බවට පත් වූ ගැහැනුන්, ජීවනෝපාය බිඳ වැටුණු මිනිසුන්, අධ්‍යාපනය අහිමි වූ දරුවන්, පිළිසරණක් නැති වැඩිහිටියන්, අතවරයට පත් වූ ගැහැනුන් මේ බිහිසුණු යුද්ධයේ අනිවාර්ය ප්‍රතිඵල ය. මේ සියල්ලන්ටත් වඩා බරපතළ වන්නේ යුද්ධය නිසා ගිලන් බවට පත් "සමාජ මනස" යළි සුවපත් කළ හැක්කේ කෙසේ ද යන කාරණයයි. ශ්‍රී ලංකාව රටක් ලෙස මේ තත්වය බැරෑරුම් ලෙස තේරුම් ගෙන ඇති ද යන්න සැක සහිත ය.

මනසින් ගිලන් වූ සමාජයක්, කායික ව නිරෝගී සමාජයක් වන්නේ නැත. යුද්ධය කරණ කොට ගෙන ඇති වූ බිය, සාංකාව, ඉච්ඡාභංගත්වය හා විශේෂයෙන් ළමා මනස තුළ ඇති කරන විපර්යාසය, අනාගත සමාජයට ද ඇදී යන අනිටු ඵල විපාක බිහි කරනු ඇත. සිය මුළු ජීවිත කාලය පුරා ම යුද්ධය පමණක් දැක ඇති දරුවන් විශාල පිරිසක් උතුර, නැගෙනහිර පළාත්වල ජීවත් වෙති. ඔවුහු මේ රටේ අනාගත පුරවැසියෝ වෙති. එසේ වූ කල බිහි වන අනාගතය කෙබඳු වනු ඇත්ද?

ළමා සොල්දාදුවන් ලෙස යුද වැදුණු දරුවන්ට නවීන ගිනි අවි පරිහරණයේ මනා පුහුණුවක් ලබා දී ඇති කල, ඔවුන් යුද්ධයක් නැති සමාජ වටපිටාවක් තුළ කෙසේ තම අනාගතය හසුරුවනු ඇති දැයි අප ගැඹුරින් සිතා බැලිය යුතු ව ඇත. සරණාගත කඳවුරක ජීවත් වීමේ අමිහිරි අත්දැකීමෙන් පීඩා විඳින මිනිස්සු, කයින් සහ මනසින් රෝගී ව, අනුන්ගෙන් ලැබෙන සලාකයට දෑස් දල්වා ගෙන, අභිමානවත් ජීවිතයක් පිළිබඳ බලාපොරොත්තු අතැර දමා නිරා දුක් විඳිති. ඔවුන් යළි සමාජගත කිරීමේ ක්‍රියාවලියකට නම් සමාජය තවමත් සූදානම් වන බවක් නො පෙනේ. වසර ගණනාවකට පෙර සුනාමිය නිසා අවතැන් වූ ජනතාවගෙන් විශාල පිරිසක් තවමත් කඳවුරුවල දිවි ගෙවන බව නොරහසකි.

එසේ වූ යුද සරණාගතයන් ගේ ඉරණම කෙබඳු විය හැකි ද? සියල්ල දේශපාලන අධිකාරයට භාර දී ජන සමාජයට අත පය හකුලා ගත නො හැකි ය. ජීවිතය ප්‍රතිනිර්මාණය කිරීමේ ක්‍රියාවලියේ දී මැදිහත්කරුවකු වන්නට සමාජයක් ලෙස අප සිතා බැලිය යුතුය.

දරුවන් සහ සැමියන් අහිමි ව, අනාථ ව ගිය ගැහැනුන්ගේ ඛේදවාචකය ඉතා බරපතළ ගැටලුවකි. ලාංකේය ජීවන රටාව අනුව ගැහැනිය බොහෝ විට යැපෙන්නේ සැමියා ගෙන් හෝ දරුවන් ගෙනි. ඔවුන් අහිමි ව ගිය කල ඇයට කාගේ රැකවරණය ද? සැනසිලිදායක ජීවිතයක් කෙසේ වෙතත් ඇයට ලිංගික අතවරයනට ලක් නො වී ජීවත් වන්නටවත් වරම් ලැබෙන්නේ නම් එය ම භාග්‍යයකි. ගැහැනිය සමාජය පෝෂණය කරන තැනැත්තියයි. ඇය සමාජය රැක බලා ගන්නී ය. එහෙත් අද ඇය සරණාගත කඳවුරක් තුළ හිස් බැල්මෙන් බලා සිටින අයුරු අපි නිරන්තරයෙන් දකිමු. ඇය ඇයගේ භූමිකාව වෙත නිසි ගෞරවයෙන් යුතු ව යළි පිටත් කොට හැරිය යුතු නො වේ ද? අප ඒ ගැන අවශ්‍ය තරම් සිතා ඇත්ද?

ජීවනෝපාය අහිමි ව ගිය මිනිසුන් පිළිබඳ ගැටලුව ද බරපතළ එකකි. උතුර හා නැගෙනහිර පළාත්වල ධීවර හා කෘෂිකාර්මික වෘත්තීන්හි නියැළුණු මිනිසුන් අද කුලී වැඩ කරන්නන් ගේ තත්ත්වයට පත් ව ඇත. සමාජය සංවර්ධනය වෙනවා නම් මිනිසුන්ගේ ජීවන තත්ත්වය ඉහළට මිස පහළට යා යුතු නැත. අප කවර හෝ හේතුවක් මත කිසියම් ජන කණ්ඩායමකගේ ජීවන වෘත්තියට තහංචි පනවන්නේ නම්, ඒ වෙනුවට ඔවුන් උදෙසා විකල්පයක් සම්පාදනය කළ යුතු ය. එසේ නොවුන කල එතැන ඇති වන්නේ බරපතළ සමාජ අර්බුදයකි. එවිට සමාජ සමතුලනය බිඳී යයි. එසේ වූ කල ඒවා දිගුකාලීන සමාජ ඛේදවාචක නිර්මාණය කරයි.

යුද්ධයක අවසානයක් අපේක්ෂා කරන සමාජයක්, එකී යුද්ධය අවසන ගොඩ නගන සමාජය ගැන බරපතළ ලෙස කල්පනා කළ යුතු ය. එසේ නොවුණු විට නැවතත් අප ඇදී යන්නේ යුද්ධයකට විය හැකි ය. පශ්චාත් යුධ සමාජයක්, අපට අප ගැන නැවත සිතා බැලීමකට අවස්ථාව සලසයි. අතීතයේ අප කළ වැරදි නිවැරදි කර ගනු වස් එය ඉතා අගනා අවස්ථාවකි. ජීවිතය අලුතින් නිර්මාණය කළ යුතු ව ඇත. නිෂේධනීය ලක්ෂණ හලා සාධනීය ලක්ෂණ රකිමින් හා පෝෂණය කරමින් අප පෙර පැවති ජීවිතය සමතික්‍රමණය කළ යුතු ය. ■

# ළමුණු, ළමයින් බවට ...





ප්‍රභාත් චින්තක
මීගොඩගේ

දශක තුනක් තිස්සේ ලාංකේය සමාජය බහුවිධ වශයෙන් පෙළා ලූ බිහිසුණු සිවිල් යුද්ධයේ අවසාන නිමේෂයන් මේ වන විට වේගයෙන් ගත වෙමින් තිබේ. යුද්ධය නිමා වුවද දශක තුනක් පුරා යුද්ධය විසින් ලාංකේය සමාජ මනසෙහි ඇතිකරනු ලැබූ තුවාල සුලු පටු නො වන අතර කායික තුවාල මෙන් පහසුවෙන් හා ඉක්මණින් සුවපත් කළ හැකිද නො වේ. පශ්චාත් යුධ සමාජය, තුවාල වූ මේ සමාජ මනස පිළිබඳව පුළුල්ව හා ගැඹුරින් විශ්ලේෂණය කරමින් ඒවා යළි කිසි දා මතු නොවන සේ සුවපත් කර දමන්නට අවස්ථාව උදා කරයි. මෙහිදී යුද්ධයෙන් පීඩාවට පත් සමස්තය ගැන අපගේ අවධානය යොමුකරන අතරේ ම අපගේ අවධානය අවශ්‍යයෙන්ම යොමුකළ යුතු සුවිශේෂ සමාජ කොට්ඨාසයක් මේ සමස්තය තුළ වෙසෙති. ඔවුන් වූ කලී අන් කිසිවකු නොව, ළමයින් ය.

"හොඳම දේ ළමයින්ට" "ළමයා ළමයෙකු මිස ප්‍රමාණයෙන් කුඩා වැඩිහිටියකු නොවේ" ආදී වශයෙන් වන ළමයින් පිළිබඳව පට්ටා ගසන උදාන වාක්‍ය කොතෙකුත් සමාජයෙහි පවතී. නමුත් යථාර්ථය නම්, භාවිතයේ දී මේ උදාන වාක්‍ය කිසිවක් මායිම් නොකොට ප්‍රමුඛත්වයට පත් කර ගන්නා වැඩිහිටි අභිලාෂයන් මගින් ළමයින්ගේ හැඟීම්, අභිලාෂයන් වැසී, මැකී යන බව ය. අප විශ්වාස කරන ආකාරයට ළමයි අඩුවෙන් නො සිතති. නමුත් ඔවුහු වෙනස්ව සිතති. එහෙත් ඔවුනගේ ඒ වෙනස් සිතිවිලි ඔවුනට වචනයෙන් පැවසිය හැකි නො වේ. දවැන්ත සමාජ ව්‍යසනයකින් පීඩාවට පත් සමස්තය වෙත අවධානය යොමු කරන අතරේ ඒ සමස්තය තුළ වන ළමයින් වෙත ප්‍රවේශ වීමේ දී එකී "වෙනස" පිළිබඳ අවබෝධය ඉතා වැදගත් වේ. වෙනත් ලෙසකින් කියන්නේ නම්, ඒ ප්‍රවේශයේ පදනම විය යුත්තේ ඒ "වෙනස්" භාවයයි.

කවර සංස්කෘතික විපර්යාස හමුවේ වුවත්, කවර සමාජ ව්‍යසන හමුවේ වුවත් අපේ ලාංකේය මිනිස් හදවත් තුළින් ඇත්ව නොගිය මහගු ගුණාංගයක් වන්නේ විපතට පත් අනෙකාට ආධාර උපකාර කිරීමයි. තම ජාතිකත්වය මත පදනම් වූ කොටි සංවිධානය විසින්ම උතුරේ දෙමළ ජනතාව විනාශය වෙත ඇද දමනු ලබමින් තිබිය දී, ඒ විපතට පත් සහෝදර දෙමළ ජනතාව වෙත ද්‍රව්‍යමය ආධාර ලබා දෙන්නට දකුණේ සිංහල ජනතාව පෙළ ගැසීම තුළ ඇත්තේ ඒ උදාරතර ගුණාංගය මිස අන් යමක් නො වේ. එහෙත් කිසියම් කනගාටුවක් උපදවන කාරණය නම් මෙලෙස ආධාර උපකාර කිරීමේ දී, ඒ විපතට පත් ජනතාව අතර සිටින ළමයින්ගේ වෙනස් අවශ්‍යතා පිළිබඳ ව සිතන්නට අමතක වීමයි.

මෙබඳු ම තත්වයක් සුනාමි ව්‍යසනයෙන් පසු අවස්ථාවේ අපේ සමාජයේ දක්නට ලැබුණි. එනම් බොහොමයක් ආධාර උපකාර වැඩිහිටි අවශ්‍යතා වෙත යොමු වූ ඒවා වීමයි. මෙම තත්වය තුළ ළමයින් තනිවීම, ළමයින් අමතක වී යාම හඳුනාගත් පර්යේෂණ හා සංවර්ධන ආයතනය මනෝවිද්‍යානුකූලව ළමයින් උදෙසා සරල, එහෙත් ප්‍රබල මැදිහත් වීමක් කිරීමට පියවර ගත්තේ ය. ඒ අනුව, සුනාමියෙන් විපතට පත් ව කඳවුරුවල සිටි ළමයින් වෙත පොත පත, පැන්සල් පෑන්, පාට කූරු, ක්‍රීඩා උපකරණ ලබාදීමට කටයුතු කෙරිණි. සුනාමි ව්‍යසනය තුළ තමන්ට දැනුණු හැඟීම් තමන්ට වුවමනා ලෙස වාචිකව පැවසීමට නොහැකි තත්වයක සිටි ළමයින්ට ඒ හැඟීම් සිතුවම් කිරීමට අවැසි ද්‍රව්‍ය එලෙස සපයා දෙනු ලැබිණ. එමෙන්ම ක්‍රීඩා උපකරණ ලබා දීමෙන් ළමයින්ගේ විචිත්‍ර ලොවට නැවත යාමට ඔවුන්ට අවස්ථාව ලබා දෙනු ලැබිණි. "උපදේශනය" කෝකටත් තෛලය ලෙස යොදාගැනීම වෙනුවට, මනෝවිද්‍යාත්මක පදනමක සිට සිදුකළ ඒ අත්හදාබැලීමෙහි ප්‍රතිඵල ආශ්චර්යවත් විය.

*"වැඩිහිටියන් වගේම අහිමිවීම ළමයින්ට ඉතා තදින් දැනෙනවා. නමුත් ළමයි දුක ප්‍රකාශ කරන්නේ වැඩිහිටියන් වගේ විලාප තියලා නෙවේ. ඔවුන් හුදෙකලාව තුෂ්ණිම්භූතව බලා හිඳීවි. අනෙක් අය හා කථා නොකරාවි. ජීවත් වෙලා වැඩක් නැහැ කියලා සිතාවි. කැම*

නොකා ඉඳීවි. සමහර විට කෝපයෙන් හැසිරේවි. නමුත් මේ කිසිදෙයක් මානසික රෝගී තත්වයක් නෙවෙයි. මේ විදිහට හැසිරෙන ළමයි වුනත් සෙල්ලම් බඩු දැක්කාම පොර කකා එනවා ඒවා ගන්න. මේ තත්වය අපි සුනාමි ඛේදවාචකයේ දී දුටුවා. ඒ ළමයින්ට ලියන්න අඳින්න උපකරණ ලබා දුන් අවස්ථාවේ ඔවුන් ඔවුන්ගේ හිත් වල තිබෙන දේවල් ලියන්න, අඳින්න පටන්ගත්තා. ඔවුන් අතට



සුනාමි ව්‍යසනයට මුහුණ දුන් ලංකාවේ ළමයකු ඇඳි සිතුවමක්.

සෙල්ලම් බඩු පත්කිරීම තුළින් අපට පුළුවන් වුණා නැවතත් එම ළමයින් විචිත්‍රවත් ලෝකයකට කැඳවාගෙන යන්න. අපි මේ ක්‍රමවේදය කැබිතිගොල්ලෑවේ දී සිදුවූ බස් බෝම්බ ප්‍රහාරයේ දී සහ පසුගිය වසරේදී චීනයේ භූචලනය ඇතිවූ අවස්ථාවේ ශිෂුවාන් ප්‍රාන්තයේ ළමයින් පුනරුත්ථාපනය කිරීම සඳහා යොදාගත්තා. එහි ප්‍රතිඵලය ඉතාම සාර්ථකයි. ළමයි ළමයින්ට අයිති සෙල්ලම් ලෝකයට ඉක්මණින් ප්‍රවිෂ්ටකරවීම අපේ යුතුකමයි." ඒ අපූර්ව මැදිහත්වීම කළ පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ අධ්‍යක්ෂ, විශේෂඥ මනෝවෛද්‍ය අතුල සුමතිපාල මහතා පවසන්නේ ය.

නිවැරදි දිශාව වෙනුවෙන් සිදුකළ ඒ කුඩා ප්‍රවේශය සුනාමියෙන් පසු දීපව්‍යාප්තව අවසානයේ ජාතික තලයේ මැදිහත්වීමක් දක්වා ගමන් කළේය. විශේෂයෙන්ම එවක සංස්කෘතික අමාත්‍යාංශය මේ කාර්යය ඉතා ඉහළින් භාරගනිමින් මහඟු පූර්වාදර්ශයක් සපයා දුන්නේ ය. මේ ක්‍රියාදාමය කෙතරම් ඉදිරියට ගියේ ද යත් මෙරටට පැමිණි අමෙරිකා එක්සත් ජනපදයේ හිටපු ජනාධිපතිවරුන් වූ ජෝර්ජ් බුෂ් සහ බිල් ක්ලින්ටන් වෙත සමරු තිළිණ ලෙස පිළිගන්වනු ලැබුවේ ද ළමයින් විසින් අඳිනු ලැබූ ඒ සිතුවම් ය. කාලයාගේ ඇවෑමෙන් එම ව්‍යසනය පිළිබඳ ව මතකයන් අමතක කොට දමා එම ළමයි වෙනත් දෑ සිතුවමට නැඟුහ.

විපතට මුහුණපෑ ළමයින්ට පොත පත, ක්‍රීඩා භාණ්ඩ ලබාදීම ඔවුන් හුදු විනෝදයට පත් කිරීමට එහා ගිය මනෝ විද්‍යාත්මක ක්‍රියාවලියකි. මනෝ විද්‍යා උපදේශකයකු ඉදිරියේ තමන් මුහුණදුන් අත්දැකීම නැවත නැවත භාරා අවුස්සමින් එම අත්දැකීම මානසිකව යළි විඳින්නට සිදුවන තත්වය වෙනුවට තමන් තුළ වන ඒ අත්දැකීම සම්බන්ධ හැඟීම්, පීඩනය පත් ඉරුවක් මත සිතුවමක් ලෙස මුදා හරින්නට ළමයාට අවස්ථාව සලසා දීම ළමයාගේ සිතට ඉමහත් සැනසිල්ලකි. ඒ අත්දැකීම සිතේ සිරකරගෙන පීඩාවිඳීම වෙනුවට එම අත්දැකීම සමාජය වෙත සිතුවමක් ඔස්සේ ප්‍රකාශ කිරීමට ලැබීම තුළ ළමයාට මානසිකව දැනෙන සහනය ඉමහත් වේ. ඒ මානසික සහනය ඔස්සේ ළමයාට නැවතත් තමන්ගේ ලෝකයට පියමං කිරීමට මාර්ගයක් විවෘත වේ.

මේ ක්‍රමවේදය යුද්ධය නිසා විපතට, පීඩාවට පත්ව සිටින දෙමළ ළමයින් උදෙසා ද යොදාගත යුතු අවස්ථාව දැන් උදාවී තිබේ. මේ විපතට පත් දෙමළ ජනතාව වෙනුවෙන් විවිධ ද්‍රව්‍යමය ආධාර ලබාදෙනු දැකිය හැකි වුවත් ඒ ද්‍රව්‍ය අතර ළමයින් සඳහා විශේෂයෙන් අවශ්‍ය කරන පොත පත, පෑන් පැන්සල්, බෑග් හා ක්‍රීඩා භාණ්ඩ දක්නට නො ලැබේ. මේ තත්වය වෙනස් විය යුතු ය. වැඩිහිටියන්ට ආහාර පාන ලෙස ළමයින්ගේ ලෝකයට ක්‍රීඩා උපකරණ ඉතාම අවශ්‍යය. යුධ තත්වය තුළ, උතුරේ ළමයින්ගේ ලෝකයට බලහත්කාරයෙන් ඇතුළුකොට තිබූ "Arms" (ආයුධ) වෙනුවට "Arts" (කලා ශිල්ප) ද "Bombs" (බෝම්බ) වෙනුවට "Bats, Balls and Books" (පිති, බෝල සහ පොත්) ද මෙම පශ්චාත් යුධ වකවානුවේ ලබාදිය යුතුය. මෙම යුද්ධය



විසින් ළමා මනසෙහි පැළ කරනු ලැබ තිබෙන භීතිය, සාංකාව, ඉච්ඡාභංගත්වය, අවිශ්වාසය සහමුලින් තුරන්කර දැමිය යුතු ය. තමන් උපන් දා සිට ම යුද්ධය පමණක් දැක ඇති, ඛේදවාචක පමණක් අත්විඳ ඇති ළමයින්ට, එයට හාත්පසින් ම වෙනස් සොඳුරු ළමා ලෝකයක් අපගේ මව් පොළොවේ ඇතැයි සිතීමට අප කටයුතු සම්පාදනය කළ යුතු ය. කවර හෝ ව්‍යසනයක් මගින් සමාජයෙහි අහිමි වූ දෑ



චීනයේ භූමිකම්පාවට ලක් වූ ශිෂුවාන් ප්‍රාන්තයේ දැරියක ඇඳි සිතුවමක්

ප්‍රතිනිර්මාණය කිරීමේ ක්‍රියාන්විතයකදී "පළමුව ළමයින්ට" යන ප්‍රතිපත්තිය හා මූලධර්මය මත පදනම්ව කටයුතු කිරීම අත්‍යවශ්‍ය ය.

යුද්ධයේ වෙඩි හඬ මැද, මරණීය අඳෝනා මැද, ස්වකීයයන් මුහුණදුන් විවිධ ඛේදවාචක මැද බිඳ වැටී ඇති ළමා මනස ප්‍රතිනිර්මාණය කිරීම පශ්චාත් යුධ මොහොතේ ප්‍රමුඛතාව ලැබිය යුතු කටයුත්තකි. හෙට දවසේ ලාංකේය මව් පොළොව බබළවන සිය දහසක් අනාගත මිනිසුන් මේ ළමා පරම්පරාව තුළ සිටින බව නිසැක ය. මව් බිමේ ඒ සුපසන් හෙට දවස උදෙසා මේ ළමා පරම්පරාවට ඔවුන්ගේ අද දවස හෙවත් සොඳුරු ළමා ලෝකය අප්‍රමාද ව නිමවා දිය යුතු ය. ඒ සඳහා ක්‍රීඩා භාණ්ඩ දෙමළ බසින් ලියැවුණු ළමා පොත පත, පාසල් ලිපි ද්‍රව්‍ය, චිත්‍ර ඇඳීමේ මෙවලම් වහාම මේ ළමා පරම්පරාව අතට පත් කළ යුතුව තිබේ.

ඉදින් කවර සමාජ ව්‍යසන, විපර්යාස අභිමුව වුව නොවැනසුණු, විපතට පත් අනෙකාට ආධාර උපකාර කිරීමේ උදාරතර ලාංකේය හෘද සාක්ෂ්‍යය තුළ, ළමයින් ප්‍රමුඛත්වයෙහිලා සලකා කටයුතු කිරීමේ අවශ්‍යතාව හා වැදගත් කම අප අවබෝධ කර ගත යුතු ය. මව්බිමේ හෙට දවස වෙනුවෙන් මේ ළමයින්ගේ අද දවස අප ඔවුනට ලබා දිය යුතු ය. ■

# பிஞ் ஞூ , பிள்ஊளகளுக்த அக...



3 தசாப்தங்களாக இலங்கைச் சமூகம் பல்வேறு விதமாகப் பாதிப்புற்ற பயங்கரவாத யுத்தத்தின் இறுதித்தோற்றப்பாடுகளால் தற்பொழுது வேகமாகச் செயற்படுகின்றது. யுத்தம் முடிவடைந்தாலும் 3 தசாப்தங்களாக யுத்தத்தினால் இலங்கைச் சமூகத்தினரின் உள்ளங்களில் ஏற்படுத்தப்பட்ட பாரிய வடுக்கள் அவை உடல் ரீதியான காயங்கள் போல இலகுவில் குணமடையச் செய்ய முடியாது. யுத்தத்தின் தொடர் சமூகத்தின் உள்ளங்களில் ஏற்பட்ட வடுக்களையிட்டுப் பரந்தளவாகவும் ஆழமாகவும் ஆராய்வதுடன் அவை மீண்டும் ஒருபோதும் ஏற்படாத வண்ணம் குணமடையச் செய்ய வாய்ப்பை ஏற்படுத்தும். இங்கு யுத்தத்தினால் பாதிப்புற்ற அனைத்துத் தரப்பினரைப் பற்றியும் எமது கவனத்தைச் செலுத்துவதுடன் எமது விசேட கவனத்தைச் செலுத்தக் கூடிய சமூகப்பிரினரும் உள்ளனர். அவர்கள் சிறுவர்களாகும்.

‘‘நல்லவை சிறுவர்களுக்கு’’, ‘‘சிறுவர் சிறுவர்களேயன்றி அவர்கள் சிறிய வளர்ந்தோர் அல்ல’’ என்பது போல சிறுவர்களைப் பற்றிய மரபுத்தொடர்கள் சமூகத்தில் பல உண்டு. எனினும் நடைமுறையில் இவை அனைத்தினதும் பாவனை மரபுத்தொடர்களால் எல்லைப்படுத்தப்படாது வளர்ந்தோரின் அபிலாஷைகளை முன்னுரிமைப்படுத்தப்படுதவதனால் சிறுவர்களின் எதிர் பண்புகள், உணர்வுகள் மறைக்கப்படுகின்றன. நாம் நம்புகின்ற முறையில் சிறுவர் குறைவாக அன்றி சிந்திப்பர். எனினும் அவர்கள் வித்தியாசமாகச் சித்திப்பர். ஆயினும் அவர்களுடைய அந்த வித்தியாசமான சிந்தனைகளை வார்த்தைகளால் கூற முடியாது. பாரிய சமூக அனர்த்தத்தினால் பாதிப்படைந்த அனைத்து தரப்பினரதும் கவனத்தை ஈர்க்கச் செய்வதுடன் அத்தரப்பினரிடையே வரும் சிறுவர்களின் பிரவேசம் ‘‘மாற்றம்’’ பற்றிய தெளிவு மிகப் பிரதானமானதாகும். வேறு வகையில் குறிப்பிடுவதாயின் அந்தப் பிரவேசத்தின் அடிப்படையாக மாற்றமே அமைய வேண்டும்.

எந்தவொரு கலாசார மாற்றங்களாயினும் சீர்குலைவுகள் ஏற்பட்டபோதும் சரி சமூக அனர்த்தங்களாயினும் சரி எமது இலங்கை மக்களின் உள்ளங்களில் இருந்து விடுபட்டுச் செல்லாத உயர் பண்பாக பாதிப்புக்குள்ளான அடுத்தவர்க்கு உதவுவதோடும் தமது இனத்தை மட்டுமே சார்ந்திருக்கும் புலிகளினால் வடக்கின் தமிழ் மக்களை அழிவை நோக்கி இழுத்துச் செல்லும்போதும் அந்தப் பாதிப்படைந்த சகோதர தமிழ் மக்களுக்கு தெற்கின் சிங்களச்சமூகம் பொருளுதவிகளை வழங்க அணிதிரளுகையில் உள்ள உன்னதமான பண்பாகவன்றி வேறேது மில்லை. எனினும் கவலைக்குரிய விடயமாக அமைந்த அந்த பாதிப்புற்ற சமூகத்திலுள்ள சிறுவர்களின் ஏனைய தேவைகளைப் பற்றிச் சிந்திப்பதற்கு மறந்தமையாகும். இவ்வாறானதொரு நிலைமையை சுனாமியின் பிற்பாடு எமது சமூகத்திலே காணக்கூடியதாகவிருந்தது. அதாவது அநேகமான உதவிகள் வளர்ந்தவர்களின் தேவைக்காக மட்டுமே அனுப்பப்பட்டமையாகும்.

இவ்வாறான நிலைமைகளின் போது சிறுவர்கள் தனிமைப்படுவது, அவர்களை மறக்கச் செய்தல்,ஆராய்ச்சிக்கும் அபிவிருத்திக்குமான நிறுவனத்தினால் அடையாளங்கண்ட விஞ்ஞான அறிவின் அடிப்படையாய் அமைந்து சிறுவர்களுக்காக இலகுவானதும் ஆனால் பாரிய தலையீட்டினை மேற்கொள்ளவும் நடவடிக்கையெடுக்கப்பட்டது. அதன்படி சுனாமியால் பாதிப்புற்ற முகாம்களில் இருந்த சிறுவர்களுக்காக புத்தகங்கள். பேனை, நிறப் பென்சில்கள், விளையாட்டுப் பொருட்கள் வழங்க செயற்பட்டது. சுனாமி அனர்த்தத்தின்போது தோன்றிய உணர்வுகள் தங்களுக்குத் தேவையான மாதிரி வார்த்தைகளால் கூறமுடியாத நிலையில் இருந்த சிறுவர்களுக்கு அந்த உணர்வுகளை ஆக்கங்களாக வடிவமைப்பதற்காக பொருட்கள் வழங்கப்பட்டது. அதேபோல விளையாட்டுப் பொருட்கள் வழங்கியதால் சிறுவர்களின் விநோத உலகிற்குச் செல்ல அவர்களுக்கு வாய்ப்பினையளித்தது. ஆலோசனை எல்லாவற்றிற்கும் பயன்படுத்துவதற்குப் பதிலாக உளவியல் அறிவின் மீது அடிப்படையாய் அமைந்து மேற்கொண்ட அந்த பரீட்சிப்பின் விளைவுகள் அதிசயிக்கத்தக்கதாகும்.

‘‘முதியோர் போன்று ‘‘இழப்பு’’ என்பது சிறுவர்களுக்கும் கடுமையாக உணர்த்துகின்றது. எனினும் அவர்கள் தங்களுடைய கவலைகளை முதியோர் போன்று புலம்பல் மூலம் வெளிப்படுத்துவதில்லை. அவர்கள் தனிமைப்பட்டு பாரிய சிந்தனையுடனிருப்பர். ஏனையவர்களைப் போன்று கதைப்பதில்லை. வாழ்ந்து பிரயோசனமில்லை என்று சிந்திப்பர்.

சாப்பிடாமலிருப்பர். சிலைவேளை கோபத்துடன் செயற்படுவர். எனினும் அவை ஒன்றுமே மனநோய் அல்ல. இவ்வாறு செயற்படும் சிறுவர் கூட விளையாட்டுப் பொருட்களைக் கண்டவுடன் போராடிப் பெற முனைவர். இதனை நாம் சுனாமி அனர்த்தத்தின் போது கண்டோம். இந்த அனுபவத்தை அந்தச் சிறுவர் களுக்கு எழுத, வரைய பொருட்களை வழங்கியபோது அவர்கள் தங்களுடைய



உள்ளத்தில் இருக்கும் விடயங்களை எழுதவும் வரையவும் ஆரம்பித்தனர். அவர்கள்கரங்களில் விளையாட்டுப் பொருட்களை வழங்குவதனூடாக அவர்களை வியத்தகு உலகினை நோக்கி மீண்டும் அழைத்துச்செல்ல எமக்கு இயலுமாகும். நாம் இந்த முறைமையை கெப்பித்திகொல்லாவையில் இடம்பெற்ற பஸ் குண்டு வெடிப்பின்போதும் கடந்தாண்டு சீனாவின் சிசுவான் மாகாணத்தில் ஏற்பட்ட பூமியதிர்ச்சியின்போதும் சிறுவர்களை புனர்வாழ்வளிப்பதற்காக அவர்களை ஈடுபடுத்தினோம். அதன் முடிவு பாரிய வெற்றியாகும். சிறுவர்களை அவர்களுடைய வினோத உலகில் விரைவாக நுழையச்செய்வது எமது பொறுப்பாகும்.” அந்த அபூர்வ மத்தியஸ்தம் விகித்த ஆராய்ச்சி மற்றும் அபிவிருத்திக்கான நிறுவனத்தின் பணிப்பாளர் உளவியல் நிபுணர் வைத்தியர் அதுல சுமதிபால அவர்களால் கூறிய கருத்தாகும்.

சரியான திசையில் மேற்கொண்ட அந்த சிறிய பிரவேசம் சுனாமியைத் தொடர்ந்து நாடுமுழுவதும் இறுதியாகத் தேசத்தின் தலையீடு வரைக்கும் சென்றது. விசேடமாக அன்று கலாசார அமைச்சு இந்த வேலையைப் பொறுப்பேற்று பாரிய முன்மாதிரியாகத் திகழ்ந்தது. இந்த விடயம் எந்தளவு முன்னோக்கிச் சென்றது என்றால் இந்த நாட்டிற்கு வந்த அமெரிக்காவின் முன்னாள் ஜனாதிபதிகளான ஜோர்ஜ் புஷ், பில்கிளின்டன் ஆகியோருக்கு வழங்கப்பட்ட நினைவுச் சின்னங்களான அந்தச் சிறுவர்களின் படைப்புகளாகும். காலத்தின் மாற்றத்தால் அந்த அனர்த்தத்தைப் பற்றிய நினைவை மறந்து அந்தச் சிறுவர் வேறொரு விடயத்தினை கற்பனை செய்கின்றனர்.

அனர்த்தத்திற்குள்ளான சிறுவர்களுக்கு புத்தகங்களையும் விளையாட்டுப் பொருட்களையும் வழங்குவதால் விநோதமடைவதனைவிட மேல்நோக்கிச் சென்றதோர் உளவியல் செயற்பாடாகும். உளவியல் ஆலோசகர் தன் எதிரே தனக்கு ஏற்பட்ட அனுபவத்தை மீண்டும் மீண்டும் கேட்க அதனால் உள ரீதியான பாதிப்பு ஏற்படுவதனை விடுத்து மாற்றமாக தமது உள்ளத்தில் ஏற்படும் அனுபவங்களையும், உணர்வுகளையும் கட்டுப்பாடுகளையும் சித்திரமாக அமைப்பதற்கு சிறுவர்களுக்கு வாய்ப்பளிப்பது உள்ளத்திற்கு ஆறுதலளிக்கக் கூடியதாகும். அந்த அனுபங்களை உள்ளத்தில் சிறைப்படுத்தி வைக்காது அவற்றை அந்த அனுபவங்களை சமூகத்தில் சித்திரமாக எடுத்துக் காட்டக்கிடைப்பது சிறுவர் உள்ளத்தில் தோன்றும் ஆறுதலாக அமையும். உளத் திருப்தியினால் சிறுவர் மீண்டும் தமது சிறுவர் உலகிற்குப் பிரவேசிக்கக்கூடியதாக இருக்கும்.

இந்த முறைமை யுத்தத்தினால் பாதிப்புற்ற தமிழ் சிறுவர்களுக்காகப் பயன்படுத்தக்கூடிய வாய்ப்பாக தற்பொழுது ஏற்பட்டுள்ளது. பாதிப்புற்ற தமிழ் மக்களுக்குப் பகரமாக பலவித பொருள் உதவிகள் வழங்கப்படுவதனைக் காணக்கூடியதாயினும் அவற்றினிடையே விஷேடமாக சிறுவர்களுக்குத் தேவையான புத்தகம், பென்சில், பேனை, பேக் மற்றும் விளையாட்டுப் பொருட்களும் காண முடியாதுள்ளது. இந்நிலைமை மாற வேண்டும். வளர்ந்தோர்க்கு உணவு பானங்களும் சிறுவர்க்கு விளையாட்டுப் பொருட்களும் மிகத் தேவையாகும். யுத்த சூழ்நிலையில் வடக்கின் சிறுவர்களது வாழ்வில் பலவந்தமாக உட்படுத்தியிருந்த ஆயுதங்களுக்கு மாற்றமாக கலைப்பொருட்களை வழங்குதல் வேண்டும். இந்த யுத்தத்தினால் சிறுவர்



உள்ளங்களில் விதைக்கப்பட்டுள்ள அச்சம், பீதி, நம்பிக்கையீனம் என்பவற்றை முற்றுமுழுதாக ஒழித்தல் வேண்டும். தாம் பிறந்த நாள் முதல் யுத்தத்தை மாத்திரமே கண்டுகளித்த சிறுவர்கள் அதற்கு மாற்றமாக விநோத உலகொன்று தாய் மண்ணில் உண்டா என்று சிந்திக்க நடவடிக்கை மேற்கொள்ளவேண்டியுள்ளது. எந்தவொரு அனர்த்தம் மூலமாகவும் சமூகம் இழந்தவற்றை மீளக்கட்டியெழுப்பும் நடவடிக்கைகளில் ‘‘முதலாவதாக சிறுவர்”



என்னும் கொள்கையும் அடிப்படையையும் கொண்டு செயற்படுவது அத்தியாவசியமாகும்.

யுத்தத்தின் வெடிச்சத்தங்களுக்கும், மரண ஓலங்களுக்கும் முகங்கொடுத்த பல அவலங்களுக்குட்பட்ட சிறுவர் உள்ளங்களில் மீள்கட்டுமானம் என்பதில் யுத்தத்தின் பிற்பாடு முதலிடம் வழங்கவேண்டிய செயற்பாடாக அமைய வேண்டும். நாளைய இலங்கை மண்ணில் ஒளிவிடும் மனிதப் பிரஜைகளாக பரம்பரையில் சிறுவர்கள் இருப்பது நிச்சயம். தாய் நாட்டின் நாளைய தினத்தை நோக்கிய சிறுவர்களின் இன்றைய தினத்தை விநோதம்மிக்க சிறுவர் உலகமாக தாமதமின்றி அமைத்துக்கொடுத்தல் வேண்டும். அதனையிட்டு விளையாட்டுப் பொருட்களும் தமிழ் மொழியிலான புத்தகங்களும் பாடசாலை எழுதுகோல்களும் விரைவாகப் பெற்றுக்கொடுத்தல் வேண்டும்.

ஆகவே சமூகத்தில் அனர்த்தம், அழிவு என்பவற்றில் பாதிப்புற்ற அனைவர்க்கும் உதவி உபகாரம் செய்ய இலங்கையர் உள்ளத்தில் சிறுவர் தேவைப்பாடுகளையும் தாய் நாட்டின் நாளைய தினத்துக்காக இந்தச் சிறுவர்களின் இன்றைய நாளை அவர்களுக்குப் பெற்றுக்கொடுத்தல் வேண்டும். ■



**ආචාර්ය ටියුඩර් වීරසිංහ**
අංශ ප්‍රධාන, ජනමාධ්‍ය පීඨය - ශ්‍රී පාලි මණ්ඩපය,
කොළඹ විශ්ව විද්‍යාලය

# පශ්චාත් යුද ශ්‍රී ල...

# ජනමාධ්‍ය ...

# කෙසේ වි...

ජනමාධ්‍ය යනු, සමාජ ජීවිතයෙහි වන දේශපාලනය, ආර්ථිකය, සංස්කෘතිය, මතවාදී ක්ෂේත්‍රය... යනාදී සියලුම ක්ෂේත්‍ර කෙරෙහි තීරණාත්මක බලපෑමක් සිදු කරන ප්‍රබල සමාජ ආයතනයකි. අපේ රටේ පසුගිය දශක තුන තුළ ජනමාධ්‍යයේ හැසිරීම පිළිබඳ ව විමසා බැලීමේදී, ප්‍රධාන අරමුණු 2ක් පාදක කරගෙන ජනමාධ්‍යයේ හැසිරීම සිදුව ඇති බව හඳුනා ගැනීමට පිළිවන. පළමුවැනි අරමුණ වන්නේ ආර්ථික හා වාණිජ්‍යමය අරමුණ පෙරදැරි කොට ගෙන ජනමාධ්‍ය කටයුතු කිරීමයි. දෙවැනි අරමුණ වන්නේ, දෘෂ්ටිමය නැතිනම් මූලික වශයෙන් දේශපාලන හා රාජ්‍ය බල සම්බන්ධතා පාදක කොට ජනමාධ්‍ය කටයුතු කිරීමයි. 1977න් පසුව නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්තිය අපේ රට තුළ ක්‍රියාත්මක වීමත් සමග ජනමාධ්‍යය තවත් ප්‍රබල කර්මාන්තයක් ලෙස වර්ධනය විය. එමෙන් ම 1990 දශකය වන විට, මෙරට ජනමාධ්‍ය ක්ෂේත්‍රය තුළ විශේෂයෙන් ම විද්‍යුත් ජනමාධ්‍ය ක්ෂේත්‍රය තුළ එතෙක් පැවති රාජ්‍ය ආධිපත්‍යය වෙනුවට පෞද්ගලික ප්‍රාග්ධනයට ද ජනමාධ්‍ය ක්ෂේත්‍රයට පිවිසීමට අවස්ථාව උදා විය. ව්‍යාපාරික ප්‍රාග්ධනයට, මෙතෙක් තමන්ට පිවිසීමට නොහැකිව තිබූ ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රාග්ධනය ආයෝජනය කොට ලාභ ලැබීමේ අවස්ථාව උදා වීම නිසා විශාල වෙනස්කම් කිහිපයක් මෙරට සමාජයෙහි සිදු විණි. ඊට පෙර ඔවුන්ට දේශපාලනිකව, සංස්කෘතිකව සමාජ පාලනයේ ආයතනයක් ලෙස ජනමාධ්‍යයට මැදිහත්වීමට අවස්ථාවක් නොවිණි. නමුත් උදා වූ නව තත්වය තුළ එහි බලයත් හැකියාවත් ප්‍රයෝජනයට ගනිමින් මෙරට සමාජ-ආර්ථික-දේශපාලන වාතාවරණයට සුවිශාල බලපෑමක් කළ හැකි තරම් ප්‍රබල බලවේගයක් ලෙස මෙරට ජනමාධ්‍ය පසුගිය දශක තුන තුළ වර්ධනය වූයේ ය. මේ නිසා අද වන විට රාජ්‍ය කේන්ද්‍රීය ජනමාධ්‍ය හා පෞද්ගලික අංශයේ ජනමාධ්‍ය වශයෙන් කොටස් 2ක් පවතී. මෙම ජනමාධ්‍ය විවිධ අයුරින් සමාජයට බලපෑම් කරනු දක්නට පිළිවන.

අපේ රටේ ජාතික ප්‍රශ්නය ගත්තද අපේ රටේ සමාජ සංවර්ධනය පිළිබඳ ප්‍රශ්න ගත්තද ජනමාධ්‍ය හා ඒ අතර තිබෙන සම්බන්ධය කුමක්ද යන්න ඉතා වැදගත් වේ. විශේෂයෙන් ම අපේ රටේ ජාතික ප්‍රශ්නය, නො එසේනම් ජාතිකත්ව අතර සම්බන්ධතාව පිළිබඳ ගැටලුවේ දී ද ලාංකේය ජනමාධ්‍ය එක් එක් යුගයන් හි දී සැලකිය යුතු භූමිකාවක් නිරූපණය කර තිබේ. නිදහසින් පසු දශක 6ක් පමණ වන සහ දශක 3ක් පමණ වන මේ යුද්ධමය තත්ත්වය තුළ ලාංකේය ජනමාධ්‍ය කවරාකාර භූමිකාවක් නිරූපණය කර තිබේ ද, අපේ රටේ සමාජ සංස්කෘතික හා ජාතිකත්වයන් අතර ඒකාග්‍රතාව වර්ධනය කිරීම පදනම් කරගත් පොදු ඒකීය ලාංකේය කතිකාවක් ගොඩ නැගීම සඳහා ජනමාධ්‍ය ස්වකීය භූමිකාව නිවැරදි ව ඉටුකර තිබේ ද යන්න පිළිබඳ ව විවිධ මත ප්‍රකාශ වෙමින් තිබේ.

නිදහසින් පසු අපේ රටේ වඩාත් ම සංවේදී, වඩාත් ම බරපතළ මෙන් ම දේශීය හා ජාත්‍යන්තර වශයෙන් වඩාත් ම කතිකාවට ලක් වුණු ප්‍රශ්නය වූයේ අපේ රටේ ජාතික ප්‍රශ්නය යි. මෙහිදී අපේ රටේ ජනමාධ්‍යයේ භූමිකාව සකස් වූයේ, සැබැවින්ම මෙම ප්‍රශ්නයේ ස්වභාවය, එහි ඓතිහාසික වර්ධනයේ ප්‍රවණතා, ඒ තුළ වන විවිධ බලවේග හා මේ ප්‍රශ්නය විසඳාගැනීමට අවශ්‍ය කරන ක්‍රියාමාර්ග කෙබඳු ද යන්න සමාජයට ඉදිරිපත් කරමින් ඒ සම්බන්ධ ව සමාජය තුළ පොදු කතිකාවක්, පොදු වේදිකාවක් ගොඩ නඟනවාට වඩා අප ඉහත දක් වූ මූලික අරමුණු දෙක ඉටු කර ගැනීම සඳහා ය. රාජ්‍ය ජනමාධ්‍ය හෝ වේවා පෞද්ගලික ජනමාධ්‍ය හෝ වේවා මේ සියලු ම ජනමාධ්‍ය විසින් ජාතික ප්‍රශ්නය ගනු ලැබුවේ පරමාර්ථයක්, අරමුණක් ලෙස නො ව හුදු ජනමාධ්‍යයක් ලෙසිනි. ජනමාධ්‍යයේ පැවැත්ම සඳහා වන උපක්‍රමික ස්වරූපයක් ලෙසත් තම බල වපසරිය ව්‍යාප්ත කර ගැනීම සඳහා වන ප්‍රවේශයක් ලෙසත් ජාතික ප්‍රශ්නය යොදා ගනු ලැබී ය. ජාතික ප්‍රශ්නය නිරාකරණය, ත්‍රස්තවාදී ප්‍රහාර වාර්තාකරණය, සිංහල-දෙමළ-මුස්ලිම් වැසියන් අතර වන සිදුවීම් වාර්තාකරණය ආදී සියල්ලම එබඳු නැමියාවක් ගත්තේ ය. වෙළෙඳපොළ කේන්ද්‍රීය නැමියාව තුළ ප්‍රවෘත්තිය සංවේදී ලෙස, ආකර්ෂණීය ලෙස ජනතාව වෙත ගෙනයාම වැදගත් වූවා මිස ඊට පාදක වූ සිද්ධිය ජනමාධ්‍යයට එතරම් වැදගත් නො වීය. ජනමාධ්‍ය විසින් ඒවා ඉදිරිපත් කරනු ලැබුවේ තමන්ගේ ම මතවාදයක්, තමන්ගේ ම සංස්කරණයක්, තමන්ගේ ම පර්යාලෝකයක් තුළ ය. පෞද්ගලික අංශයේ ජනමාධ්‍ය එය සිදු කළේ පුවත්පත විකුණාගැනීම, තම නාලිකාව වැඩි ග්‍රාහක පිරිසක් අතරට ගෙනයාම, ලාභ තරකර ගැනීම ආදී අරමුණුවලින් යුතුව ය. දේශපාලන පක්ෂවලට සම්බන්ධ ජනමාධ්‍ය ගත් විට ඒවා, තමන්ට



දේශපාලන බලය අත්පත් කරගැනීම සඳහාත් රාජ්‍ය ජනමාධ්‍ය ගත් විට බලයේ සිටි ආණ්ඩු තම බලය තහවුරු කරගැනීම සඳහාත් එය පාවිච්චිකරනු ලැබිණි. මෙලෙස වසර 30ක් පැවති යුද්ධය, තමන්ට ආදායම් උපදවා ගැනීමේ මාධ්‍යයක් බවට ජනමාධ්‍ය විසින් පරිවර්තනය කරගනු ලැබීය.



පසුගිය වසර 30ක් තිස්සේ ම මෙරට දේශපාලකයෝ මෙරට ජාතික ප්‍රශ්නය තම බල අධිකාරය ආරක්ෂා කර ගැනීමට පාවිච්චි කළහ. නමුත් ඒ ඓතිහාසික තර්කනයෙන් පිට පනින්නට අවශ්‍ය කරන වැටහීමකින් මෙම ප්‍රශ්නය තේරුම් ගැනීම පසුගිය සිව් වසර තුළ සිදු වූ බව මාගේ අදහසයි. ඇත්ත වශයෙන්ම අපේ රටේ ජාතික ප්‍රශ්නය තුළ ගුණයෙන් ස්වරූප දෙකක් තිබේ. ඒ ත්‍රස්තවාදී ස්වරූපය හා ජාතිකත්ව සම්බන්ධතා ස්වරූපයයි. ඒ අනුව මෙය විසඳීම සඳහා බෙදුම්වාදී ත්‍රස්තවාදය යුදමය ක්‍රියාමාර්ගයකින් මර්දනය කොට දේශපාලනික ක්‍රියාමාර්ගයකින් ජාතික ප්‍රශ්නයට විසඳුමක් දිය යුතු වේ. ජාතික ප්‍රශ්නය අරභයා මෙලෙස එකම අවස්ථාවේ එකිනෙකට ප්‍රතිවිරෝධී ක්‍රියාමාර්ග දෙකක ගමන් කළ යුතු ය යන වැටහීම තුළ අපේ රට අද මෙතැනට පැමිණ තිබේ. එනම් බෙදුම්වාදී ත්‍රස්තවාදය යුදමය ක්‍රියාමාර්ගයකින් පරාජය කිරීමයි. නොඑසේනම් යුද්ධයේ අවසානයයි. නමුත් යුද්ධය අවසාන වීම යනු ඇත්තවශයෙන් ම ජාතික ගැටලුවේ අවසානය නො වේ. සිදුවන්නේ රටේ ජාතික ප්‍රශ්නයේ එක් අවස්ථාවක් තවත් අවස්ථාවකට සංක්‍රාන්ති වීමකි. ත්‍රස්තවාදය යනු ජාතික ප්‍රශ්නයේ එක් ප්‍රතිඵලයකි. ඒ ප්‍රතිඵලය විනාශ කර අප ජාතික ප්‍රශ්නයේ සමස්ත මූල මණ්ඩලය විනාශ කළ බව සලකා කටයුතු කළහොත් එය අප වරද්දා ගැනීමකි. එ නිසා මීළඟට මෙම ක්‍රියාවලියේ අනෙක් පැත්ත එනම් සිංහල-දෙමළ ජාතිකත්ව අතර සම්බන්ධතාව පිළිබඳ ව පුළුල් සංවාදමය කතිකාවක් ගොඩනඟා ගැනීම අත්‍යවශ්‍ය වේ.

# ංකාවේ
# භූමිකාව
# ිය යුතු ද ?

වසර ගණනාවක් තිස්සේ අපේ රටෙහි සිදු වූ විභේදනය, භූගෝලීය වශයෙන් වූ විභේදනයක් නො වේ. එය වූ කලී ජාතිකත්වමය වශයෙන්, සංස්කෘතිකමය වශයෙන්, දේශපාලනමය වශයෙන්, ආධ්‍යාත්මික වශයෙන් වූ විභේදනයකි. උතුර, දශක තුනක් තිස්සේ ම දකුණේ තිබූ සංවර්ධනයෙන් ඉවත් වී තිබිණ. එමෙන් ම දශක තුනක් හෝ ඊට වැඩි කාලයක් තිස්සේ ශිෂ්ටාචාරය අත්පත් කරගත් මූලික තාක්ෂණික දැනුමෙන්, හැකියාවෙන් දුරස්ථ වී තිබිණ. මෙම අසමාන සමාජ-ආර්ථික-සංස්කෘතික තත්වය තුනී කිරීම, සමනය කිරීම යනු විශාල නවීකරණ දේශපාලන ආර්ථික කටයුත්තකි. ශ්‍රී ලාංකේය ජනමාධ්‍යයට මෙතැන දී දැවැන්ත භූමිකාවක් තිබේ. දශක තුනක් තිස්සේ විභේදනය වී, ඛණ්ඩනය වී තිබූ ලාංකේය ජන සමාජය එකට ඒකාබද්ධ කිරීම සඳහා වන පොදු ලාංකේය මතවාදයක්, පොදු ලාංකේය මනෝභාවයක්, පොදු ලාංකේය ප්‍රතිපත්තියක් ගොඩ නැඟීම සඳහා ජනමාධ්‍යයේ මැදිහත්වීම අත්‍යවශ්‍ය වේ. මෙය ජනමාධ්‍යයට තනිව කළ හැක්කක් නො වේ. නමුත් ඒ සඳහා අවශ්‍ය කරන වේදිකාව සම්පාදනය කිරීමේ මහඟු කටයුත්ත ජනමාධ්‍යයට කළ හැකි වේ. මෙහිදී දේශපාලකයින් හා බුද්ධිමතුන් දායක කර ගනිමින් ඒ හරහා සිවිල් සමාජය දැනුවත් කිරීමේ හා පෝෂණය කිරීමේ ලාංකේය කතිකාවක් ගොඩනැඟිය යුතු වේ. එම කතිකාව තුළින් අපට අලුත් තත්වයක් බලාපොරොත්තු වීමට පිළිවන. පශ්චාත් යුද ලාංකේය යථාර්ථය ඉල්ලා සිටින ඉතාම හදිසි සහ ප්‍රබල ම ඉල්ලීම හා ජයගතයුතු අභියෝගය මෙය වේ. එසේ නොමැතිව මෙතැනින් නැවතුම් තිත තැබුවහොත් අප නැවත පැරණි දෘෂ්ටි චක්‍රයට හසු වී ආපසු ඉතිහාසය කරා ගමන් කරනු ඇත. ඒ නිසා මේ උදා වී ඇති මොහොත කුමන අයුරින්වත් ආපසු කරකැවීමට ඉඩ නොදිය යුතු වේ. එය මෙරට බුද්ධිමතුන්ගේ ද දේශපාලකයින්ගේ ද ජනමාධ්‍යයේද වගකීමකි. මේ තත්වය සමස්තයක් ලෙස සුරක්ෂිත කර ගැනීමට අවශ්‍ය මතවාදී වාතාවරණය සහ ඒ මතවාදී මනෝභාවය ගොඩනැඟීමට අවශ්‍ය කරන සංකතිකාව දියත්කිරීමේ මූලික ම කාර්යභාරය ඇත්තේ ජනමාධ්‍යයටය. නමුත් මා දකින ආකාරයට අපේ රටේ ජනමාධ්‍ය වෙතින් තවම ඒ කාර්යය ඉටුවන බවක් දක්නට නැත. ජනමාධ්‍ය තවම ඊට පූර්ව ගැටලුව නිරාකරණය කිරීමේ එනම් බෙදුම්වාදී ත්‍රස්තවාදය මර්දනය කිරීමේ ප්‍රවේශය තුළ ගමන් කරමින් සිටී. නමුත් අපේ රටේ ජනමාධ්‍යයට අප මේ සඳහන් කරන තැනට ඉතා ඉක්මණින් පැමිණෙන්නට සිදු වේ. එතැනට නොපැමිණියහොත් විභේදනය වී ඇති අපේ සමාජය නැවත ගොඩනැඟීම දුෂ්කර අභියෝගයක් වේ. ජනමාධ්‍යයට තිබෙන මූලික අභියෝගය නම් අපේ රටේ ජාතිකත්ව අතර ඇති සියලු විශේෂතා, විවිධත්ව මෙන් ම ලංකාවේ ආර්ථික සංවර්ධනයේ අසමානතා පිළිබඳ ව සමාලෝචනය කරමින්, ඒ පිළිබඳ ව අදහස් හුවමාරු කර ගනිමින් ලාංකේය ජනතාව අතර පොදු මතවාදයක් ක්‍රමානුකූල ව ගොඩ නැඟීමයි.

ඒ මතවාදය ගොඩනැගීම සිදුවන අතරේ, ශ්‍රී ලංකා රජය උතුර හා නැගෙනහිර ප්‍රදේශයන්හි දැවැන්ත ආර්ථික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයක් දියත් කළ යුතු ව ඇත. උතුර හා දකුණ අතර දශක

# තේ මා ව / THEME

ගණනාවක් තිස්සේ නිර්මාණය වී ඇති ප්‍රබල සමාජයීය කාල-අවකාශ පරතරය නැති කළ හැකිවන්නේ එබඳු තත්වයක් තුළ ය. එතැන දී, මේ වන විට අහිමි ව ගොස් තිබෙන ආර්ථික, දේශපාලනික, ආධ්‍යාත්මික, අධ්‍යයනමය ආදී සියලු සම්බන්ධතා ගොඩනැඟිය යුතු වේ. එමෙන් ම උතුර-දකුණ ඒකීය සමාජයක් ලෙස ක්‍රියාත්මක වීමේ පොදු යාන්ත්‍රණයක් ගොඩනැඟිය යුතු වේ. එතැනදී ජනමාධ්‍යය විසින් ඉටු කරනු ලැබිය යුතු ප්‍රබල භූමිකාවක් පවතී.

1970 ගණන්වල පමණ සිට එවක යුරෝපා මහාද්වීපයේ විවිධ රටවල සිටි බුද්ධිමතුන්, දාර්ශනිකයින්, විද්‍යාඥයින්, කලාකරුවන්, සංස්කෘතික වේදීන් යනාදී පිරිස් විසින් පොදු යුරෝපීය මතවාදයක් ගොඩනඟා සංවර්ධනය කරන ලදී. එම මතවාදයට ඇතුළත් වූ අදහස් යුරෝපයේ විවිධ ජාතීන් අතර බීජ ලෙස පැවැතිණි. ඒවා පොදුවේ ගෙන විශ්ලේෂණය කරමින් පොදු යුරෝපීය මතවාදයක් ගොඩනංවනු ලැබූ අතර ඒ තුළ සෑම යුරෝපා ජාතියකට ම එක්ව සිටිය හැකි පදනමක් සකස් විය. මේ මොහොතේ ලාංකේය සමාජය හමුවේ ඇත්තේ ද එබඳු කාර්යභාරයකි. අපේ රටේ ද සිංහල-බෞද්ධ, දෙමළ-හින්දු, මුස්ලිම්-ඉස්ලාම්,.... යන සෑම සංස්කෘතියක් තුළ ම, මනුෂ්‍ය ප්‍රජාවක් තුළ ම ඓතිහාසික වශයෙන් සම්පාදනය කර ඇති මූලික සංකල්ප, අදහස් තිබේ. දේශපාලනික, ආගමික, සංස්කෘතික ආදී වශයෙන් වන මෙම සංකල්ප, අදහස් පිළිබඳ ව කතිකාවක් ඇති කොට මේවායෙහි ඇති වඩාත් ම පොදු සංකල්ප ගෙන පොදු ලාංකේය මතවාදයක් ගොඩ නැඟිය යුතු වේ. අප එතැනට කෙසේ හෝ යායුතු වන අතර එය මඟහැර අපට රටක් ලෙස ඉදිරියට යා නොහැකි තත්වයක් අප ඉදිරියේ පවතී.

නිදහස ලබා වසර 60කටත් වඩා කාලයක් ගත වී තිබුන ද අපට තවමත් රටක් විදියට, ජාතියක් විදියට, සමාජයක් විදියට විසඳාගත නොහැකි වූ මූලික ප්‍රශ්න 2ක් තිබේ. පළමුවැන්න, අපේ විවිධත්ව, අපේ අනන්‍යතා, අපේ අවශ්‍යතා නියෝජනය කරන අපට ගැලපෙන රාජ්‍යත්වයක් ගොඩ නඟා ගැනීමට අපට තවමත් නොහැකි වීමයි. දෙවැන්න, අපට සරිලන, අපට ගැලපෙන නිශ්චිත සංවර්ධන මාවතක් තෝරාගන්නට අපට නොහැකි වීමයි. අපට සමකාලීනව නිදහස ලබාගත් රටවල්, පශ්චාත් යටත් විජිත යුගය දායාද කළ ඒ මූලික ගැටලු දෙක ම විසඳාගෙන තම රටවල් ගොඩ නඟා ගත්හ. නමුත් ලාංකිකයාට තවමත් "ලංකාවක්" ගොඩ නඟා ගන්නට නොහැකි වී ඇත. ගැටලුව ඇත්තේ එතැන ය. එක අතකින් එය මෙරට දේශපාලනඥයින් අතර පමණක් ඇති ගැටලුවක් නො වේ. මෙරට බුද්ධිමතුන් අතර පමණක් ඇති ගැටලුවක් ද නො වේ. එමෙන් ම මෙරට සිවිල් සමාජයේ පමණක් ඇති ගැටලුවක් ද නො වේ. මෙතැන ඇත්තේ අප තුළ ම වන අප කවුද යන ගැටලුවයි. ලාංකේය සමාජය ගොඩ නඟන මෙම මානව ද්‍රව්‍යයේ ස්වභාවය නිවැරදි ව තේරුම්ගත හැකි බුද්ධිමතුන් ප්‍රජාවක්, එය වටහාගෙන ක්‍රියාත්මක කළ හැකි දේශපාලනඥයන් පිරිසක් හා ඊට සහයෝගය දිය හැකි සිවිල් සමාජයක් නැතිකම මෙන් ම මේ කණ්ඩායම් අතර සම්බන්ධයක් ගොඩ නැඟීමේ යාන්ත්‍රණයක් නැතිකමත් ගැටලුවකි. ජාතික රාජ්‍ය තුළ විසඳාගත යුතු මේ ප්‍රශ්න දෙක විසඳාගත නොහැකිව තිබිය දීම දැන් අප හමුවට අලුත් ප්‍රශ්නයක් පැමිණ තිබේ. එනම් මේ ගෝලීයකරණ ක්‍රියාවලිය තුළ අප ලාංකේය ජාතිය ලෙස ඒ ක්‍රියාවලියට සම්බන්ධ වන්නේ කෙසේ ද යන්නයි. මෙම පසුබිම තුළ අපගේ තත්වය වඩාත් සංකීර්ණ ය. මේ තත්වය දේශපාලන පක්ෂයකට ගොනු කරනවාට වඩා එය පොදු ලාංකේය තත්වයනුත් සමග සම්බන්ධ කොට සාකල්‍ය ලෙස, පද්ධතියක් විදියට විසඳුම් ගෙන ආ යුතු වේ. ඒ නිසා සමස්තය පිළිබඳ තැනකට අප ආ යුතු ය. සුනාමි ව්‍යසනය සිදු වූ අවස්ථාවේ ඒ පරිවර්තනය උදා කරගත හැකි වෙතැයි බොහෝ අය සිතූහ. නමුත් එය එසේ නොවීය. ජනමාධ්‍යය එම කාරණය ඔසවාගෙන සිටියේ ටික දවසකි. දේශපාලකයින් ද එම කාරණය ඔසවාගෙන සිටියේ ටික දවසකි. අවසානයේ පැරණි මාර්ගයට ම රට නැවත ඇද වැටිණ. ඉන් පාඩම් උගෙන, දැන් උදා වී තිබෙන මේ ඓතිහාසික සන්ධිස්ථානය නිවැරදි ව කළමනාකරණය කර ගැනීම අත්‍යවශ්‍ය ය.

සැබැවින් ම මෙය දැවැන්ත අභියෝගයකි. පසුගිය වසර 3 තුළ තිබූ අභියෝගයට වඩා මේ අභියෝගය ප්‍රබලය, තීරණාත්මකය. මේ හැරුම් ලක්ෂ්‍යය තුළ ලාංකේය ජනමාධ්‍ය පුළුල් දැක්මක සිට සමාජ, දේශපාලන, සංස්කෘතික කටයුතුවලට මැදිහත් විය යුතු ය. ඊළඟට අදාළ සිදුවීම් සම්බන්ධ ව පොදු ජනමතයක් ගොඩනැඟිය යුතු ය. මේ ජනමතය ගොඩනැඟීමේදී මූලික වශයෙන් ම ජනමාධ්‍යයට ජාතික වශයෙන්, කලාපීය වශයෙන් හා ගෝලීය වශයෙන් අප සිටින්නේ කොතැනද යන්න විශ්ලේෂණය කිරීමට හැකියාවක් තිබිය යුතු ය. අප සිටින හැරුම් ලක්ෂ්‍යයේ සැබෑ තත්වය, සැබෑ ගතිකයන්, සැබෑ ප්‍රතිවිරෝධයන්, වර්ධනය වීමට ඇති ශක්‍යතා ජනතාවට ඉදිරිපත් කළ යුතු ය. ජනමාධ්‍යවේදීන් අයත් වන්නේ ද බුද්ධිමතුන් ගණයට ය. ඔවුන් සමාජ- දේශපාලන අදහස් සමාජයට දිය යුතු වේ. ඒ අනුව යම් කිසි බහුත්වවාදී හා බහු ප්‍රවණතාත්මක කතිකාවක් සමාජය තුළ ඇති කළ යුතු ය. සමාජය තුළ යම් පිබිදීමක් ඇති වන්නේ එවිටය. මේ හැරුම් ලක්ෂ්‍යයේදී අපේ ජාතික වුවමනාවන් ආරක්ෂා වන අයුරින්, මෙරට වෙසෙන සියලු ම ජාතිකත්වයන්ගේ අවශ්‍යතා නියෝජනය වන අයුරින් සමස්තයේ වුවමනාව පෙරදැරිව ජනමාධ්‍ය ක්‍රියාත්මක විය යුතු වේ.

ඓතිහාසික වශයෙන් දශක කිහිපයක් තිස්සේ අපට අතික්‍රමණය කරන්නට නොහැකි වූ තැනකට අද අපේ රට පැමිණ තිබේ. මෙය සැබැවින් ම තීරණාත්මක තැනකි. මෙය කෙබඳු දිශාවකට යොමු වේ දැයි කල් තබා කිව නොහැකි ය. නමුත් මෙහිදී අවශ්‍ය කරන දෘෂ්ටිමය හා ආධ්‍යාත්මික බලවේගයක් ලෙස, මෙය සමකාලීන ලෝකය ගමන් කරන මාවතට තල්ලු කිරීම සඳහා නායකත්වය ලබාදීමට ජනමාධ්‍යයට පිළිවන. එහිදී මතුවන සියලු ප්‍රශ්න අපේ ජාතික වුවමනාවන් පාදක කරගෙන ඉදිරිපත් විය යුතු වේ. එසේ නැතිව හුදු එක් ජාතිකත්වයක හෝ එක් ආගමක හෝ එක් දේශපාලන පක්ෂයක හෝ දෘෂ්ටිවාදයකට අනුගත ව ඉදිරිපත් නොවිය යුතු ය. එසේ නොවුනහොත් අප තව දුරටත් බටහිර විදේශ බලවේගයන්හිම රූකඩ ලෙස පැවැතීම වැළැක්විය නොහැකි ය. මේ නිසා ජනමාධ්‍ය විසින් සම්පාදනය කළ යුත්තේ එම දැක්මයි. කෙටියෙන් ම කියනවා නම්, ලාංකේය ජනමාධ්‍ය විසින් මේ තීරණාත්මක මොහොතේ පොදු ලාංකේය සංවර්ධනාත්මක මතවාදයක් ගොඩ නැඟිය යුතු අතර ඒ තුළ ජාතික හා ගෝලීය වුවමනාවන් එකිනෙක බද්ධ වී තිබිය යුතු ය. ■

---

සාකච්ඡාවක් ඇසුරින් සකස් කළේ - ප්‍රභාත් චින්තක මීගොඩගේ

# Health System Reconstruction and Nation-Building



How important is the role of health in nation-building? To answer this question, a RAND team of political scientists, physicians, and economists examined past attempts to rebuild public health and health care delivery systems during nation-building efforts after U.S. military deployments intended to underpin the transition to peace, democracy, and economic stability. Their main conclusion: Nation-building efforts cannot be successful unless adequate attention is paid to the population's health. In addition, efforts to improve health can be a powerful tool for capturing the goodwill of the residents.

**Defining and Measuring Success in Nation-Building**

To identify important lessons for future operations, the RAND team conducted seven case studies of efforts over the past 60 years to rebuild health systems after U.S. military deployments:

- Germany and Japan after World War II
- Somalia, Haiti, and Kosovo in the 1990s
- Afghanistan and Iraq after September 2001.

To provide a framework for measuring success, the team divided nation-building into the five phases shown in Figure 1. The three end points represent possible health outcomes after major reconstruction efforts have ended: failure (a decline in key public health and health care delivery indicators over the course of recon- struction ); little change; or success (improvement in health indicators compared with both pre-conflict and immediate post-conflict levels).

Key findings:

- Nation-building efforts cannot succeed unless adequate attention is paid to the population's health.
- Efforts to improve residents' health can generate goodwill.
- Successful health system reconstruction requires planning, coordination, and leadership.
- Health reconstruction is linked to other sectors, such as water and power.
- Health-sector reform must be sustainable by the country's own health care providers and leaders.
- Security is essential for all reconstruction, including health.

The analysts defined success as improved conditions for water, sanitation, food, and nutrition; and lower rates of infectious diseases and mortality. The team also considered whether the nation-building efforts established a sustainable health infrastructure and an appropriate public health system.

A major challenge in conducting this study was finding reliable data to permit comparison across all countries. The RAND team used a hybrid of qualitative and quantitative analyses. In this approach, a country's improvement in health can be represented by two core factors of a successful health reconstruction effort: infrastructure and resources and coordination and planning.

These factors can be used to plot the success of nationbuilding efforts in the seven countries examined (see Figure 2). The countries cluster into three quadrants:

- Germany and Japan are the most successful. Immediately after their respective conflicts ended, these countries had a damaged but still-functioning infrastructure. Reconstruction efforts were not hampered by a lack of security. In addition, reconstruction efforts were well planned and effectively implemented.

Figure 1
Five Phases of Nation-Building in Relation to Health




- Kosovo and Iraq are mixed cases. They began the health reconstruction effort with a damaged but operational infrastructure. But efforts to repair the infrastructure were plagued by inadequate security. In addition, reconstruction was poorly planned and coordinated.

- Haiti, Somalia, and Afghanistan are the least successful. Their infrastructure was either poor before the conflict or severely damaged by it. Overall coordination and planning efforts were also inadequate, the health status of the population was

Figure 2
Success of Health System Reconstruction in Countries RAND Examined




poor, health system functioning was inferior, and security was insufficient to support the nation-building effort.

Below, we highlight an example from each quadrant, focusing on the five phases of nation-building.

**A Success Story: Japan**

Pre-conflict infrastructure. Before World War II, Japan had an efficient government structure and a public health and health care delivery infrastructure based on German models, regarded as Europe's most advanced at the time. However, the system provided only rudimentary care to most of the population.

Immediate post-conflict. In 1945, Japan's public health and health care delivery infrastructure lay in ruins. Housing, sewage systems, water plants, and equipment had been damaged extensively. The Japanese population suffered from widespread malnutrition. The atomic bombing posed unique physical and psychological challenges. Health resources were dramatically reduced.

Reconstruction. The effort to rebuild Japan's health infrastructure and public health system was successful. It was led by Colonel Crawford F. Sams, a career army doctor with extensive experience in public health and disease control. Sams provided capable, steady leadership throughout the occupation. He introduced modern methods of disease prevention and launched a public-education program to raise awareness of hygiene and sanitation. He reorganized the hospital system and reformed medical education. He successfully introduced powdered skim milk into the diets of school children, substantially increasing their protein and calcium intake. This relatively inexpensive initiative improved the health of millions of school children and created reservoirs of goodwill toward Americans for decades thereafter.

Sams was aided in his task by a secure environment. There was no armed resistance to the U.S occupation, enabling Sams and his staff to tackle not only immediate concerns but also systemwide reforms.

Consolidation. Japan was able to consolidate and maintain the improvements made during the reconstruction phase. The infant mortality rate, neonatal mortality rate, and death rate all fell, and life expectancy at birth grew substantially, largely as a result of improved nutrition and sanitation, as well as reactivated vaccination programs. The number and quality of health care personnel also increased.

Sams's goal was "democratization by demonstration." He successfully argued that U.S. investments in the health of Japanese citizens did more than perhaps any other single action to prove that the United States was committed to building a vibrant, functioning democracy out of a former enemy state. In so arguing, Sams linked health system reconstruction to the larger goals of the occupation.

**Mixed Success in Health System Reconstruction: Iraq**

Pre-conflict infrastructure (1991, after the first Gulf War). In the mid-1980s, Iraq had one of the most effective and modern health systems in the Arab world. But immediately after the first Gulf War, the population's health declined. Health, sanitation, and water infrastructures had been severely damaged in the conflict. Public health expenditures were drastically cut, and health indicators, such as infant mortality, which had improved steadily since 1960, deteriorated rapidly. The incidence of infectious diseases, such as cholera, typhoid, dysentery, and hepatitis, also increased sharply. A combination of interrupted vaccination programs and massive refugee movements increased the incidence of vaccine-preventable diseases, such as measles and whooping cough. A food-rationing program probably averted a famine, but malnutrition became a serious problem, with children and pregnant women most at risk.

Immediate post-conflict. In March 2003, the United States invaded Iraq to remove Saddam Hussein from power. RAND examined U.S., coalition, and Iraqi attempts to rebuild the health sector from May 2003, when President Bush declared combat operations completed, to December 2005. These efforts cannot be properly assessed because the data are preliminary, and information about basic health indicators is often not available. However, the emerging picture suggests that the deteriorating security environment detrimentally affected reconstruction efforts in all sectors, including health.

Reconstruction. The effects of inadequate security on health system reconstruction have been pervasive. Inadequate security has hindered progress in rebuilding water plants and hospitals, slowed immunization campaigns, exposed the health care labor force to intimidation and kidnapping, and kept patients from receiving care. Hospitals and physicians specifically have been targeted by insurgents. Consequently, many physicians and other health care workers have left the country, depleting it of necessary manpower.

Health is also tightly linked to the water, sanitation, and electricity sectors, so progress in all of these sectors must occur in parallel. For example, a rebuilt hospital is of little use if electricity and water supply are not reliable. This interaction between health and other sectors makes it misleading to measure success in health system reconstruction with just one factor, such as the number of health care facilities reopened.

Chronic malnutrition, especially among women and children, remains a serious problem in Iraq. The prevalence of malnutrition among children is particularly worrying, since experts believe that it leads to cognitive deficits and disease in adulthood.

How extensively can poor security affect efforts to reconstruct the health sector? One way to calibrate its effect is to examine the relationship of security to a specific measure of reconstruction success. RAND conducted such an analysis. As a measure of success, the team used the percentage change in the number of million person-hours of access to water from the pre-conflict period to January 2004. The analysts plotted this measure against the number of attacks per 100,000 of the population in the 18 Iraqi governorates. RAND found that success was nearly 5 times higher in governorates with higher security rates.

Health reconstruction in Iraq also suffered from the lack of a lead actor to

coordinate planning and funding. There was little coordination among the nongovernmental organizations (NGOs) in the country, and almost none between the NGOs and the Coalition Provisional Authority. The important successes in the health sector—no epidemics and no starvation—occurred because international organizations, NGOs, and the U.S. Agency for International Development (USAID) developed contingency plans in the event of armed conflict and prepositioned supplies in Iraq and in neighboring countries.

Consolidation. Iraq has been unable to systematically integrate and sustain gains from health reconstruction. Most hospitals and clinics are operating but are in poor condition. Violence persists, and hospitals and doctors continue to be targets. Shortages in essential medication and equipment continue. Many nurses cannot go to work or fear to do so; many physicians were abducted or murdered, or have emigrated. Poor security has terminated or continues to hamper efforts of NGOs and UN agencies, and it has caused policy-makers to shift funding from health to security. There is some evidence that poor health conditions—especially poor sanitation—have contributed to anti-Americanism and support for the insurgency. In short, early encouraging signs have been replaced by a rapidly deteriorating situation.

**Failure in Health System Reconstruction: Afghanista**

Pre-conflict infrastructure. Afghanistan is one of the world's most underdeveloped countries. Reliable health data are extremely limited. However, the information available puts Afghanistan at or near the bottom of every socioeconomic indicator used to measure human and economic progress. The country's fragmentary health care system has been dependent on external support since the 1950s, and the country has few health care professionals.

Immediate post-conflict. After the September 11, 2001, terrorist attacks, the United States, with support from indigenous allies, overthrew the Taliban regime in Afghanistan. RAND examined U.S., coalition, and Afghan efforts to rebuild Afghanistan's health sector from December 2001 through December 2005. Even more so than for Iraq, RAND's assessment is preliminary because dependable data are lacking and the time frame is short.

Reconstruction. The international community geared up for a short-term effort to rebuild Afghanistan. But it faced a long-term development challenge to build a country shattered by three decades of civil war. The population suffered from widespread malnutrition and poverty, and rates of infant mortality and infectious disease were high. Most of the population lacked safe water and modern sanitation.

Progress might have been quicker if the approach had been more sensitive to the nature of the crisis and Afghanistan's particular situation. For example, international organizations devoted significant resources to emergency food operations to avert a crisis. However, many experts believe that predictions of famine were initially incorrect or exaggerated. Afghanistan had a chronic food shortage but was not on the brink of famine, and emergency food operations diverted resources from alternatives, such as security.

Health system reconstruction was slow in starting: Not until the third year was there a rapid expansion of health services to rural areas. In addition, agencies underestimated the degree of operational difficulty.

Available resources were also inadequate. A joint-donor mission in April 2002 outlined a basic health services package. However, there was a large gap between the $87.4 million required and the $42.9 million available.

As with Iraq, health system reconstruction suffered from poor planning and coordination. International organizations and NGOs did not effectively communicate or coordinate with each other or with the Afghan agencies that, theoretically, were in control. Even within single agencies, defects in oversight, information, and evaluation were common. For example, the Government Accountability Office (GAO) found that USAID's program in Afghanistan lacked measurable goals and specific resource levels, did not delineate responsibilities, and contained no plans for program evaluation. The GAO also criticized poor collaboration and information sharing among agencies.

Consolidation. The main health challenges in Afghanistan are not amenable to quick fixes. The country is in a complex political emergency of long duration, characterized by institutional collapse, deep social cleavages, and the absence of normal accountability mechanisms, such as an independent legal system, because there is no legitimate government. The country has never really had a health infrastructure, and the health system remains overwhelmingly dependent on NGOs, which are primarily responsible for health care delivery. The country lacks health care leadership, competency, and capacity.

Security remains an ongoing concern, affecting the ability of international organizations and NGOs to conduct their health care programs and forcing them to scale back, suspend, or cancel operations. Continued ?are-ups of violence, coupled with insufficiently consolidated central power and the proliferation of opium cultivation and drug trafficking, have hampered Afghanistan's nation-building efforts in all sectors, including health. And violence appears to be increasing.

**Lessons for Future Nation-Building Operations**

Several important lessons emerge from these case studies:

- Health can have a significant independent effect in nation building efforts, helping to "win hearts and minds." In Japan, powdered skim milk improved the health of millions of school children and created reservoirs of goodwill toward Americans. In Iraq, failure to improve health conditions for the general population may have generated support for the insurgency.
- Successful health system reconstruction includes e? ective planning, coordination, and leadership. Health reconstruction in Iraq has suffered from the lack of a lead actor, thus potentially duplicating efforts or wasting resources.
- Health reform is linked to other sectors, such as power, transportation, and governance. Measures of success should focus on outcomes, such as improvements in basic health indicators—for example, lower infant mortality—rather than on outputs, such as number of rebuilt hospitals or the number of doctors and nurses trained.
- Health-sector reform needs to be sustainable, with responsibility passed to the country's health care providers and leaders. Countries such as Afghanistan that have weak national health capacities may never reach the point of sustainability.
- Security is essential for all reconstruction, including health. Poor security in Iraq and Afghanistan continues to ham per reconstruction efforts. ■

*(Courtsey of www.rand.org)*

# ලක් දැයේ පහන් ලොව දිනූ වගයි !

**රුචිර ජයතිලක**

ඕනෑම රටක් ඉදිරියට යන්නේ අලුතින් සිතන, නව නිර්මාණ කරන, පවතින තත්වයෙන් ඔබ්බට සිය සිතිවිලි මෙහෙයවන "හිතුවක්කාරයින්" නිසා ය. ලෝකය අලුත් කරන්නෝ එබඳු හිතුවක්කාරයෝ ය. එවැන්නෝ රටකට, ලෝකයට වඩ වඩාත් අවැසියහ. එමෙන් ම ඔවුන් ඕනෑම රටකට මහාර්ඝ සම්පතකි. ආර්ථිකමය වශයෙන් පරිවාරයේ රාජ්‍යයක් වන්නේ වී නමුදු, එබඳු මහාර්ඝ මානව සම්පත් අතින් අපේ රට කේන්ද්‍රයේ දියුණු රාජ්‍ය සමග එක පෙළෙහි සිටින්නට තරම් නිර්මාණශීලීත්වයෙන් පිරිපුන් වග පසුගිය දා ලෝකය හමුවේ ප්‍රදර්ශනය වූවේ ය. ඒ, මෙම අප්‍රේල් මස පළමුවෙනි දින සිට පස්වෙනි දින දක්වා ස්විට්සර්ලන්තයේ ජිනීවා නුවර පැවැති ජාත්‍යන්තර නව නිපැයුම්කරුවන්ගේ ප්‍රදර්ශනයේ දී ය. රටවල් 50ක් පමණ මේ සඳහා ඉදිරිපත් ව සිටි අතර, නව නිපැයුම්කරුවන්ගේ නව නිෂ්පාදන දෙදහසක් පමණ ඉදිරිපත් කොට තිබිණ. මෙම ප්‍රදර්ශනය සඳහා අපේ රටේ නව නිපැයුම්කරුවන් 7 දෙනකු විසින් නව නිෂ්පාදන ඉදිරිපත් කරනු ලැබූ අතර ඉන් හය දෙනෙක් ම පදක්කම් දිනා ගැනීමට සමත් වූහ.

ලෝක බුද්ධිමය දේපළ අයිතිය පිළිබඳ සංවිධානය විසින් වසරේ හොඳම නව නිපැයුම් සඳහා පිරිනමනු ලබන පළමු ත්‍යාගය හිමි වූයේ කොහු කෙඳි නිෂ්පාදනය කිරීම සඳහා නව යන්ත්‍රයක් නිර්මාණය කළ ආර්. එම්. ඩී. සුජිත් මහතාට ය.

ජාත්‍යන්තර පුවත්පත් කලාවේදීන්ගේ සංවිධානය විසින් හොඳම නව නිපැයුම් සඳහා පිරිනමනු ලබන පළමු ත්‍යාගය, දෘෂ්‍ය නොමැති පුද්ගලයින් සඳහා විශේෂ පරිගණක මවුසයක් නිර්මාණය කළ එම්. ඒ. ප්‍රින්ස් චන්ද්‍රසේන මහතාට හිමි විය.


ඩී. ජී. ඩබ්ලිව්. ජයවංශ


එම්. ඒ. ප්‍රින්ස් චන්ද්‍රසේන

ජාත්‍යන්තර නව නිපැයුම්කරුවන්ගේ සංවිධානයෙන් රන් පදක්කමක් දිනා ගැනීමට, දර භාවිත කරන අඩු වියදම් ආහාර විජලන යන්ත්‍රයක් නිෂ්පාදනය කළ කපිල වීරතුංග ආරච්චි මහතා සමත් විය.

ජාත්‍යන්තර නව නිපැයුම්කරුවන්ගේ සංවිධානයෙන් රිදී පදක්කමක් දිනා ගැනීමට, ස්වයංක්‍රීය හුළං ගසන පොම්පය නිර්මාණය කළ ඩී. ජී. ඩබ්. ජයවංශ මහතා සමත් විය.


ආර්. එම්. ඩී. සුජිත්


හැරල්ඩ් පී. ඒ. විජේතුංග

ජාත්‍යන්තර නව නිපැයුම්කරුවන්ගේ සංවිධානයෙන් ලෝකඩ පදක්කමක් දිනා ගැනීමට ස්වයංක්‍රීය ආප්ප නිෂ්පාදන යන්ත්‍රයක් නිර්මාණය කළ ඊ. එම්. රණතුංග මහතා සමත් විය.

ජංගම මුදල් හුවමාරු තාක්ෂණය ඉදිරිපත් කළ හැරල්ඩ් විජේතුංග මහතා, ජාත්‍යන්තර නව නිපැයුම්කරුවන්ගේ සංවිධානයේ ලෝකඩ පදක්කමක් දිනා ගැනීමට සමත් විය.

ඉදින් ලක් දූයේ පහන් රටවල් ගණනාවක් අබිබවමින් ලොව හමුවේ ස්වකීය නිර්මාණාලෝකය ප්‍රදර්ශනය කළේ එලෙසිනි. අපගේ ඒ විශිෂ්ට දූයේ පහන්වල නිර්මාණාලෝකයෙන්, ඥානාලෝකයෙන් අපගේ මව්බිම ආලෝකවත් කර ලීමට අපේ රටේ වගකිව යුතු අංශ කටයුතු කරන්නේ නම් හෙට එච්චර කළුවර නොවන බව නිසැක ය. ■


ඊ. එම්. රණතුංග


කපිල වීරතුංග

## පර්යේෂණ ලෝකයට පිවිසෙන්නට සූදානම් වන ඔබට මග පෙන්වන විද්වත් විවරණය

# පිළිතුරු සෙවීමේ මාර්ග: පර්යේෂණ ක්‍රම

**ආචාර්ය ගොඩ්වින් කොඩිතුවක්කු**
අධ්‍යක්ෂ - පර්යේෂණ හා සංවර්ධන
දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය

ම තු වන ගැටලු ගැන පර්යේෂණ ප්‍රශ්න ගොඩ නගා ගන්නා ආකාරයත්, කල්පිත පිහිටුවා ගන්නා ආකාරයත් හඳුනා ගත් අපට මීළඟට දැන ගන්නට අවශ්‍ය වන්නේ, ප්‍රශ්නවලට පිළිතුරු ලබා ගත හැකි මාර්ග ගැනයි. පිහිටුවූ කල්පිත පිළිගත හැකි හෝ නොපිළිගත හැකි දැයි සෙවීමේ පර්යේෂණ මාර්ග ගැනයි.

අප යා යුතු පර්යේෂණ මාර්ගය තෝරා ගත යුත්තේ ගමනක් යාමට මාර්ගයක් තෝරා ගන්නා සේ ය. ගමනක් යාම සඳහා විවිධ මාර්ග තිබිය හැකි ය. එසේ ම පර්යේෂණ ප්‍රශ්නයකට පිළිතුරු දීමට හා කල්පිත පරීක්ෂාවට ද විවිධ පර්යේෂණ ක්‍රම ඇත්තේ ය. මෙම මාර්ගවල අපහසුතා- පහසුතා, දුර- ළඟ, සෙනග ගැවසෙන- නොගැවසෙන බව වෙනස් වන්නා සේ පර්යේෂණ ක්‍රමවලට ද කෙටි- දුර, අපහසුතා- පහසුතා, වැඩි දෙනා භාවිත කරන-නොකරන ක්‍රම තිබේ. අපේ ගමනේ අරමුණු අනුව ළඟ ම- පහසු ම ක්‍රමය තෝරා ගැනීම, ප්‍රඥාවන්ත තීරණයක් වේ. වැඩි දෙනා ගැවසෙන පාරක යාම, සමහර විට ගමන අඩාල කරන්නට- ප්‍රමාද කරන්නට හේතු වන කරුණක් විය හැකි ය. එහෙයින් අප කළ යුත්තේ අපේ පර්යේෂණ ප්‍රශ්නයට, පිහිටුවා ගත් කල්පිතයට පිළිතුරු ගත හැකි හොඳ ම පර්යේෂණ ක්‍රමය තෝරා ගැනීම ය.

**පර්යේෂණ ක්‍රමයක් යනු කුමක් ද?**

අප ගොඩ නගා ගත් ප්‍රශ්නය හෝ පිහිටුවා ගත් කල්පිතය පැහැදිලි කිරීමට, අර්ථ නිරූපණය කිරීමට (පැහැදිලි කිරීමට), අනුමත කිරීමට සහ අනාවැකි කීමට පදනමක් වශයෙන් දත්ත රැස් කර විශ්ලේෂණය කිරීමේ ක්‍රමවත් වැඩ පිළිවෙළක්, පර්යේෂණ ක්‍රමයක් වේ. මේ අනුව පර්යේෂණයක දී අනිවාර්යයෙන් දත්ත අවශ්‍ය වේ. පර්යේෂණයේ විශේෂත්වය වන්නේ දත්ත පදනම් කර ගෙන ප්‍රශ්නවලට පිළිතුරු දීමයි. කල්පිතවල සත්‍ය-අසත්‍ය බව, පිළිගත හැකි- නොපිළිගත හැකි බව තීරණය කිරීමයි. "දත්ත" පර්යේෂණයක "ආත්මය" නැත හොත් "හදවත" ලෙස සැලකෙන්නේ මේ නිසා ය. දත්ත භාවිත කර කටයුතු කිරීම පිළිබඳ ව උදාහරණයක් සලකමු.

යුද්ධයෙන් පාසල් යන වයසේ දරුවන් කී දෙනෙක් අනාථ වී සිටිත් ද? යන ප්‍රශ්නයට මෙසේ ක්‍රම දෙකකින් පිළිතුරු දිය හැකි ය.

**1 වන ක්‍රමය**

අපොයි කියන්න බැරි තරම් ළමයින් අනාථ වෙලා. ඒ ගොල්ලන්ගේ ඉගෙනීම අන්තිමට ම කඩාකප්පල් වෙලා. සිංහල හමුදාව දෙමළ පුරවැසියන්ගේ ප්‍රදේශ ආක්‍රමණය කරලා, අපේ ළමයින්ගේ පාසල් අධ්‍යාපනය කඩාකප්පල් කරලා.

**2 වන ක්‍රමය**

ළමයි 450ක් අනාථ වෙලා. ළමයින් 125 දෙනකුගේ තාත්තා මිය ගිහින්. 25 දෙනකුගේ අම්මා මිය ගිහින්. 97 දෙනකුගේ දෙන්නාම මිය ගිහින්. 200ක ගේ අම්මා තාත්තාට මොනවා වුණා ද යන්න ගැන තොරතුරු නෑ. මිය ගිය අම්මලා තාත්තලාගෙන් 30ක් මිය ගියේ රජයේ හමුදා ත්‍රස්තවාදීන්ට එල්ල කළ ප්‍රහාරවලින්. 123ක් මිය ගියේ ත්‍රස්තවාදීන් එල්ල කළ ප්‍රහාරවලින්. ළමයින් 450, ඉස්කෝල හතරක ඉගෙන ගෙන සිටි අය. දැන් මේ අයගෙන් 200ක් අනාථ කඳවුරේ පිහිටුවා ඇති තාවකාලික පාසලට යනවා. අනිත් අයට විධිමත් ඉගෙනීමක් නෑ.



# අ ත් වැ ල

මෙයින් පළමුවැන්න පෞද්ගලික හැඟීම් අනුව, තමා පිළිගත් දේශපාලන මතය අනුව දුන් පිළිතුරකි. දෙවැන්න දත්ත සොයා ඒවා පදනම් කර ගෙන ලබා දුන් පිළිතුරකි, පර්යේෂණාත්මක පිළිතුරක් වන්නේ දෙවැන්නයි.

ඔබට ඇසෙන එසේ ම කියවන්නට ලැබෙන තවත් මෙවැනි ප්‍රකාශ කුමන ගණයට වැටෙනවා දැයි විග්‍රහ කරන්න. මේ අනුව පැහැදිලි වන්නේ පර්යේෂණයක දී ප්‍රධාන වන්නේ කිසියම් ප්‍රශ්නයක් ගැන අපේ පෞද්ගලික මත හෝ විශ්වාස නො ව "දත්ත" බව ය.

දත්ත ලබා ගැනීමට පර්යේෂණ ක්‍රම භාවිත කළ යුතු ය. "ගවේෂණ" 11වන කලාපයේ පළ වූ ලිපියෙන් පර්යේෂණ ක්‍රම 14ක් නම් වශයෙන් හඳුන්වා දී ඇත. එකී ක්‍රම හා එහි සඳහන් කර නැති සියලු ක්‍රම නිර්ණායක දෙකක් අනුව වර්ග කළ හැකි ය.

"පර්යේෂණයේ ඵලය" යන නිර්ණායකය අනුව, මූලික හා ව්‍යවහාරික ලෙස පර්යේෂණ වර්ග දෙකකි. "පර්යේෂණ ක්‍රියාවලිය" යන නිර්ණායකය අනුව ප්‍රමාණාත්මක හා ගුණාත්මක ලෙස පර්යේෂණ ක්‍රම දෙකකි. පර්යේෂණයක් කළ පසු නව දැනුමක් ඵලය ලෙස උත්පාදනය වන්නේ නම් එය මූලික පර්යේෂණයකි. උදාහරණයක් වශයෙන් "ඇසට නොපෙනෙන ක්ෂුද්‍ර ජීවීන්ගෙන් කොලරා වැනි වසංගත රෝග බිහි විය හැකි ය" යන සොයා ගැනීමෙන් මිනිසාට මූලික දැනුමක් ලැබී තිබේ. ඒ නිසා එය මූලික පර්යේෂණයකි. එකී මූලික දැනුම අනුව කොලරා රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා සුදුසු බෙහෙතක් සොයා ගැනීම ද මූලික පර්යේෂණයකි. එසේ සොයා ගත් බෙහෙත භාවිත කිරීමේ දී රෝගීන් දක්වන ප්‍රතික්‍රියා සහ රෝග සුව වීමේ රටා හඳුනා ගැනීම සඳහා කරනුයේ ව්‍යවහාරික පර්යේෂණයකි. එය ව්‍යවහාරය, එනම් බෙහෙත භාවිතය පිළිබඳ පර්යේෂණයක් නිසා ය.

යුද්ධයෙන් ළමයින් අනාථ වූ විට ඔවුන්ගේ මනස ක්‍රියා කරන ආකාරය ගැන අප නොදන්නා නව දැනුමක් සොයා ගත් විට එය මූලික පර්යේෂණයකි. එකී නව දැනුම පදනම් කර ගෙන, ළමා මනස ක්‍රියා කරන ආකාරය පදනම් කර ගෙන සුදුසු ඉගෙනුම් ක්‍රම ඒ ළමයින් සඳහා සොයා ගැනීම හා භාවිත කිරීම අයත් වන්නේ ව්‍යවහාරික පර්යේෂණ ගණයට ය.

අතීතයේ දී රූපය දුර ප්‍රදේශවලට ගමන් කරවිය නො හැකි විය. අද රූපවාහිනි මගින් මේ හැකියාව ලැබී ඇත. එනම් රූප ඈත ප්‍රදේශවලට යැවිය හැකි ය. ඒ සඳහා වන ක්‍රමය සොයා ගැනීම, මූලික පර්යේෂණයකි. එකී මූලික දැනුම අනුව මිනිසාගේ ඇසට මනසට උචිත ලෙස, සමීක්ෂණ කර, රූපවාහිනී යන්ත්‍ර නිපදවීම සඳහා පර්යේෂණ කිරීම ව්‍යවහාරික පර්යේෂණ ගණයට වැටේ.

පර්යේෂණ ක්‍රියාවලිය අනුව පර්යේෂණ ක්‍රම වර්ග වෙන ආකාරය හඳුනා ගැනීමට අපි පලතුරක් ලෙස බලමු. මේ පලතුරෙහි පැසුණු බවක් වේ. ඉදී ඇති මේ පලතුර පිළිගත් න්‍යායක් වැනි ය.

උදාහරණයක් වශයෙන් ජීන් පියැෂේ (Jean Piaget) යන ජීව මනෝ විද්‍යාඥයා පෙන්වා දී තිබෙන්නේ ළමයින්ගේ බුද්ධිය අවධි අනුව එනම් ළමයාගේ වයස අනුව ක්‍රමානුකූල ව සංවර්ධනය වන බව ය. මෙය දැනට පිළිගත් න්‍යායයකි. මේ න්‍යාය නමැති පැසුණු ගෙඩිය පදනම් කර ගෙන අපට කල්පිත ගොඩ නැගිය හැකි ය.

උදාහරණ විමසමු.

- පියැෂේ තම න්‍යාය ගොඩ නැගුවේ ස්විට්සර්ලන්තයේ විසූ තමාගේ ම දරුවන් පදනම් කර ගෙන ය. එකී න්‍යාය ලෝකයේ අනිකුත් ළමයින්ට නොගැළපේ.
- පියැෂේ න්‍යාය අනුව ශ්‍රී ලාංකික ළමයින්ගේ ද බුද්ධිය සංවර්ධනය වන්නේ අවධි අනුව ය.
- බුද්ධිය සංවර්ධනය වන්නේ සෑම ළමයාට ම පොදු අවධි අනුව නො ව ඒ ඒ ළමයාට උරුම වූ විවිධ ක්‍රම අනුව ය.

මෙසේ දැනට පිළිගෙන තිබෙන න්‍යායයක් පදනම් කර ගෙන ගොඩ නගා ගත් කල්පිත පරීක්ෂා කිරීමට, ක්‍රමානුකූල ව දත්ත රැස් කර ඒ දත්ත පදනමින් කල්පිත පිළිගත හැකි ද? නො හැකි ද? යනු තීරණය කිරීම සඳහා වූ ප්‍රවේශය ගැනෙනුයේ ප්‍රමාණාත්මක පර්යේෂණ ගණයට ය. මෙමගින් සිදු වන්නේ පවතින න්‍යායයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමකි. එසේම දැනට පිළිගෙන තිබෙන න්‍යායයක නිරවද්‍යභාවය ප්‍රශ්න කිරීමත් ඒ අනුව නව න්‍යාය ගොඩ නැඟීමත් ය.

දැන් අපි පලතුරෙන් ක්‍රමයෙන් මතු වන පැළයක් ගැන සිතමු. එකී පැළය යනු පලතුරෙන් ම මතු වන නව අදහසක් අනුව නව පලතුරක් බිහි කිරීම සඳහා වන ප්‍රයත්නයකි. මේ නව පැළය කුමනාකාරයේ පලතුරක් බිහි කරන්නේ දැයි අපි නොදනිමු. එය වැඩෙන ආකාරය අනුව අනාගතයේ දී ඇති විය හැකි පලතුර ගැන උද්ගාමී ව අධ්‍යයනය කිරීම ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශයයි. පැළය, විශාල ගසක් සේ වැඩී පලතුරු ඵල ලෙස ලබා දෙන්නා සේ, ගුණාත්මක පර්යේෂණයේ දී දත්ත ටිකින් ටික එකතු කරමින්, ඒවා විශ්ලේෂණය කරමින්, නව න්‍යායයක් උද්ගාමී ව ගොඩ නගන්නේ ය. මේ වෙනස රූප සටහන් දෙකකින් ද පැහැදිලි කළ හැකි ය. ■






ප්‍රභාත් චින්තක මීගොඩගේ



# විජ්ජා සන්නිවේදනයක් නොවිය යුතු විද්‍යා සන්නිවේදනය

මානව සමාජයේ පැවැත්ම උදෙසා විද්‍යාව සහ තාක්ෂණය විසින් තීරණාත්මක භූමිකාවක් නිරූපණය කරනු ලබන බවට විවාදයක් නැත. නමුත් අභ්‍යවකාශය ජයගත් ලෝකයක මේ මහ පොළොව මත කුසගින්නෙන්, මන්ද පෝෂණයෙන්, අත්‍යවශ්‍ය ඖෂධ නොලැබීමෙන් ලක්ෂ සංඛ්‍යාත මිනිසුන් මරණයට පත්වන යථාර්ථයක් අප අබිමුව වෙයි. එබැවින් විද්‍යාව හා තාක්ෂණය කෙතරම් දියුණුව පැවතිය ද එහි ඵල සමස්ත මානව සංහතිය වෙත නිසි ලෙස ගලා ගොස් නොමැති බව පැහැදිලි ය. විද්‍යා සන්නිවේදනයේ භූමිකාව පිළිබඳ ව අපට විමසා බැලීමට සිදුවන්නේ මෙබඳු පසුබිමක සිට ය.

අපේ රටේ දශක ගණනාවක් තිස්සේ පුවත්පත්, සඟරා ආදී මුද්‍රිත ප්‍රකාශන ඔස්සේ ද ගුවන්විදුලි මාධ්‍යය ඔස්සේ ද රූපවාහිනී මාධ්‍යය ඔස්සේ ද විද්‍යා සන්නිවේදනයක් සිදුවෙමින් පවතී. නමුත් ලාංකේය සමාජය දෙස බලන විට ඒ විද්‍යා සන්නිවේදනය සමාජයට ඵලදායී ලෙස සිදුව තිබේද යන්න පිළිබඳ ව ගැටලුවක් මතු වීම නොවැළැක්විය හැකි ය. වෛද්‍ය විද්‍යාව, විද්‍යාව හා තාක්ෂණය, සන්නිවේදනය මෙතරම් දියුණු 21 වන සියවසේ අපේ රටේ ජනතාව හදිසියේ ප්‍රාදුර්භූත වන "මහා ජීවකයින්" වෙත රොද බඳිමින් විශ්ව ශක්තියෙන් රෝග සුවකරගැනීමට පෙළඹෙන්නේ අපේ රටේ විද්‍යා සන්නිවේදනයේ කාර්යභාරය නිවැරදිව ඉටු වී නැති නිසා ය. එමෙන් ම එබඳු තත්වයක් පවතින්නේ අපේ රටේ ජනමාධ්‍ය සමාජය වෙත විද්‍යාව සන්නිවේදනය කිරීමට වඩා විවිධ ජනප්‍රිය මිථ්‍යාවන් සන්නිවේදනය කිරීමට උනන්දුවක් දක්වීම හා වැඩි මාධ්‍ය අවකාශයක් ඒ වෙනුවෙන් ලබාදීම නිසා ය. මේ වන විට අපේ රටේ සියලුම රූපවාහිනී හා ගුවන්විදුලි නාලිකා පාහේ හිමිදිරියේ සිය විකාශන කටයුතු ආරම්භයේදී ම රාහු කාලය, මරු සිටින දිශාව, ලග්න ඵලාඵල පවසනු දකිය හැකි ය. නමුත් සමාජය තුළ විද්‍යාත්මක චින්තනය, තාර්කික ඥානය දියුණු කිරීම සඳහා මෙම මාධ්‍ය විසින් ප්‍රමුඛතාවක් ලබා දේ ද? නැත. අපේ රටේ සාක්ෂරතාව සියයට අනූවකට වැඩි තරම් ඉහළ අගයක් ගත්තද සාමාන්‍ය ජනතාව තුළ තිබිය යුතු මූලික දැනුම පවා ඔවුන් තුළ නැතිවීමෙහි මූලය ගැටගැසී තිබෙන්නේ අපේ රටේ විද්‍යා සන්නිවේදනය සමග බව අපට පිළිගැනීමට සිදු වේ.

ලොව දියුණු රටකදී නම් විද්‍යා සන්නිවේදනයේ ප්‍රමුඛ අරමුණ, විද්‍යාත්මක පර්යේෂණවලින් හෙළි කරගන්නා නව දැනුම සමාජය වෙත සන්නිවේදනය කිරීම වුවත් ලංකාව වැනි පරිවාරයේ රටක විද්‍යා සන්නිවේදනයේ ප්‍රමුඛ අරමුණ විය යුත්තේ සමාජය තුළ විද්‍යාත්මක ව සිතීම තහවුරු කිරීමය. වෙනත් ලෙසකින් කියන්නේ නම්, අභ්‍යවකාශ තාක්ෂණයේ නවීනත ම සොයා ගැනීම් පිළිබඳ ව සන්නිවේදනය කිරීමට වඩා, හිසරදය අවස්ථාවකදී වැඩි මිලැති වෙළෙඳනාමයක් වෙනුවට අඩු මිලැති ඖෂධීය නාමයෙන් යුත් පැරසිටමෝල් පෙත්තක් මිල දී ගැනීමට අවැසි විද්‍යාත්මක ඥානය සම්පාදනය කරන විද්‍යා සන්නිවේදනයක් අපේ රටේ පොදු සමාජයට වැදගත් ය. පරිගණක තාක්ෂණයේ අලුත් ම නිපැයුම් ගැන සන්නිවේදනය කිරීමට වඩා, වෙළෙඳ දැන්වීම් මගින් වර්ණනා කරන පිටිකිරිවල සැබෑ ස්වභාවය අනාවරණය කරන විද්‍යා සන්නිවේදනයක් අපේ රටේ පොදු සමාජයට වැදගත් ය. එනම්, අපේ වැනි රටක සාමාන්‍ය ජනතාවගේ එදිනෙදා ජීවන පැවැත්ම සඳහා දායක වන විද්‍යා දැනුම සන්නිවේදනය කිරීම අත්‍යවශ්‍ය කාර්යයකි. විද්‍යාවේ තාක්ෂණයේ සංවර්ධනය මානව සමාජයේ යහපත සඳහා නම් විද්‍යා සන්නිවේදනය ද ඒ සඳහා විය යුතු ය. ගැඹුරු විද්‍යා දැනුම සන්නිවේදනය කිරීම ඒ වෙනුවෙන් ම වන මුද්‍රිත ප්‍රකාශන ධාරාවක් ඔස්සේ කළ යුතු ය. නමුත් පොදු සමාජය ඇසුරු කරන ජනමාධ්‍ය ඔස්සේ කරන විද්‍යා සන්නිවේදනයේදී ඉහත කී ආකාරයට ජනතාවට එදිනෙදා අවැසි වන විද්‍යා දැනුම සන්නිවේදනය කිරීමට ප්‍රමුඛතාව ලැබිය යුතු ය.

විද්‍යා සන්නිවේදනයේ දී විශේෂයෙන් ම පොදු සමාජය සඳහා වන විද්‍යා සන්නිවේදනයේ දී යොදාගනු ලබන බස්වහර ඉතා ම තීරණාත්මක භූමිකාවක් ඉටු කරයි. විද්‍යාත්මක සංදේශය වැදගත් එකක් වුවත් එය ඉදිරිපත් කෙරෙන බස් වහර රළු එකක් නම් එම සංදේශය ජනතාව අතරට යාමට බාධාවක් වේ. මෙය අපේ රටේ විද්‍යා සන්නිවේදනයෙහි ඇති ප්‍රධාන ගැටලුවක් බව පෙනේ. මේ නිසා විද්‍යා සංදේශය ජනතාව වෙත ගෙනයාමට යොදාගනුලබන බස් වහර ජනතාවට "දිරවන" බස් වහරක් වීම අත්‍යවශ්‍ය ය. විද්‍යා සන්නිවේදකයාගේ අරමුණ ජනතාව ඥානනය කිරීම නම් එතැන දී නිතැතින් ම ඔහු සිය බස්වහර ජනතාවට වැටහෙන, සරල එකක් කිරීමට පෙළඹේ. නමුත් විද්‍යා සන්නිවේදකයාගේ අරමුණ සිය විද්‍යා පාණ්ඩිත්‍යය සමාජයට ප්‍රදර්ශනය කිරීම නම් එතැන දී ඔහු වුවමනාවෙන් ම සංකීර්ණ බස්වහරක් යොදා ගැනීමට පෙළඹෙන අතර සිය සංදේශය ජනතාවට වැටහේද යන්න ඔහුට වැදගත් නො වේ. මෙබඳු විද්‍යා සන්නිවේදනයකින් ද සමාජයට ඵලක් වන්නේ නැත. මේ නිසා, විද්‍යාව හදාරා නැති, එහෙත් තම එදිනෙදා ජීවිතය සඳහා අනිවාර්යයෙන් ම විද්‍යාත්මක දැනුම අවැසි බහුතර ජනතාව උදෙසා වන විද්‍යා සන්නිවේදනයේ දී දිරවන භාෂාවක් යොදා ගැනීමට විද්‍යා සන්නිවේදකයින් සැලකිලිමත් විය යුතු වේ.

එමෙන් ම අපේ රටේ විද්‍යාඥයින්, පර්යේෂකයින්... ආදී විද්වත් පිරිස සඳහා පුළුල් දැක්මක් සම්පාදනය කරන්නා වූ විද්‍යා සන්නිවේදන ධාරාවක් අවශ්‍ය වී තිබේ. මෙම කාර්යය සඳහා එබඳු පුළුල් දැක්මක් සහිත විද්වත් කුලකයන් පෙරමුණ ගත යුතු වේ. අපේ රටේ බොහොමයක් විද්‍යාඥයින්, පර්යේෂකයින්... සිංහල භාෂාවෙන් සිදු කෙරෙන විද්‍යා සන්නිවේදනය පිළිබඳ ව එතරම් තැකීමක් නැති බවක් පෙනේ. ඔවුන් පර්යේෂණ සඳහා යොදාගනු ලබන දැනුම අහසින් කඩා පාත් වූ දෙයක් නොවන බවත් එය පොදු මහා සමාජයෙහි නිර්මිතයක් බවත් ඔවුනට අවධාරණය කළ යුතු අතර ඔවුන් සිදු කරන පර්යේෂණයන්හි ඵල ලැබිය යුත්තේ ඒ මහා සමාජය බවත් එබැවින් ඒ දැනුම අනිවාර්යයෙන් ම පොදු සමාජය වෙත වැටහෙන භාෂාවෙන් සන්නිවේදනය කළ යුතු බවත් ඔවුනට අවබෝධ කරවිය යුතු ය. විද්‍යාව පොදු ජනතාව අතරට ගෙනයාම පිණිස ඉමහත් මෙහෙවරක් සිදු කළ මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මහතා 1970 වසරේදී "විද්‍යා" සඟරාවට ලියූ කතුවැකියෙන් කොටසක් මෙසේය.

*"අප රටෙහි විද්‍යාව ව්‍යාප්ත කිරීම පොතින්-පතින් හෝ ගුවන් විදුලියෙන් සහ ප්‍රසිද්ධ දේශන මගින් හෝ පමණක් කළ හැක්කේ නො වේ. අප ගැමියා අතරට යා යුතු ය. අප සමහරුන් දූන් නැග ඉන්නා සමාජ කරලිය මත ම හිඳ රඟපානු ලබන විද්‍යා නාට්‍යය දැක්විය යුත්තේ, ප්‍රේක්ෂකයා මැදට ගොස්, ඔහු ද එහි නළුවකු වශයෙන් බඳවා ගෙනැයි.*

*විද්‍යාවෙන් තොර වූ ජාතික විමුක්තියක් අපට හෝ, ලොව අන් කවර වර්ගයකට හෝ ඇති වේ යැයි සිතනු නො වටී. එහෙත් විද්‍යාව ව්‍යාප්ත කරනු සඳහා ගන්නා පියවරෙහි දී නැගෙන හැකි දුෂ්කරතා මතින් ගොඩ වීම සඳහා මෙම මූලධර්මය පමණක් යෙදීම නො සෑහේ. විද්‍යාවෙන් එදිනෙදා ජීවිතයේ දී ගත හැකි ඵලය මේ යැයි අප රැටියාට වැටහුණේ කවර දිනෙක ද, එදා විද්‍යා ව්‍යාප්තිය සඳහා ඔවුන් ද අප හා එක් ව ගමන් කරනු ඇත. එසේ කිරීමට නම්, ගතින් පමණක් නො ව සිතින් ද අප ඔවුන් හා සබැඳිය යුතුම ය..."*

නමුත් සිය සිවිල් ප්‍රතිරූපය නඩත්තු කිරීම වෙනුවට එබඳු කාර්යභාරයකට උරදීමට අපේ රටේ විද්‍යාඥයින් කී දෙනකු සූදානම් ද යන පැනය අප හමුවේ තිබේ. මේ තත්වය තුළ, සැබැවින් ම එබඳු පුළුල් කාර්යයකට උරදීමට සූදානම් සහ එය තම වගකීමක් කොට සලකන විද්වතුන් සීමිත කණ්ඩාමකට සිය විද්වත් ප්‍රජාව කෙරෙහි බලපෑම් සහගත ක්‍රියාන්විතයකට අවතීර්ණ වීමට පිළිවන. මෙය ද වර්තමාන ලාංකේය විද්‍යා සන්නිවේදන ක්ෂේත්‍රයේ ප්‍රබල අවශ්‍යතාවකි.

අවබෝධ කොට ගත යුතු වැදගත්ම කාරණයක් නම් ලාංකේය සමාජය විද්‍යාව-තාක්ෂණය නොදැන සිටි සමාජයක් නොවූ බව ය. ඉපැරණි වාරි කර්මාන්තයන්හි, වාස්තු විද්‍යාත්මක නිර්මාණයන්හි කෘෂිකර්මයෙහි, දේශීය වෛද්‍ය විද්‍යාවෙහි මෙරටට අනන්‍යව පැවති විද්‍යා-තාක්ෂණ දැනුම් පද්ධතියෙහි ප්‍රබලත්වය මොනවට නිරූපණය වෙයි. එබැවින් ලාංකේය සමාජ විඥානය තුළ පැවති, එහෙත් මේ වන විට විවිධ අපද්‍රව්‍යවලින් වැසී ගොස් ඇති විද්‍යාත්මක චින්තන ධාරාව නැවත පාදා ගත යුතු ව තිබේ. එය ද අපේ රටේ විද්‍යා සන්නිවේදනයට පැවරෙන වගකීමකි. නමුත් එතැන දී ඒ ඉපැරණි දැනුම් පද්ධතිය පිළිබඳ ව ගෝත්‍රවාදයෙන් එහා ගිය වඩාත් පුළුල් දැක්මක් අවශ්‍ය වන අතර එහිදී උකහා ගත යුතු දැනුම නොපැකිල ව ලබා ගැනීමට මෙන් ම අත්හළ යුතු කොටස් නොපැකිලව අත් හැරීමට ද සූදානම් විය යුතු ය. ඉනික්බිති ඒ උකහාගත් දැනුම ලෝකයේ නූතන තාක්ෂණික දැනුම සමග ගලපා ගනිමින් මෙරටට ගැලපෙන වඩාත් නූතන දැනුම් පද්ධතියක් ගොඩනගා ගැනීමට අප සමත් විය යුතු ය. ඒ සඳහා වන සුවිශේෂ කාර්යභාරයක් අපේ රටේ විද්‍යා සන්නිවේදනයට පැවරේ.

සැප්තැම්බර් මාසයේ දී සාහිත්‍ය පිළිබඳ ව අපේ රටේ විශාල කතිකාවක් මතු වෙයි. නමුත් විද්‍යා සාහිත්‍යය පිළිබඳ ව අපේ සමාජයේ කතිකාවක් නැත. සමාජයේ තබා විද්‍යා සන්නිවේදන ක්ෂේත්‍රයේවත් සිය ක්ෂේත්‍රය පිළිබඳ ව කතිකාවක් ඇති බව නො පෙනේ. එබඳු කතිකාවක් වී නම් අපේ රටේ විද්‍යා සන්නිවේදනය මෙතරම් ජනතාවගෙන් ඈත් වූ සන්නිවේදන ධාරාවක් නොවනු ඇත. "වසරේ හොඳම විද්‍යා සන්නිවේදකයාට" සම්මාන පිරිනැමීමෙන් පමණක් මේ අර්බුදය විසඳා ගත නො හේ. මෙරට විද්‍යා-තාක්ෂණ ක්ෂේත්‍රයේ විද්වතුන්ගේ ද විශ්ව විද්‍යාලයන්හි සන්නිවේදන ආචාර්යවරුන්ගේ ද විද්‍යා සන්නිවේදකයින්ගේ ද දායකත්වයෙන් අපේ රටේ විද්‍යා සන්නිවේදනය පිළිබඳ ව පුළුල් කතිකාවක් ආරම්භ කළ යුතුව තිබේ. එම කතිකාව තුළින් අපේ රටට උචිත, වඩාත් සමාජ ඵලදායී විද්‍යා සන්නිවේදන ධාරාවක් නිර්මාණය කරගත යුතු ව ඇත.

අවසාන වශයෙන්, මහාචාර්ය නන්දදාස කෝදාගොඩයන් සඳහන් කළ වැකියක් නැවත උපුටා දක්වමු. **"විද්‍යාවෙන් තොර වූ ජාතික විමුක්තියක් අපට හෝ ලොව අන්කවර වර්ගයකට හෝ ඇති වේ යැයි සිතනු නොවටී..."** ■

## චරිත

# සමාජ පර්යේෂණ ජීවිතය කර ගත් ඔහු ... මහාචාර්ය නන්දසේන රත්නපාල





**බිමල් අතුල රත්නගොඩ**
පර්යේෂණ සහායක
පර්යේෂණ හා සංවර්ධන ආයතනය

ලෝවින් එකෙකු වේ එක් දෙයකට සමත" අප ජනවහර තුළ ප්‍රචලිත කදිම වැකියකි. මෙම වැකියේ වලංගුභාවය පිළිබඳ ව ප්‍රශ්න කරනා පිරිස් ද වර්තමානයේ දක්නට ඇත. ඒ කෙසේ වුවත්, මහාචාර්ය නන්දසේන රත්නපාල විද්වතා ගැන කතා කරන කවුරු නමුත්, නිරායාසයෙන් ම සිතනුයේ මෙම වැකිය සාවද්‍ය බොල් වැකියක් ලෙස ය. මහාචාර්ය නන්දසේන රත්නපාල විද්වතා සැබැවින් ම ඉතා පුළුල් පරාසයක්, තුළ විවිධ වූ විෂය පථ ඔස්සේ සැරිසරමින් ඉතා ගැඹුරු අධ්‍යයන, පර්යේෂණ රැසක් සිදු කළ සුවිශේෂී චරිතයකි. ප්‍රාඥයෙකි.

බණ්ඩාරවෙල කුරුකුදේගම ඉතා සුන්දර ගම්මානයකි. ගහ කොළින් වට වූ සුන්දර මිටියාවත්, හෙල්මළු ක්‍රමයට කුඹුරු ගොවිතැන් කළ දැකුම්කළු කඳු බෑවුම් හා ඒ අතුරින් දඟකාර ලෙස ගලා බසිනා කුඩා දිය දහරා ඇතුළු සියල්ල කුරුකුදේ ගමේ සොබාව තව තවත් විචිත්‍රවත් කළේ ය. වර්ෂ1935 දී මේ ගමේ විසූ පින්බර ගුරු මාතාවක තම කුසින් මොළකැටි සුන්දර බිළිඳකු මෙලොවට බිහි කළා ය. ගමේ තිබෙන ස්වාභාවික සිරියාව, ගැමියන්ගේ අව්‍යාජත්වය, ගම්මුන් අතර පවතින ළබැඳියාව ඇතුළු සියල්ල මෙම කුඩා දරුවාගේ ජීවිතයට බොහෝ දෑ එකතු කළේ ය. සැබෑ මනුෂ්‍යත්වයේ සුවඳ විඳිමින් තම ජීවන ගමනට මුලකුරු කියූ කුඩා රත්නපාල දරුවා, ප්‍රථමයෙන් ම කුරුකුදේගම මිශ්‍ර පාසලට ඇතුළත් විය. දෙමව්පියෝ එම පාසලේ ආචාර්යවරු වූහ. හය හතර තේරෙන වයසේ සිට පොත පතට ඇලුම් කළ මෙම කුඩා දරුවා පාසල් පුස්තකාලයේ තිබූ සියලු ම පත පොත කියවූ බව සඳහන් වේ. කුඩා අවධියේ පටන් පොතපත පරිශීලනය කිරීම තුළින් තම සාහිත්‍ය රසාස්වාදනයේ රසාංකුර පුබුදුවා ගත් රත්නපාල දරුවා, ශිෂ්‍යත්වයක් ලැබ කුරුකුදේගම මිශ්‍ර පාසලේ සිට පානදුරේ ශාන්ත ජෝන් විදුහලට ඇතුළත් විය. ශාන්ත ජෝන් විදුහල රත්නපාල දරුවාගේ ජීවිතයේ සුවිශේෂී කඩඉමකි. එහි දී ඉංග්‍රීසියෙන් රචිත පත පොත කියවූ අතර පියාගේ බලවත් උනන්දුව මත ඉංග්‍රීසි භාෂාව සහ ඉංග්‍රීසි සාහිත්‍යය හැදෑරීමට විශේෂ අවධානයක් යොමු කළේ ය. ශාන්ත ජෝන් විදුහලේ යම් කාලයක් අධ්‍යාපන කටයුතුවල යෙදී, ඉන් අනතුරු ව කොළඹ රාජකීය විදුහලට ඇතුළත් විය. කොළඹ රාජකීය විදුහලේ පුස්තකාලය ඔහුගේ ජීවිතයට සුවිශේෂී අත්වැලක් විය. විශේෂයෙන් එහි දී විවිධ ක්ෂේත්‍ර පිළිබඳ පත පොත පරිශීලනය කිරීමට මහඟු අවස්ථාවක් උදා විය. පසු කලෙක සරසවි පිවිසුමට අවශ්‍ය පසුබිම සකසා ගැනීම සඳහා එම සුවිශේෂී වටපිටාව මනා රුකුලක් වූ බව රත්නපාලයන් සඳහන් කර ඇත.

සරසවියේ දී සිංහල විෂයය පිළිබඳ ව ගෞරව උපාධිය හැදෑරූ ඔහු, තම විෂයයට අමතර ව අනෙකුත් විෂය සම්බන්ධ දේශනවලට ද සහභාගි විය. ඒ මඟින් ඉංග්‍රීසි භාෂාවට අමතර ව ජර්මන් හා ප්‍රංශ භාෂා පිළිබඳ දැනුමක් ලබා ගැනීමට ඔහු සමත් විය. තව ද දෙ වන වසරේ දී විශිෂ්ට ත්‍යාග කිහිපයක් හිමි කර ගන්නා ලදී. "නොලියූ පොතයි" නමින් තම ප්‍රථම කෘතිය විශ්ව විද්‍යාලයේ දී එළි දක්වන ලදී. සිංහල විශේෂ උපාධිය ඉහළින් ම සමත් ව පේරාදෙණිය සරසවියේ උපකථිකාචාර්යවරයකු වීමට වාසනාව උදා විය. ඉන් අනතුරු ව විද්‍යෝදය විශ්ව විද්‍යාලයට කථිකාචාර්ය තනතුරක් ලබා ගිය ඔහු විද්‍යෝදය සරසවියේ දේශකයකු ලෙස කටයුතු කළ අතර ම පේරාදෙණිය සරසවියෙන් ශාස්ත්‍රපති උපාධිය ලබා ගන්නා ලදී. "නූතන සිංහල" යටතේ සන්නිවේදනය පිළිබඳ ව දේශන මාලාවක් පටන් ගනිමින් සුවිශේෂ සේවාවක් ඉටු කළ ඔහු 1960 දශකයේ ශ්‍රී ලංකාවේ සාහිත්‍ය ක්ෂේත්‍රයට සිදු කළ මෙහෙය ඉතාමත් ප්‍රශංසනීය ය. ජර්මනියට ගොස් වෙනත් විෂයයකින් පශ්චාත් උපාධිය ලබා ගැනීමට උත්සුක විය. "ජනශ්‍රැති විද්‍යාව සහ මානව විද්‍යාව" සම්බන්ධ පර්යේෂණ කෙරේ දැඩි ඇල්මක් දක්වීය. ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් Folklore (ජනශ්‍රැතිය) නමින් සඟරාවක් පළ කළ අතර ඒ හරහා සිංහල ජනතාවගේ ඇදහිලි සහ විශ්වාස පිළිබඳ ව බොහෝ කරුණු එකතු කළේ ය. සරසවියේ දී මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ නිෂ්පාදනයක් වන "වඳින්න ගිය දේවාලේ" නමැති නාට්‍යයේ ඔහු රඟපා ඇත.

රත්නපාලයන්ගේ පර්යේෂණ ලෝකය ඉතාමත් විචිත්‍රවත් ය. ඔහු විවිධත්වයෙන් අනන්ත ය. විවිධ වූ ක්ෂේත්‍ර ගණනාවක් ඔස්සේ ගැඹුරට කිඳා බැස විශිෂ්ට ගණයේ පර්යේෂණ, අධ්‍යයන විශාල සංඛ්‍යාවක් සිදු කළ දුර්ලභ විද්වතෙකි.

මානව විද්‍යාඥයන් භාවිත කරන "සහභාගිත්ව නිරීක්ෂණ ක්‍රමය" තව දුරටත් දියුණු කර "ජීවන අත්දැකීම් ක්‍රමය" (living-in - research) නමින් ඉතාමත් ප්‍රායෝගික ක්‍රමවේදයක් හඳුන්වා දුන් ඒ මහතා, ඒ අනුසාරයෙන් ගැඹුරු අධ්‍යයන, පර්යේෂණ රැසක් සිදු කළ අතර එහි ප්‍රතිඵලයක් ලෙස අතිශයින් ම වටිනා කෘති කිහිපයක් ලෝකයට දායාද කළේ ය. ඒවා අතර "ශ්‍රී ලංකාවේ යාචකයෝ", "ශ්‍රී ලංකාවේ ගණිකාවෝ", "පොලිස් මහජන සම්බන්ධතා", "සර්වෝදයේ උපත" හා "රොඩී ජනතාව" යන ග්‍රන්ථ වේ. "ශ්‍රී ලංකාවේ යාචකයෝ" නමැති ගැඹුරු

# ච රි ත

පර්යේෂණාත්මක කෘතිය සඳහා වසරක කාලයක් හිඟන්නකු ලෙස ජීවත් වූ ඔහු ලංකාවේ වෛශ්‍යාවන් ගැන අධ්‍යයනය සඳහා උනන්දු වූයේ පේරාදෙණිය සරසවියේ සිටිය දී ම ය. කොළඹ ප්‍රසිද්ධ හෝටලයක වේටර්වරයකු ලෙස රැකියාව කරමින් එම හෝටලයට යන එන ජනයාගේ සාමාජීය හා ලිංගික ජීවිතය පිළිබඳ අධ්‍යයනයක් කරන ලදී. දරිද්‍රතාව පිළිබඳ අධ්‍යයනය කිරීම උදෙසා දුෂ්කර ගම්මාන 10ක් තෝරා ගෙන එම ගම්මානවල මිනිසුන් සමඟ ජීවත් වෙමින් (Emulation) එම අත්දැකීම අත්විඳිමින් ඒ පිළිබඳ ගැඹුරු විග්‍රහයකට පැමිණියේ ය. ඒ අනුසාරයෙන් "ලංකාවේ දුප්පත්කම" (Poverty in Sri Lanka) නමින් පර්යේෂණාත්මක ග්‍රන්ථයක් එළි දක්වන ලදී. විද්‍යෝදය විශ්ව විද්‍යාලයෙන් ජර්මනියට ගොස් මයින්ස් සරසවියේත් දෙවනුව ගොටින්ගන් සරසවියේත් ඉගෙනුම ලබා ගත් රත්නපාලයන් එහි දී මානව විද්‍යා දර්ශන විශාරද (PhD) උපාධිය ලබා ගත් අතර පසුව සමාජ විද්‍යාව දර්ශන විශාරද (PhD) උපාධියක් ද ලබා ගත්තේය. තව ද අපරාධ





විද්‍යාව හා සම්බන්ධ පර්යේෂණ කෘති ලිවීමෙන් සාහිත්‍ය සූරි (Dlitt) උපාධිය ලබා ගැනීමට ද සමත් විය. එය ගෞරව උපාධියක් නො වන අතර, පර්යේෂණ සඳහා ලබා ගත් එම උපාධිය, ලංකාවේ දී එලෙස ලබා ගත් එක ම උපාධිය බව ද කියනු ලැබේ. ඔහු විසින් සමාජ විද්‍යාව, මානව විද්‍යාව සහ අපරාධ විද්‍යාව යන විෂය තුන ම විශ්ව විද්‍යාලය තුළ දී උගන්වන ලදී. ඔහුගේ කෘති කිහිපයක් විදේශීය රටවල පළ විය. වර්ෂ 1992-1993 කාලය තුළ ඔහු ලංකාවේ ඒඩ්ස් මර්දන ව්‍යාපාරයේ ප්‍රධාන සමාජ විද්‍යාඥයා ලෙස කටයුතු කළ අතර "Behavioral Modification among Sex Workers in Sri Lanka" නමින් කෘතියක් එළි දක්වනු ලැබී ය. සමාජ හරස්කඩ තුළ විවිධ වූ සමාජ ස්ථරවලට කිඳා බැස, එහි අක්මුල් සොයා ගිය මෙම සුවිශේෂී විද්වතා විසින් රචිත සිංහල, ඉංග්‍රීසි ග්‍රන්ථ ප්‍රමාණය අති විශාල වන අතර, එතුමා විසින් පළ කරන ලද ලිපි ලේඛන හා විද්‍යාත්මක ප්‍රකාශන (Scientific Publication) ප්‍රමාණය පුදුම උපදවන සුලු ය. ලාංකේය දෙරණ මත පහළ වූ අතිසුවිශේෂී විද්වතුන් කිහිපදෙනා අතර විශිෂ්ට අනන්‍යතාවක් ගොඩ නඟා ගත් ඔහු 1960 ගණන්වල සාහිත්‍ය ලෝකයේ පෙරළිකාර චරිතයකට පණ පෙවීය. විවිධ වූ හැල හැප්පිලි මැද ඉතාමත් ප්‍රශංසනීය සේවයක්, පුළුල් සමාජ පරාසයක් තුළ සමාජයට දායක කළ මෙම අසහාය විද්වතා, 2007 අගෝස්තු මස 07 වන දින දෑයෙන් සමුගත්තේය. එනමුත් ඔහු විසින් දායක කළ බොහෝ දෑ තවත් පරම්පරා ගණනාවක් පුරා මෙම සමාජ දම්වැල තුළ ගලා ගෙන යනු නො අනුමාන ය. ■

# පො ත ක ව ත



**විශේෂඥ වෛද්‍ය සිසිර සිරිබද්දන**

සා හිත්‍ය විචාරකයින් කොටස් දෙකකට බෙදිය හැකියයි මම සිතමි. අදීන විචාරකයෝ කෘතියේ ගුණදොස් විමසා පාඨකයාගේ නිම් වළලු පුළුල් කිරීමටත් නිර්මාණයේ අලුත් සැඟවුණු මානයන් මතු කිරීමටත් ප්‍රයත්න දරති. අනෙකුත් විචාරකයෝ අන්තර්ජාලයෙන් හා ඉංග්‍රීසි සාහිත්‍යයෙන් අහුලාගත් සංකල්ප හා මතවාදයන්ට අනුව තමන්ගේ සැඟවුණු අභිලාෂ මතු කර පෙන්වීමට කටයුතු කරති.

දනට දශක දෙකකට පමණ පෙර මාක්ස්වාදී සාහිත්‍ය විචාරය පිළිබඳ පුළුල් කතිකාවක් තිබිණ. සුචරිත ගම්ලත් හා පියසීලි විජේගුණසිංහ දෙපල සාකච්ඡා, සම්මන්ත්‍රණ, සඟරා හා පුවත්පත්වලින් මේ සංවාදය ඉදිරියට ගෙන ගියහ. ඔවුන්ගේ තර්කයන්හි ඇති ගාම්භීරත්වය නිසාම ඇස් නිලංකාර වී සිටි අපට පසුව ටික දිනකින් ම එහි ඇති කර්කශ හා නිසරු බව නිසාම ඒවායේ හිස් බව පසක් විණි. අමරසේකරයන් ද "අබුද්දස්ස යුගයක්", "අනගාරික ධර්මපාල මාක්ස්වාදී ද?", "ගනඳුරු මැදියම දකිනෙමි අරුණලු" කෘති පළ කළේ මේ වකවානුවේදී ය. ඔහුගේ සමහර සංකල්පවලට එකල ඇලුම් කළ මුත් අපගේ



මෝඩකම් ඒවායින් පෙන්වා දෙන නිසාදෝ එකල එම අදහස් ඔස්සේ වැඩි දුර සිත් නොයැවුවෙමු.

සිංහල නව කථාව "අබුද්දස්ස යුගයෙන්" විවේචනයට ලක් කළ අමරසේකරයෝ "ගමනක මුල" නව කථා වැල මගින් නව කථා ලියන්නේ මෙලෙස යැයි පෙන්වා දුන්හ. "සිංහල කාව්‍ය සම්ප්‍රදාය" කෘතියෙන් කවිය විචාරය කළ ඔහු "අසක්දා කව" මගින් කවි ලියන්නේ මෙලෙස යැයි පෙන්වා දුන්නේ ය. එතැනින් නොනැවතී "ගනඳුරු මැදියම" හා "අරුණලු සෙරෙන් අරුණෝදයට" වැනි ග්‍රන්ථයන්හි සැබෑ ජාතික ව්‍යාපාරයට අවශ්‍ය දාර්ශනික පසුබිම පහදා දුන් ඔහු පසු කලක එවැනි ව්‍යාපාරයක් බිහි කිරීමට පමණක් නොව ව්‍යාජ ජාතික ව්‍යාපාරයේ වෙස් මුහුණු ගැලවීමටත් මුල් විය.

තමන් විචාරය කරන දේ හරියට කර පෙන්වන විචාරකයකු වන අමරසේකරයන්ගේ "නොසෙවුනා කැඩපත" හෙවත් "නව කථාවේ පරිහානිය" කියවිය යුත්තේ මේ පසුබිම මත ය. පසුගිය අඩසියවස පුරා අප රට ගොදුරු කරගෙන සිටින අනුකාරක චින්තනයෙන් නිදහස් වීමට කරන අඬහැරයකි, මෙම ග්‍රන්ථය. මෙම අනුකාරක චින්තනයේ එක් භෞතික ස්වරූපයක් ශ්‍රී ලංකාවෙන් තුරන් කරමින් සිටින මෙම කාලපරිච්ඡේදය එහි ආධ්‍යාත්මික හා දාර්ශනික අවතාරයක් මතු වීමට ඇති එක් අවකාශයක් වසා දැමීමට කරන ලද ආරාධනාවකි, මෙම කෘතිය. අමරසේකරයන් පෙන්වා දුන් මග ප්‍රතික්ෂේප කරන්නෙකු වන ලියනගේ අමරකීර්ති වැන්නවුන් පවා අමරසේකර යථාභූත (authentic) එසේත් නැත්නම් තමන්ගේ දර්ශනයට අව්‍යාජව සේවය කරන්නකු ලෙස පෙන්වා දෙයි. අනෙකුත් ක්ෂේත්‍රවල සිටින විද්වතුන් ද අදීන සිතුවිලි මත නව නිපැයුම් බිහි කරන්නේ නම් අප අදීන ජාතියක් වේ. අප පර්යේෂණ හා සංවර්ධන ආයතනය බිහි කළේ ද පර්යේෂණ ක්ෂේත්‍රය අදීන චින්තනයෙන් පොහොසත් කිරීමටත් ඒ මත පදනම් වූ දේශීය පර්යේෂණ සංස්කෘතියක් ගොඩ නැඟීමටත් ය. ■

රෝහණ දයාරත්න

විලියම් ඔස්ලර් බටහිර සායනික වෛද්‍ය විද්‍යාවේ ශ්‍රේෂ්ඨයෙකි. ඔහු වරක් මෙසේ කීය. "ඖෂධ ලබා ගැනීමට ඇති ආශාව මිනිසා සතුන්ගෙන් වෙන් කරන ප්‍රධාන ලක්ෂණයකි." මේ කතාව අපේ කිසිවකු සතුන් සමග නොකීම ගැන අපට සතුටු විය හැකි ය. මන්ද එයින් අපේ ශ්‍රේෂ්ඨ විද්‍යාඥයාගේ ජාම බේරී ඇති බැවිනි.

ඔස්ලර්ගේ ඉහත ප්‍රකාශය නිශ්ප්‍රභ කිරීමට අද විද්‍යාඥයින්ට එතරම් මහන්සි විය යුතු නැත. නොයෙක් සතුන් සම්බන්ධයෙන් කරනු ලැබූ නිරීක්ෂණ වාර්තා ඒ සඳහා ලැබෙමින් පවතී. ටැන්සානියාවේ සිටින ඉත්තෑවන් විශේෂයක් ඖෂධ ලබාගැනීම සඳහා, එනම් තමන්ටම බෙහෙත් කර ගැනීම සඳහා විශේෂ හැකියාවක් දක්වන බව නිරීක්ෂණය කර ඇත. එහි එක් ගමක ගැමියෝ ඉත්තෑවකු සුරතල් සතකු ලෙස ඇති කළහ. පසුව මෙම ඉත්තෑවා පාචන රෝගයට සමාන තත්වයකින් පීඩාවට පත් වී ඇත. එවිට මෙම ඉත්තෑවා එක් පඳුරක් අසලට ගොස් එහි මුල් හාරා අනුභව කර ඇත. මෙම පැළෑටිය සාමාන්‍යයෙන් ඉත්තෑවන් අනුභව නොකරන විෂ සහිත පැළෑටියකි. මෙහි මුල් අනුභව කිරීමෙන් ඉත්තෑවාගේ රෝගී තත්වය ඉක්මණින්ම සුව වී තිබේ. මෙම සිදුවීම ඒ අසල සිටි සාම්ප්‍රදායික රෝග සුව කරන්නකුගේ නිරීක්ෂණයට හසු විය. ඉත්තෑවාට සුවය ගෙන දුන් එම පැළෑටියේ මුල් මිනිසුන්ටද ගුණදායක විය හැකියැයි ඔහු අනුමාන කළේය. ඔහුට පසුව පාචන රෝගය වැළඳුන විට එම මුල් අනුභව කිරීමෙන් තම රෝගය සුවපත් කර ගත් අතර ගමේ ඖෂධ ගබඩාවට එම ශාකයේ මුල් ඇතුළත් කර ගත්තේය. මෙවැනි නිරීක්ෂණ මත පදනම්ව කියෝතෝ (Kyoto) සරසවියේ ජීව විද්‍යාඥයෙකු වූ මයිකල් හෆ්මාන් වැනි අය නව විද්‍යාවක් ගොඩ නගමින් සිටී. මෙම අලුත් විද්‍යාවට යොදා ඇති නම Zoo pharmacognosy ය. මෙය විද්‍යාවට එකතුවූ අලුත් වචනයක් නිසා එයට සිංහල නමක් අප නිර්මාණය කර ගත යුතුය. මෙහි සරල අර්ථ දක්වීම නම්, තමන්ට වැළඳෙන නොයෙක් රෝගාබාධයන්ට ප්‍රතිකාර ගැනීම සඳහා ඖෂධ පැළෑටි තෝරා ගැනීමට ඇති සතුන්ගේ හැකියාව පිළිබඳව කරන අධ්‍යයනය යන්නයි. විලියම් ඔස්ලර් මහතාගේ ප්‍රසිද්ධ කියමනක් අනික් අතට පෙරළීමට සමත් වූ සතුන්ගේ මෙම හැකියාව පිළිබඳ ඇති නිරීක්ෂණ තව දුරටත් සනාථ කිරීම සඳහා ක්ෂේත්‍ර පර්යේෂණ මෙන්ම ජෛව රසායනික විශ්ලේෂණ ද සිදුකෙරේ. බ්‍රිතාන්‍ය ජීව විද්‍යාඥයකු වන සින්ඩි එන්ගල් (Cindy Engel) ඔස්ලර් මහතාගේ ප්‍රකාශය මේ ආකාරයට සංශෝධනය කර ඇත. එනම්

# වෛද්‍ය විද්‍යාලයට නොගිය සත්ව ලෝකයේ වෛද්‍යවරු





# සත්ව ලෝකය

"කිසියම් සත්වයකුගේ පැවැත්ම සහතික කරන මූලික සාධකයක් නම් ඔවුන්ට වැළඳෙන රෝගාබාධ සඳහා ඖෂධ සොයාගැනීමට ඇති හැකියාවයි." ඔහු විසින් "වනාන්තරයේ සෞඛ්‍යය හෙවත් සතුන් නිරෝගීව සිටින්නේ කෙසේද සහ එයින් උගත හැකි පාඩම්" (Wild health: how animals keep themselves well and what we can learn from them) යනුවෙන් ග්‍රන්ථයක් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත. එම ග්‍රන්ථයේ සතුන්ගේ මෙම හැකියාවන් පිළිබඳව උදාහරණ බොහොමයක් දක්වා ඇත.

අප්‍රිකානු අලි කිරිමැටි ආහාරයට ලබා ගැනීම සඳහා සැතපුම් ගණනාවක් වුවත් ගමන් කරන අතර හොඬවැල පුරා කිරිමැටි ආහාරයට ගනිති. මෙම කිරිමැටි, අලින්ගේ ශරීරයට අවශ්‍ය විටමින් සහ ඛණිජ ලවණ වලින් පොහොසත්ය.

බටහිර අප්‍රිකාවේ චිම්පන්සි එක්තරා ශාකයක තිත්ත වූ දළු එකෝඩියනයක හැඩයට නමා ගිලිති. මෙසේ නමන ලද දළු ආහාර මාර්ගය ඔස්සේ ගමන් කරන විට ඒවා මගින් ආහාර මාර්ගයේ සිටින පණුවන් ඉවත් කරන බව සොයාගෙන ඇත. කොලබස් (Colobus Monkeys) වර්ගයට අයත් වඳුරන් පළතුරු යුෂ සහ පළතුරු කොටස් පාප්පයක ආකාරයට ඔවුන්ගේ ලෝම සහිත සම මත තවරන බව නිරීක්ෂණය කර ඇත. රසායනික විශ්ලේෂණ මගින් මෙම පළතුරු යුෂවල එන්සයිම අඩංගු වන බව සොයාගෙන ඇත. ඒවා මගින් හම මතුපිට ඇති පරපෝෂිතයින් විනාශ කරන අතර කුඩා තුවාල සුව වීම ඉක්මන් කරයි.

අවට පරිසරයේ ඇති දහස් සංඛ්‍යාත පැළෑටි අතරින් තමන්ගේ රෝගයට ගැළපෙන ඖෂධය තෝරා ගැනීමට සතුන්ගේ ඇති මෙම හැකියාව පිළිබඳව තවම නිසි ලෙස තේරුම් ගැනීමට විද්‍යාඥයින්ට නොහැකි වී ඇත. එම හැකියාව ඔවුන්ගේ ජානවල ගබඩා වී ඇති ලක්ෂණයක් ද? එසේ නැතහොත් තම අත්දැකීම් හා නිරීක්ෂණ මගින් සතුන් ලබා ගන්නා හැකියාවක් ද?

කියෝතෝ සරසවියේ ජීව විද්‍යාඥ හෆ්මාන්, චිම්පන්සි කණ්ඩායම් 11 ක් යොදවා කරන ලද පර්යේෂණයේ නිරීක්ෂණ මෙසේ ය. ඔහු මේ පර්යේෂණය කළේ ආහාර මාර්ගයේ ඇති පණුවන් ඉවත් කරන තිත්ත වූ දළු වඳුරන් විසින් තෝරා ගන්නා ආකාරය පිළිබඳව ය. චිම්පන්සි කණ්ඩායමේ වඳුරන් වැඩි දෙනෙක් එම දළු පිළිබඳව සැලකිල්ලක් නොදැක්වූ අතර කිහිප දෙනෙක් අරමුණකින් තොරව මෙන් ඒවා සැපීමට පටන් ගත්හ. එහෙත් සෑම කණ්ඩායමකම එක් වඳුරෙක් එම දළු උනන්දුවෙන් තෝරා ඉහත විස්තර කළ ආකාරයට නමා ගිලීම පටන් ගත් අතර අනෙක් චිම්පන්සින්ටද එසේ කරන ලෙස උගැන්වූ බව ඔහු නිරීක්ෂණය කර ඇත.

සතුන් සතු මෙම හැකියාව මිනිසුන්ගේ යහපත සඳහා යොදා ගන්නේ කෙසේද?. මේ පිළිබඳව ඖෂධ සමාගම්වල අවධානය යොමු වී තිබේ. එන්ගල් (Engyl) මහතා මේ පිළිබඳව පවසන්නේ, සතුන් කිසියම් හැකියාවක් මගින් තෝරාගන්නේ ඔවුන්ට ගැළපෙන ඖෂධ බවත් මිනිසුන් ස්වාභාවික ශාක ඖෂධ පිළිබඳව උනන්දු



වෛද්‍ය විලියම් ඔස්ලර්

වන්නේ නම් ඔවුන් දේශීය වෛද්‍ය විද්‍යාවන් සහ ආයුර්වේද වෛද්‍ය විද්‍යාව විසින් යොදාගන්නා ශාක ඖෂධ වෙත යොමු විය යුතු බවයි.

එහෙත් පශු වෛද්‍ය විද්‍යාවේ ප්‍රතිකාර සොයා ගැනීම සඳහා මෙම දැනුම මහත් ආලෝකයක් සපයයි. සිංගප්පූරු සත්වෝද්‍යාන පර්යේෂකයින් කණ්ඩායමක් එහි ඔරන් උටන් කණ්ඩායමකට වැළඳුණ පරපෝෂිත ආසාදනයක් සුව කිරීමට මෙම දැනුම යොදාගෙන ඇත. ඔවුන් කළේ එම සතුන්ට කැලේ ජීවත්වන ඔරන් උටන් ආහාරයට ගන්නා කොල වර්ග සහ පළතුරු ආහාරයට ලබා දීමයි. මේ මගින් එම සතුන්ට වැළඳුණු පරපෝෂිත ආසාදනය සුව කිරීමට ඔවුහු සමත් වූහ. මෙය, ආහාරය ඖෂධ ලෙස යොදා ගැනීම පිළිබඳව හොඳ උදාහරණයකි.



කෙසේ වුවද අපට පවුලේ වෛද්‍ය වරයා වෙනුවට චිම්පන්සි වෛද්‍යවරයකු හමුවීමට යාමට නුදුරු අනාගතයේ වුවද සිදු නොවනු ඇත. එසේ වුවත් අපේ වෛද්‍යවරු සහ සත්ව වෛද්‍යවරු අතර වෙනස නම් අපේ වෛද්‍යවරු වෛද්‍ය විද්‍යාල වලින් උපාධිය ලැබීමත් සත්ව වෛද්‍යවරු වෛද්‍ය උපාධි නොලැබීමත් ය. ■

(Enroute සඟරාව ඇසුරිනි.)

වැඩිවිස්තර සඳහා පහත ලිපිනයට ලියන්න.

letters@enroutemag.net
enroutemy.net

It is a widely held view that science and technology (S&T) are a necessary tool for development in any society. What is lacking in most developing countries is a vision for an effective science policy and, most importantly, the political will to implement this policy. My visit in 2000 to Cuba's research institutes in biotechnology, medicine, agriculture and the basic sciences, and my meetings with Cuban scientists, left absolutely no doubt in my mind that Cuba's progress in science has not been achieved overnight. Rather, this progress is the result of a vision and of planning and implementation involving the political directorate, technocrats and scientists.

# Cuban science: a jewel in the Caribbean crown

**Harold Ramkissoon**

One year after the Cuban revolution in 1959, it was decided at the highest political level to link the future of Cuba to the future of science in Cuba. Biotechnology was selected as the focus, reportedly by President Fidel Castro himself. The rationale behind this decision was that, given the limited financial and human resources at the time, S&T had to be development-oriented. Biotechnology was an area of great potential, as it could be used for improving health, mainly through the development of new vaccines; increasing crop yield and enhancing animal production; and for earning hard currency through the marketing of biotechnology products.

Measures were then put in place to create new institutions and train a critical mass of scientists. The Cuban Academy of Sciences (founded in 1861) was reorganized in 1961, 13 institutes were created within the Ministry of Health and the National Centre for Scientific Research (CENIC) was founded in 1964. CENIC's initial role was to train and prepare scientists to staff a number of research institutes still on the drawing board at the time, of which the most internationally renowned is the Centre for Genetic Engineering and Biotechnology (CIGB), founded in 1986.

In 1981, Cuba fell prey to a serious epidemic of dengue fever. The National Centre for Scientific Research summoned a Meeting of Directors from 12 research centres to deal with the crisis. They recalled a suggestion made by Prof. Clarke, a US Scientist who had met with President Fidel Castro in 1973, concerning the use of interferon in viral infections. It seems that two major decisions were taken at this Meeting of Directors, the first being to start work immediately on the production of interferon and the second to build the necessary scientific research capacity for the development of biotechnology. That very year, Cuban interferon was effectively used in the treatment of dengue. This heralded the beginning of accelerated research in molecular biology and genetic engineering that would ultimately lead to the opening of the CIGB.




Today, the CIGB is regarded as the flagship in biosciences in the entire so-called Third World. It is the pride of all Cubans and very much the heart of Cuban science.

Located west of Havana, the CIGB is very much a self contained centre with state-of-the-art equipment, production facilities and with over 1000 employees involved in the dual functions of research and production. The staff includes 700 highly skilled researchers, some of whom are housed in a eighbouring high-rise apartment building. Those I happened to meet seemed highly motivated and very dedicated. Many of them received training abroad in such countries as France, Germany, the UK and Canada.

The main building contains well maintained air-conditioned laboratories, administrative offices, service areas, an auditorium with translation facilities and seating capacity of 400, lecture rooms, language laboratories, a library and a gymnasium. The research facilities include five greenhouses and a biotherium equipped for different animal species. The CIGB counts a number of divisions with specific orientations and goals. Among these are the Vaccine Division, Pharmaceutical Division, Plant Molecular Biology Division, Mammal Cell Genetic Division and the Quality Assurance Division.

A company by the name of Heber Biotec was established in 1991 to market the CIGB's 160 products. Among the products available in over 50 countries are a Hepatitis B vaccine, human alpha interferon, certain enzymes, diagnostic kits which include one for HIV and a cattle tick vaccine. Work is being done on an HIV/AIDS vaccine, a meningitis vaccine, a Hepatitis C vaccine, pharmaceuticals, transgenic fish production and in plant molecular biology (insects and fungal diseases, papaya, coffee, potatoes and tomatoes). The HIV/AIDS vaccine is currently being tested.

Like other scientific organizations in Cuba, the CIGB does not work in isolation. It forms the core of a network of institutions involved in biotechnology research and development (R&D). This network includes:

- the Centre for Molecular Immunology, the focus of which is cancer and the production of pharmaceuticals;
- the National Biopreparations Centre, the main focus of which is the production of Hepatitis B vaccines. The centre also produces media and vaccines in Cuba that were initially developed elsewhere;
- the Finlay Institute, named after national hero Dr Juan Carlos Finlay (1833–1915), whom Cubans claim deserved a Nobel Prize for discovering that yellow fever virus was transmitted by mosquitoes (he was nominated but did not win). The main research at this 112-year old institute fitted out with modern facilities entres on producing new vaccines by combining existing vaccines such as those against influenza and cholera. The meningococcal type B vaccine used to fight meningitis was produced at this institute and earning from the export of this vaccine have netted Cuba US$40 million;
- the National Centre for the Production of Laboratory Animals meets the growing needs of the country's various research centres. The centre produces a variety of animals ranging from mice to monkeys, as well as their food.

**The best health in the developing world**

In the late 1950s, a Cuban infant had a one chance in ten of dying, mainly from diarrhoea and respiratory diseases. There were just over 6000 doctors and one medical school at the time. The health system, I was told, was in a state of rapid decline in those days with medical care beyond the reach of the average Cuban. Along with education and S&T, health was therefore given top priority in the1960s.

Today, UNICEF places Cuba just four notches behind the USA and ahead of all developing countries in terms of children's health. There are 14 medical schools and 60 000 doctors for a population of 11.2 million; this translates into one doctor for approximately every 200 persons. Cuba has the lowest mortality rate (8 per 1000 compared to 11 per 1000 in Great Britain) and the highest life expectancy (73) in Latin America.

Mass immunization has resulted in the almost total eradication of several contagious diseases. Cuba was declared by the Pan-American Health Organization (PAHO) to be the first polio-free country in the Americas. In 1997, no cases of

measles, mumps, rubella or yellow fever were diagnosed. The reasons for Cuba's outstanding health programme are many, among which the fact that medical care, including the supply of drugs, is free to all; the health of mother and child is given priority; the family doctor programme puts doctors and nurses in every neighbor hood to provide primary care. (The family doctor's home is already in existence: a three-story building with a clinic on the first floor, the doctor's living quarters on the second and the nurse's quarters on the third); the availability of 12 vaccines (PAHO recommends seven), including a pneumococcal vaccine developed in Cuba to combat pneumonia, which used to kill thousands of children; and the testing of expectant mothers to avoid abnormalities in newborns. Last but not least, Cuba has an active and effective surveillance and prevention programme. For example, the first cases of a dengue outbreak in December 1996 were detected in January 1997 and circumscribed to just 15 cases thanks to the effectiveness of the Cuban surveillance system.

The emphasis placed on health is borne out by the fact that Cuba's first success in producing a biotechnology product came in 1984 when, with the help of US cancer specialist Randelip Lee Clarke, insulin was produced. More than two million Cubans suffer from diabetes.

In addition to my discussions with medical scientists and doctors, I visited the Pedro Kouri Institute for Tropical Medicine (IPK) established in 1937 and now under the directorship of Gustavo Kouri, grandson of the founding father. The stated goal of the institute is the pursuit of excellence in R&D in such areas as tropical medicine, microbiology and communicable diseases. One focus of microbiology is tuberculosis, as the number of cases augmented recently. The institute is also involved in a number of nature control and eradication programmes, including one for the prevention of AIDS. The institute is also working with the CIGB to produce a dengue vaccine. Great emphasis is placed on preventative medicine – and wisely so, as this reduces health care costs. The institute has a 170-bed hospital which houses mainly AIDS patients. There is also an educational component. A number of courses, mainly postgraduate, are offered for the training of national and foreign professionals. Some of these courses have been sponsored by UNESCO and PAHO. The institute provides advisory services to several countries and has a very active exchange programme.

**Of tobacco, sugar and neem**

Cuban S&T is intimately linked to development and the agricultural sciences are no exception. Research focuses on crops that generate substantial foreign exchange, such as sugar and tobacco, and those that will enable Cuba to feed itself and meet the requirements of the expanding tourism industry. Cuba grows about two-thirds of its own rice requirements. The country has been encouraging organic farming for environmental and economic reasons.

At the Institute of Basic Research in Tropical Agriculture, I was somewhat surprised by the amount of research being done on neem10 to create a natural pesticide. Neem culture got under way in 1991; by 2000, there were over 500 000 neem trees in Cuba. There is a joint proposal with the Caribbean Agriculture and Research Development Institute (CARDI) to produce the technology for the agro-industrial exploitation of the neem tree to obtain pesticides and veterinary products. In point of fact, the proposal goes further, suggesting a pilot programme in St Kitts & Nevis for the production and marketing of the neem pesticides.

Other projects of the Cuban institute include pest management utilizing vegetable residues – only tobacco residue to-date has been used as an insecticide –, a maize hybrid and an integrated management of papaya culture to improve yield.

**Basic research confined mainly to universities**

Research in the basic sciences is conducted primarily at the universities. It seemed to me during my visit that the state of the economy and the country's commitment to biotechnology meant that the basic sciences, though certainly not neglected, could not be afforded the same level of research support.

This does not necessarily mean that the scientists working in these areas are less active or motivated. They attend international conferences and undertake frontier work with researchers abroad. In fact, members of The Institute of Computer Science, Mathematics and Physics host a major international conference every two years. At a meeting with the Head of the Institute and some other members, interest was expressed in establishing links with the rest of the Caribbean. I believe there is potential here for co-operation.

Since my visit in 2000, the government has defined three new priorities for S&T, in consultation with the Cuban scientific community, one of which is basic sciences; the other two are information and communication technologies and social sciences. All three are to be reinforced.

New avenues for co-operation have opened up: in capacitybuilding in basic and pedagogical sciences – Cuba hosted the XIIIth Inter-American Conference on Physics Education in July 2003, for example – , in climate change research, hurricane forecasting, renewable energies, science popularization and, last but not least, gender issues: women make up 65% of human resources in S&T in Cuba. ■

***(Courtsey of A World of SCIENCE)***






**ශ්‍රියන්ති සුජීවා ආරියරත්න**
උසස් පෙළ කලා අංශය - 2007
ජාතික පාසල, දෙහිඕවිට



# ළමා කායික දණ්ඩනය අවශ්‍ය ම ද?

පාසල් විෂය නිර්දේශයට අනුකූල වන ව්‍යාපෘතිය සැකසීම සඳහා ළමා කායික දණ්ඩනය අවශ්‍යම ද යන මාතෘකාව තෝරා ගැනීම සඳහා පසුබිම් වූ අරමුණු ගණනාවක් පවතී.

අරමුණු

- ළමා කායික දණ්ඩනය හා ළමා අතවර සමාජයෙන් මුළුමනින්ම ඉවත් කර දැමීම යහපත් කරුණකි. අනාගතයේ ළමා ලෝකය යහපත් අතට ගැනීමට පාසල් සිසුවියක ලෙස දායක වීම.
- ළමයින්ගේ බාහිර මෙන් ම අභ්‍යන්තර ක්‍රියා අධ්‍යයනය කිරීම.
- ළමා කායික දණ්ඩනයේ අයහපත් ප්‍රතිඵල අවබෝධ කිරීම.
- මේ පිළිබඳ ව සාර්ථක අධ්‍යයනයක යෙදීම.
- කේවල ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම.
- මෙය ග්‍රන්ථයක් ලෙස සකස් කර සාර්ථක ව නිමා කිරීම

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ ආකාරය

1. සුදුසු මාතෘකාවක් තේරීම.
2. මාතෘකාව අනුමත කර ගැනීම.
3. ව්‍යාපෘති යෝජනාව සැකසීම.
4. යෝජනාව අනුමත කර ගැනීම.
5. අවශ්‍ය තොරතුරු සපයා ගැනීම
6. තොරතුරු ක්‍රමවත් ව සැකසීම.
7. අවශ්‍ය පින්තූර සොයා ගැනීම.
8. ව්‍යාපෘතිය සැකසීම.
9. පිට කවර නිර්මාණය.
10. ව්‍යාපෘතිය සකසා නිම කිරීම.
11. ව්‍යාපෘතිය ඉදිරිපත් කිරීම.

හැඳින්වීම

ළමා කායික දණ්ඩනය ඇත්තට ම අවශ්‍ය ම කාරණයක් ද යන්න සොයා බලා පැහැදිලි කර ගැනීම සඳහා මෙය ඉවහල් වේ. ළමයින්ට අනවශ්‍ය අයුරින් වද හිංසා පැමිණ වීම කායික දඬුවම් වශයෙන් ගත හැකි ය. මෙය වර්තමාන සමාජයේ කාලීන ගැටලුවක් බවට පත් වී ඇත. මෙම ගැටලුව සමාජයෙන් ඉවත් කළ යුතු වුව ද අද සමාජයේ බහුල ව සිදු වන වරදකි. මෙම ව්‍යාපෘතිය මගින් ළමා කායික දණ්ඩනය, ළමා අතවර පිළිබඳ ව අධ්‍යයනය කෙරේ.

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ නව නිර්දේශයට අනුකූල ව පවතින ව්‍යාපෘතියට මා විසින් තෝරා ගන්නා ලද්දේ ළමා කායික දණ්ඩනය අවශ්‍ය ම ද යන මාතෘකාව ඔස්සේ අධ්‍යයනය කිරීමයි. මෙය කාලීන වශයෙන් වර්තමාන සමාජයේ පවතින ප්‍රබල ගැටලුවක් වශයෙන් හැඳින්විය හැකි ය. වර්තමාන සමාජය දෙස බලන විට ළමා කායික හිංසනය ඉතා වැඩි වශයෙන් දක ගත හැකි ය.

ළමා කායික දණ්ඩනය ඇත්තට ම අවශ්‍ය කාරණයක් ද යන්න පැහැදිලි කිරීම මින් සිදු වේ. දරුවන්ට අනවශ්‍ය අයුරින් වද හිංසා පැමිණවීම කායික දඬුවම් වශයෙන් හැඳින්විය හැකි ය. සමාජයෙන් ඉවත් කළ යුතු කරුණක් වුව ද මෙය සමාජයේ බහුල ව සිදු වන දෙයකි. වරද පිළිබඳ ව නියම ආකාරයෙන් ළමයාට අවබෝධ කර නො දී ආවේගශීලී ව ළමයකුට තැලීම යුක්ති සහගත නො වේ.

ළමා කායික දණ්ඩනය, ළමා අතවර පිළිබඳ ව හඳුන්වා දීම මෙම ව්‍යාපෘතියෙන් සිදු වේ. ළමා කායික දණ්ඩනය අවශ්‍ය ම ද යන මාතෘකාව ඔස්සේ සිදු කරන ලද ව්‍යාපෘතියේ හැඳින්වීම ඉහත සඳහන් පරිදි ය.

1. **කායික දඬුවම් අප සංස්කෘතියට ආවේණික උරුමයක් ද?**

පැරණි සිංහල රජවරුන් වරදකරුවන්ට විවිධ වද හිංසා පැනවූ බවට සාක්ෂ්‍ය ඇතත්, දරුවන්ට වද හිංසා පැනවූ බවට කරුණු ඇත්තේ ඉතා අල්ප වශයෙනි. වෝහාරික තිස්ස රජු කායික දඬුවම් ඉවත් කිරීමට නීති රීති පවා පනවා තිබූ බවත්, දෙවන විජයබාහු රජු කාරුණිකත්වයට මුල් තැන දී කටයුතු කළ බවත්, තුන් වන විජයබාහු රජු ඔහුගේ කාරුණිකත්වය විශේෂයෙන් ම දරුවන් වෙත යොමු කළ බවත් ඉතිහාසයේ සඳහන් වේ.

ශ්‍රී ලංකා ඉතිහාසය පුරා කායික දඬුවම් ඉතා අල්ප වශයෙන් දැකිය හැක්කේ පිරිවෙන් අධ්‍යාපන හා බෞද්ධ භික්ෂූන්ගේ මාර්ගෝපදේශනයෙන් ලත් පෝෂණය තුළිනැයි පෙනේ. සියලු සත්වයෝ කායික දණ්ඩනයට බිය වෙතැයි ද එහෙයින් ම තමා උපමාවට ගෙන අනුන්ට හිංසා කිරීමෙන් වළකින ලෙසද ධම්ම  පදයේ සඳහන් වේ. අප සංස්කෘතියේ වූ බෞද්ධ සාරධර්ම මගින් සමාජය තුළ නිසැක ව ම ළමා ආරක්ෂාව තහවුරු කර තිබුණි. අතීත ශ්‍රී ලංකාව එසේ තිබෙන වකවානුවේ සමකාලීන යුරෝපයේ පාසල්වල කායික දඬුවම් යන්න කවුරුත් යොදා ගත් ඉතා ම සාමාන්‍ය දෙයක් වී තිබුණි. එනිසා මෙරට පැමිණි විදේශිකයන් මෙරට පාසල්වල ද විශේෂයෙන් ම කායික දඬුවම් ක්‍රියාත්මක කිරීම අරඹන්නට ඇතැයි අනුමාන කළ හැකි ය. වරද පිළිබඳ ව නියම ආකාරයෙන් දරුවාට අවබෝධ කර නො දී ආවේගශීලී ව දරුවකුට තැලීම යුක්ති සහගත දැයි සිතා බැලිය යුතු ය.

2. **වැඩිහිටියන් විසින් තම දරුවන්ට පහර දීමට පෙළඹෙන ප්‍රධාන හේතු හතරකි.**

- වැඩිහිටියෝ කලකිරීමට හා තරහට පත් වූ විට දරුවන්ට පහර දෙති.
- දරුවන් නිවැරදි කිරීම සඳහා වැඩිහිටියෝ දරුවන්ට පහර දෙති.
- එකට එක කිරීම හෙවත් පළිගැනීමක් ලෙස වැඩිහිටියෝ දරුවන්ට පහර දෙති.
- වැඩිහිටියෝ අනතුරකින් වළක්වාගැනීමට දරුවන්ට පහර දෙති.

මෙලොවට දරුවන් බිහි කරන්නේ මව්පියන් වුව ද, මව්පියන් හා වැඩිහිටියන් විසින් පමුණුවන කායික හා මානසික හිංසාවන්ගෙන් සුරැකීමේ අයිතිය දරුවන්ට ඇත. ශ්‍රී ලංකාව ද අත්සන් තබා ඇති එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය මෙන් ම 1995 දී සංශෝධිත අපරාධ නීති සංග්‍රහයට ද අනුව සෑම වැඩිහිටියකුට මෙන් ම සෑම ළමයකුට

ම ද තනි පුද්ගලයකුට මෙන් සැලකීම ද, ගෞරවය හා නීතියෙන් ආරක්ෂාව ලබා දීම ද සිදු විය යුතුය.

3. **ළමා අතවර යනු**

- අනවශ්‍ය ලෙස තරවටු කිරීම.
- අනවශ්‍ය ලෙස සමච්චලයට ලක් කිරීම.
- අසභ්‍ය ක්‍රියාවලට යොමු කිරීම.
- ළමයාව අයුතු ලෙස ස්පර්ශ කිරීම.
- තමාව අයුතු ලෙස ස්පර්ශ කිරීමට ළමයාට බල කිරීම.
- ළමයාගේ ආත්ම විශ්වාසය පළුදු කිරීම.
- ළමයින් මෙහෙකාර සේවයේ යෙදවීම.
- ළමයාට ඇහුම්කන් නොදීම.
- ළමයා බලාපොරොත්තු වන ආදරය ලබා නොදීම.
- ළමයින් පාසල් නොයැවීම.
- ළමයා අනාරක්ෂිත ව තැබීම.
- ළමයාගේ ලෙඩ දුක් ගැන නොසලකා හැරීම.
- වරදට පෙළඹවීම හා අනතුරක් සිදු වීමට ඉඩ තැබීම.
- ළමයාගේ ඇඳුම් පැළඳුම් හා පවිත්‍රතාව පිළිබඳ ව සැලකිලිමත් නොවීම.
- මානසික හා ශාරීරික පීඩාවට ලක් වන ලෙස දඬුවම් කිරීම.
- ළමයා තම නිවස තුළ ම මෙහෙකාරියක් වීම නිසා අධ්‍යාපනයට/ ක්‍රීඩාවට කාලය නොමැති වීම.
- මානසික පීඩනය සමනය කර ගැනීමට ළමයාට වද හිංසා කිරීම.

4. **දරුවන්ට කායික දඬුවම් පැමිණවීමෙන් වැළකිය යුත්තේ ඇයි?**

කායික දඬුවම් පැමිණවීම වේදනාව හා තුවාල ඇති කරයි. දරුවා ලැජ්ජාවට හා අවමානයට පත් කරයි. දරුවා තුළ සාංකාව, වෛරය හා ද්වේශය මතු කරයි. මෙවැනි හැඟීම් පසු කාලීන ව මානසික ගැටලු ඇති කරවිය හැකි ය. එනම් කායික දඬුවම් මගින් දරුවන්ට මානසික ව ද වේදනාව හා තුවාල ඇති කරයි. එය වඩාත් බරපතළ ය.

බොහෝ විට ශාරීරික ව පමුණුවන වද හිංසා දරුවන් ප්‍රචණ්ඩත්වයට යොමු කරවීමට මුල් වන බව පෙනේ. කුඩා කල වද හිංසාවන්ට ගොදුරු වූවන් පසු කාලීනව තම අඹු දරුවන්ට ශාරීරික ව පීඩා පමුණුවන හෝ දිවි නසා ගැනීමට ප්‍රවණතාවක් ඇති පුද්ගලයන් බවට හෝ දෙක ම සිදු කර ගන්නා වූ හෝ අය බවට පත්විය හැකි ය.

*සියලු සත්වයෝ දඬුවමට බිය වෙති - සියල්ලෝ ම මරණයට බිය වෙති*
*සියලු සත්වයෝ ම ජීවිතයට ආසා කරති - එහෙයින් තමාව උපමාවට ගන්න - එවිට ඔබට කුමන හිංසාවක් කා හට කළ හැකි ද?* **-ධම්ම පදය-**

5. **ළමා ශාරීරික දණ්ඩනය වැළැක්වීමට සමාජයට කළ හැක්කේ කුමක් ද?**

දරුවන් හික්මවීමට ඇති වගකීම හා එහි දී පැන නගින ගැටලු ගුරුවරුන් නමැති එක් වැඩිහිටි කොටසක් මත පමණක් පැමිණවීම නොකළ යුත්තකි. ජන සමාජයේ සෑම වැඩිහිටියකු පාහේ ම දරුවන් ව වඩා ඵලදායී හා සුබවාදී ව හික්මවීම් විධි ක්‍රම සම්බන්ධයෙන් දැනුවත් වීම හා එයට සහයෝගය දැක්වීම සිදු කළ යුතු වේ. හික්මවීම් විධි ක්‍රම එක් අයකුට පමණක් ස්ථාපිත කළ නොහැක්කකි. එය නිවැරදි වැටහීමක් සමග සමාජය තුළින් ම ඇති විය යුත්තකි. ගුරුවරුන්, මව්පියන්, දරුවන් ආදී වූ සෑම අයකු තුළ ම හික්මීම හා හික්මවීම යනු කුමක් ද යන්න පිළිබඳ සාමාන්‍ය වැටහීමක් නැතුවා නො වේ. එහෙත් වඩා ඵලදායී හා සුබවාදී ඉලක්කයක් කරා යාමේ දී නිවැරදි මග පෙන්වීමක් හා ආගමික, නීතිමය හා ජනමාධ්‍ය අංශ ඇතුළු ව සමස්ත සමාජයේ ම සහයෝගය ලැබීම අත්‍යවශ්‍ය කරුණකි.

දරුවන්ගේ විනය හා හික්මීම සම්බන්ධ ගැටලු පැන නැඟීම සඳහා හේතු රාශියක් තිබිය හැකි ය. සමස්ත සමාජය ම මේ ගැන මදක් සිතා බලන්නේ නම් එම ගැටලු පිළිබඳ ව මනා වැටහීමක් ඇති කර ගැනීම එතරම් අපහසු කටයුත්තක් නො වේ.

**නිගමනය**

උසස් පෙළ පාසල් විෂය නිර්දේශයට අනුකූල වන ව්‍යාපෘතිය සැකසීමේ දී ළමා කායික දණ්ඩනය අවශ්‍ය ම ද? යන මාතෘකාව යටතේ සැකසූ මෙම ව්‍යාපෘතිය අවසානයේ නිගමන සහ යෝජනා ලෙස පහත දැක්වෙන කරුණු ඉදිරිපත් කළ හැකි ය.

- සමාජයේ වැඩි අවධානය ළමයින් කෙරේ යොමු කරවීම.
- අනාගත ළමා ලෝකය වර්තමානයට වඩා යහපත් කරවීම.
- වැඩිහිටියන් දැනුවත් කරවීම.
- රජයේ අවධානය ළමයින් කෙරේ වැඩි වශයෙන් යොමු වීම.
- ළමයින්ගේ බාහිර මෙන් ම අභ්‍යන්තර ක්‍රියා පුළුල් ව අධ්‍යයනය කිරීම මගින් ඔවුන් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම. ■

## විද්වත් විචරණය

**කේ. වී. සුදර්මා හරිශ්චන්ද්‍ර**
**ප්‍රාථමික ගුරු උපදේශිකා - දෙහිඕවිට**

*සිසුවියක ලෙස ළමා ලෝකය පිළිබඳ ව අවධානය යොමු කිරීම අගය කළ යුත්තකි. ළමා ලෝකයේ සිදු වන අසුන්දර දෙයක් ලෙස කායික දණ්ඩනය හැඳින්විය හැකි ය. එබැවින් ළමා ලෝකය සුන්දර කිරීම සඳහා මෙවැනි මාතෘකාවක් පිළිබඳ ව විචරණයක යෙදීම ප්‍රයෝජනවත් ය.*

*මෙම ව්‍යාපෘති මගින් කායික දඬුවම් අප සංස්කෘතියට ආවේණික උරුමයක් ද? වැඩිහිටියන් විසින් තම දරුවන්ට පහර දීමට පෙළඹෙන හේතු දරුවන් නොමග යාමට හේතු, පිළිබඳ ව මෙන් ම, දරුවකුගේ නොසන්සුන් හැසිරීම් හා පාසලේ වැඩට දක්වන අදක්ෂතාවන්ට හේතු විමර්ශනය කර ඇත. දරුවකුගේ ගැටලුවක දී මැදිහත් විය හැකි ක්‍රම කීපයක් ද ඉදිරිපත් කර ඇත. ළමා අතවර යන්න පිළිබඳ ව අදහස් කරනු ලබන සාධක රාශියක් ද පෙළ ගස්වා ඇත.*

*මෙම අධ්‍යයනයේ අරමුණු හා පර්යේෂණාත්මක තොරතුරු අතර නොගැළපෙන අවස්ථා දක්නට ලැබේ. "ළමා කායික දණ්ඩනය" පිළිබඳ ව තොරතුරු ගවේෂණය කිරීම මීට වඩා පුළුල් විය යුතු ය.*

*"කායික දණ්ඩනය" යනුවෙන් අදහස් කෙරෙන්නේ කුමක් ද යන්න පාඨකයාට පැහැදිලි අවබෝධයක් ලබා ගැනීමට මෙම ව්‍යාපෘතියෙන් හැකි වී නැත. කායික දඬුවම් අප සංස්කෘතියට ආවේණික උරුමයක් ද යන්න විමර්ශනය කිරීම සඳහා අරමුණු පෙළ ගැස්වීමක් දක්නට නොලැබුණ ද, එය විමර්ශනය කිරීම අරමුණුවලින් බැහැර වීමකි.*

*වැඩිහිටියන් විසින් තම දරුවන්ට පහර දීමට පෙළඹෙන ප්‍රධාන හේතු සොයා ගැනීම සාහිත්‍ය විමර්ශනයකින් සිදු වූවා නම් මීට වඩා විශ්වසනීය වනු ඇත. එසේ ම ඒ පිළිබඳ ව විචරණය ද ප්‍රමාණවත් නැත. දරුවන් නොමග යාමට හේතු මෙන් ම, දරුවකු විනයෙන් හා ඉගෙනීමෙන් පසුබසින විට, නම් මාතෘකා යටතේ ද තව දුරටත් විමර්ශනය කිරීම අවශ්‍ය වේ. "ළමා අතවර" යනු කුමක් ද යි මෙම ව්‍යාපෘති වාර්තාවේ අවසාන පරිච්ඡේද සඳහා ඇතුළත් කිරීම නො ගැළපේ.*

*මෙම ව්‍යාපෘතිය මීට වඩා සාර්ථක වීමට නම්, අරමුණු පැහැදිලි ව හඳුනා ගත යුතු ව තිබුණි. එම අරමුණු, අධ්‍යයනය සඳහා අවශ්‍ය මාවත හෙළි පෙහෙළි කරනු ඇත. මාතෘකාවේ අන්තර්ගතය පිළිබඳ ව පාඨකයාට පැහැදිලි අවබෝධයක් ද ලබා දිය යුතු ව තිබුණි. එසේ අවබෝධයක් ලබා දීම සඳහා මෙන් ම ව්‍යාපෘතියේ අන්තර්ගතය පිළිබඳ ව අධ්‍යයනයක යෙදීමත් ඒවා වාර්තා කිරීමත් සඳහා මීට වඩා සම්පත් උපයෝගී කර ගත්තේ නම් ව්‍යාපෘතිය සාර්ථක වනු ඇත. ග්‍රන්ථ හා පුවත්පත් විමර්ශනය කිරීමෙන් එයට පිටිවහලක් විය හැකි ව තිබුණි. එවිට අධ්‍යයනය පිළිබඳ ව පැහැදිලි හා ගැඹුරු දැනුමක් පාඨකයාට ලැබෙනු ඇත.*

*කෙසේ නමුත් සිසුවියක ලෙස මෙවැනි මාතෘකාවක් තෝරා ගෙන ඒ පිළිබඳ ව සැලකිය යුතු වාර්තා හා පැහැදිලි කිරීම් ගොනු කොට තිබීමෙන් ළමා සංවර්ධනය සඳහා යම්කිසි දායකත්වයක් ලබා දෙන නිසා, මේ ව්‍යාපෘතිය කාලීන වූවකැයි නිගමනය කළ හැකි ය.* ■

පර්යේෂණ හා සංවර්ධන පර්ෂදය සහ LACNET ආයතනය විසින් පවත්වන ලද මාර්ග ආරක්ෂාව පිළිබඳ දීපව්‍යාප්ත ව්‍යාපෘති තරගාවලියේ පාසල් අංශයේ දෙවන ස්ථානය දිනාගත් ව්‍යාපෘති වාර්තාවේ සාරාංශය මෙසේ පළ කරමු.

# මග හොඳින් පෙනේ නම් යනෙන දැනුමත් තිබේ නම් ...?



**කේ. ඩී. පියුමි චතුරිකා**
12 වසර, ගොඩපිටිය ම.ම.වි. - අකුරැස්ස

ශ්‍රී ලංකාවේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ බොහෝ අර්බුදකාරී දෑ අත්දැකීමෙන්ම අපි දනිමු. ආර්ථික, සමාජයීය වශයෙන් පහත් තත්වයකට ශ්‍රී ලංකාව පත්වීම කෙරෙහි, මෙම ප්‍රවාහන ක්ෂේත්‍රයේ ගැටලුකාරී තත්ත්ව ද බලපා ඇත. මාර්ග අනතුරු සංඛ්‍යාව ඉහළ යාම හා පරිසර දූෂණය යන ගැටලු නිසා බොහෝ ක්ෂේත්‍රවල දී රජයට දැරීමට සිදු වන වියදම්, ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය නො වූ රටක සංවර්ධනයට විශාල බාධාවකි.

මේ ගැටලු පැන නැගී ඇත්තේ මාර්ග නීති රීති පිළිබඳ ව අවබෝධයක් නොමැති කම හා දත් අයගේ නොසැලකිල්ල හේතු කොට ගෙන ය. මේ නිසා මාර්ග නීති රීති පිළිබඳ දැනුවත් වීම හා ඒවා පිළිපැදීම සියලු දෙනාට ම කරන යහපතකි.

අරමුණු - යහපත් අනාගතයක් උදෙසා, සංවර්ධිත රාජ්‍යයක් ගොඩ නැඟීමට ශ්‍රී ලාංකිකයන් ලෙස අප සැමට වගකීමක් ඇත. එයට දායක වීමට මාර්ග නීති රීති පිළිබඳ ව දැනුවත් කිරීම හා ඒවා පිළිපැදීමෙන් ඔවුන්ටම යහපතක් වන බව ඒත්තු ගැන්වීම ශ්‍රී ලාංකිකයන් වන අප සැමගේ යුතුකමකි.

**ක්‍රියාත්මක කරන ආකාරය-**

1. මාර්ග නීති රීති පිළිබඳ ව ලියැවුණු පොත පතින් තොරතුරු ලබා ගැනීම.
2. මාර්ග නිති රීතිවල අවශ්‍යතාව සම්බන්ධයෙන් විවිධ පුද්ගලයන්ගෙන් අදහස් ලබා ගැනීම.
3. ලබා ගත් තොරතුරු ඇසුරින් කෘතිය සම්පූර්ණ කිරීම.

**මාර්ග නීති රීති අවශ්‍ය වන්නේ ඇයි?**

ශ්‍රී ලංකාවේ මහා මාර්ග පිළිබඳ ලක්ෂණයක් නම් මාර්ග අනතුරු ශීඝ්‍රයෙන් ඉහළ යමින් පැවතීමයි. එමෙන් ම පරිසර දූෂණය, ඉන්ධන අපතේ යෑම ද මීට සම්බන්ධ ගැටලු ය. මේවාට ප්‍රධානතම හේතුව වී ඇත්තේ මාර්ග නීති රීති, මාර්ග සංඥා පිළිබඳ නොදැනුවත්කම හා ඒ පිළිබඳ නොසැලකිල්ලයි. මෙවැනි මාර්ග අනතුරු සඳහා මහා මාර්ගවල ඇති දෝෂ ද බලපා ඇත.

සිදු වන මාර්ග අනතුරුවලට රියදුරන්, මගීන් මෙන් ම මාර්ග අලුත්වැඩියා කටයුතු කරන හා නව මාර්ග ගොඩ නැගීම් කරන කම්කරුවන් හා ඊට සම්බන්ධ ඉහළ නිලධාරීන් ද වගකිව යුතු ය. ඔවුන්ගේ වංක ක්‍රියාකාරකම් නිසා අපහසුතාවට පත්වන්නේ මහජනතාව ය. එහෙත් මාර්ග අනතුරක් සිදු වූ විටෙක බොහෝ අවස්ථාවල දී වැරදිකරු වන්නේ රියදුරා පමණි.

ඉහළ යන මාර්ග අනතුරු විශාල ප්‍රශ්නයක් වී ඇති මෙවන් අවධියක එම අනතුරුවලට වගකිව යුතු ශ්‍රී ලංකාවේ තවත් ප්‍රධාන අංශයක් ලෙස දකින්නේ පොලිස් නිලධාරීන් ය. මේ පිළිබඳ ව සඳහන් කළ යුතු කාරණයක් නම් ආත්මාර්ථකාමීත්වය උදෙසා තමන්ගේ රාජකාරිය හරිහැටි ඉටු නොකරන පොලිස් නිලධාරීන් නිසා මාර්ග අනතුරු සිදු වන බවයි. මහජනයා මෙවැනි පොලිස් නිලධාරීන් පිළිබඳ ව කතා කරන්නේ ඉතා පිළිකුලෙනි.

නොසිතූ වෙලාවන්හි නොසිතූ ආකාරයට රථවාහනවල සිදු වන බෝම්බ පිපිරීම් නිසා ද අද මහජනයා බියෙන් තැති ගෙන සිටිති. මීට අදාළ සැක කටයුතු දේ පිළිබඳ ව පොලිසිය දැනුවත් කිරීමට යන සමහර පුද්ගලයින්ට සිදු වන්නේ බැනුම් අසන්නට ය. ඒ පොලිසියට අයත් රාජකාරී, සිවිල් සමාජයට අයිති නැතැයි සමහර පොලිස් නිලධාරීන් පවසන නිසා ය. මේ නිසා පුද්ගලයෙක්, බෝම්බයක් පුපුරන තෙක් ඒ ගැන පොලිසිය වෙත දැනුම් දීමට මහජනයා මැලි වෙති.

මහජනයාගෙන් බොහෝ පිරිසක් අද දෝෂාරෝපණය කරන්නේ පොලිසියටයි. මෙහි දී පොලිසිය නිවැරදි වුවත් සමහර අවස්ථාවල මහජනයා දකින ඔවුන්ගේ වංකකම් හා අකාරුණිකකම් නිසා ඔවුන් ව මහජනයා විසින් පිළිකුල් කෙරෙයි. මාර්ග අනතුරු සිදු වූ විට මැදිහත් වීමට සිදු වන්නේ පොලිසියටයි. නමුත් අනතුරු සිදු වීමට පෙර එම අනතුරු වැළැක්වීමට කටයුතු නොකර ඔවුන් වංකකම් සිදු කරනවා නම් මාර්ග අනතුරුවල අඩු වීමක් කිසි දා දැකිය නොහැකි ය. මේ නිසා සෞඛ්‍ය අංශවලට ද විශාල මුදලක් මේ වෙනුවෙන් වැය කිරීමට සිදු වී ඇත.

මාර්ග නීති රීති පිළිබඳ ව නොදැනුවත් කම හා නොසැලකිලිමත් කම නිසා සිදු වන තවත් බරපතළ ප්‍රශ්නයක් නම් පරිසර දූෂණයයි. දිගු වේලාවක් මාර්ග තදබදයට හසු වන රථ වාහනවලින් පිට වන දුම නිසා වායු දූෂණය වේ. මෙයින් පෘථිවියේ ආරක්ෂාවට ස්වභාව ධර්මයෙන් ලබා දී ඇති අපූරු ආවරණය වන ඕසෝන් ස්ථරය විනාශ වී යාමට ඇති ඉඩකඩ වැඩි වී ඇත. එමෙන්

# පාසල් ව්‍යාපෘති

ම මෙම ප්‍රමාදය නිසා සීමිත සම්පතක් වන ඉන්ධන ද අනවශ්‍ය ලෙස නාස්ති වේ.

**ගැටලු විසඳීමට මාර්ග**

මාර්ග අනතුරු, පරිසර දූෂණය වැනි ප්‍රබල ගැටලු අවම කර ගැනීමට විසඳුම් අප විසින් සොයා ගත යුතු ය.

- අපට කළ හැකි එක් පිළියමක් නම් මහජනයා, විශේෂයෙන් රියදුරන් දැනුවත් කිරීමයි. මෙහි දී මහජනයා ඒකරාශී කර ගැනීම එතරම් අපහසු කාරණයක් ලෙස සිතිය යුතු නැත. උදාහරණයක් ලෙස මෑත දී බස් රථවල බෝම්බ පිපිරීම් සම්බන්ධ ව පැවැත්වූ දැනුවත් කිරීමේ වැඩසටහන්වලට ඉතා හොඳ සහභාගීත්වයක් දැක ගත හැකි විය.

එසේත් නොමැති නම් තවත් ක්‍රමයක් ඇත. මෙයට යම් වියදමක් දැරිය යුතු නමුත් ඉහත සඳහන් ගැටලු නිසා වියදම් වන මුදලට වඩා ඉතාමත් අඩු වියදමකින් මෙය කළ හැකි යයි විශ්වාස කළ හැකි ය. වර්තමානයේ බොහෝ පිරිසකගේ අවධානයට යොමු වී ඇති මාතෘකාවක් ලෙස පෞරුෂත්වය ගොඩ නැගීම සඳහන් කළ හැකි ය. මෙවැනි පෞරුෂත්ව පුහුණු වැඩමුළු ද සමග සම්බන්ධ කොට අපට අවශ්‍ය දැනුවත් කිරීමේ වැඩසටහන්වලට හොඳ සහභාගීත්වයක් ලබා ගත හැකිවාක් මෙන් ම අපට ඔවුන්ගේ සිත් තුළට කාවැද්දිය යුතු දෙය ද ලබා දිය හැකි ය.

- තවත් ක්‍රමයක් ලෙස රූපවාහිනී මාධ්‍යයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්විය හැකි ය. මෙහි දී දේශන ආකාරයෙන් නො ව ශ්‍රී ලාංකිකයන් වඩාත් කැමති ආකාරයකට, ටෙලි නාට්‍ය හෝ ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් ලෙස මේ පිළිබඳ පණිවිඩ සන්නිවේදනය කළ හැකි ය.

ටෙලි නාට්‍යයක් නම්, හාස්‍ය ජනක ක්‍රියාකාරකම් මගින්, ප්‍රේක්ෂකයාගේ සිතට දැනෙන ලෙස පණිවිඩ ලබා දිය හැකි ය. මහජනයා කරන වැරදි මෝඩ පුද්ගලයින් කරන ඒවා ලෙස ලේබල් කළ විට, මහජනයා එම වැරදි සිදු වීම හිතා මතා ම නවත්වා ගන්නට උත්සාහ කරනු ඇත.

ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක් නම් වර්තමානයේ රූපවාහිනී මාධ්‍යයේ ඉතා ජනප්‍රිය වැඩසටහන් ව පවතින සුපිරි තරු තේරීමේ වැඩසටහනක ආකාරයෙන් සිදු කළ හැකි ය. වියදම් වන මුදල ආයෝජනයකි. තව ද නිවෙස්වල සිටින අයගෙන් ප්‍රශ්න කරන්නේ නම්, පිළිතුරු කරුණු සොයා බලා විස්තරාත්මක ව ඉදිරිපත් කළ යුතුය, ආදී කොන්දේසි ඇති ව ප්‍රශ්න කළ හැකි ය.

- තව ද රියදුරු බලපත්‍ර ලබා දීමේ දී දැනට වඩා විධිමත් ක්‍රමයක් අනුගමනය කළ යුතු ව ඇත. ඒ සඳහා යොදවා ඇති නිලධාරීන් එය අවංක ව නියමිත ආකාරයට කරන්නේ දැ යි පරීක්ෂා කළ යුතු අතර, බලපත්‍ර ලබා ගැනීමට පැමිණෙන පුද්ගලයින් සඳහා පැවැත්වෙන පරීක්ෂණය දැනට වඩා ප්‍රායෝගික කළ යුතු ය. එම පරීක්ෂණයේදී ප්‍රමිතියට යටත් නො වන පුද්ගලයින් ද දැනුවත් ද වැඩ කළ යුතු ය.

පරිසර දූෂණයට පිළියමක් ලෙස මෝටර් රථවල දුම්බට තුළ උත්ප්‍රේරක පරිවර්තක සවි කිරීමට මහජනයා යොමු කළ යුතු ය. මෙහිදීත් ඉහත කී තරගයක ආකාරය අනුගමනය කළ හැකි ය. එනම් ඕනෑම මොහොතක ඕනෑම ස්ථානයක දී ඒවා පරීක්ෂා කිරීමට නිලධාරීන් යොමු කර එසේ උත්ප්‍රේරක පරිවර්තක තිබේ නම් යම් තිළිණයක් දෙන බවට ප්‍රචාරණයක් දිය හැකි ය. (තිළිණය ලෙස දින කිහිපයක් තුළ දී තම රථයට ඉන්ධන මිල දී ගැනීමේදි කිසියම් ප්‍රමාණයක වට්ටමක් දීම වැනි රියදුරන්ට වටිනා දෙයක් දිය හැකි ය). මෙම ක්‍රියාදාමය ටික කලක් කළ යුතු අතර ඒ සඳහා ම නිලධාරීන් පත් කළ යුතු නැත. ■

## විද්වත් විචාරණය

**සංස්කාරක මඬුල්ල**

**ගවේෂණ**

*මෙම ව්‍යාපෘතිය විමර්ශන ගණයට අයත් වේ. සිසුවිය තම ව්‍යාපෘතිය මඟින් මාර්ග අනතුරු, මහා මාර්ග නීති රීති සහ මාර්ග අනතුරු වැළැක්විය හැකි විධි පිළිබඳ ව මහජනතාව දැනුවත් කළ හැකි ක්‍රම විමර්ශනය කර ඇත. එමෙන්ම ඇය තම ව්‍යාපෘතිය නිම කර ඇති ආකාරයෙන් එය දැඩි කැපවීමකින් හා උන්නදුවකින් කර ඇති බව පෙනෙන්නට තිබේ.*

*ව්‍යාපෘති යෝජනාව, ව්‍යාපෘති හැඳින්වීමේ දී ඉදිරිපත් කරන ලද කරුණු සහ ඒ තුළින් බලාපොරොත්තු වන අරමුණු අතර පරස්පර බවකි දක්නට තිබේ. එනම් හැඳින්වීම තුළ සිසුවිය විසින් අවධාරණය කළ යුතුව තිබුණේ, මාර්ග නීති රීති පිළිබඳව නොදැනුවත්කම සහ ඒවාට අවනත නොවීම හේතු කොට ගෙන ලාංකේය සාමාජය මේ වන විට පත්ව ඇති අර්බුදකාරී තත්වය පිළිබඳ ව යි.*

*සිසුවිය ඇගේ අදහස් ප්‍රකාශ කරනවාට වඩා පවතින තත්වය තහවුරු කිරීම සඳහා අදාළ වගකීම් දරන රජයේ නිලධාරින් සමඟ සාකච්ඡා කොට, ඔවුන්ගේ ප්‍රකාශ උපුටා දැක්වීමට හැකි වූවා නම් ව්‍යාපෘතිය තුළින් ඇය බලාපොරොත්තු වූ අරමුණු වඩාත් සාක්ෂාත් කර ගැනීමට හැකියාව තිබිණි. එහෙත් පුවත් පත් වල ප්‍රවෘත්ති උපුටා දැක්වීම තුළින් ගැටළුවේ බරපතළකම හුවා දැක්වීමට ගෙන ඇති උත්සාහය සාර්ථක ය.*

*තම සේවය පැහැර හරින නිලධාරීන් සිටිය ද, තම සේවය නිසියාකාරව ඉටු කරන නිලධාරීන් සිටින බව අමතක කොට ඇත.*

*සිසුවිය විසින් විශේෂයෙන් අවධානය යොමු කළ යුතුව තිබුණ කරුණු මඟ හැරීයාම තුළින් ව්‍යාපෘතියේ අරමුණුවලට හානියක් සිදු වී ඇත. උදාහරණ ලෙස නුපුහුණු සහ සුදුසුකම් නැති පුද්ගලයන් රිය ධාවනය කිරීම, විශේෂයෙන්ම රියදුරු බලපත්‍ර ලබා දීමේ දී තිබිය යුතු ප්‍රමිතිය පිළිබඳ සැලකිලිමත් නොවීම, නුපුහුණු සහ සුදුසුකම් නැති රියදුරන්ගේ බලපත්‍ර අහෝසි කිරීම ආදී කරුණු නොසලකා හැර ඇත.*

*ජනමාධ්‍යයන්ට ඉටු කළ හැකි කාර්යභාරය මීට වඩා ගැඹුරින් සාකච්ඡා කළ යුතුව තිබිණි. එනම් මෙම ගැටළුවේ දී ජනමාධ්‍ය කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ නිසි පැහැදිලි කිරීමක් සිසුවිය විසින් සිදු කර නැත.*

*පරිසර දූෂණය පිළිබඳව සිසුවිය වැඩි අවධානය යොමු කර ඇති නිසා ඇය ඇගේ අරමුණු වලින් බැහැරව ගොස් ඇති බව පෙනේ. මාර්ග නීති රීති නොපිළිපැදීම තුළින් යම් ආකාරයක පරිසර දූෂණයක් සිදු වුව ද සිසුවිය විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති කරුණු තුළින් ඇය ඇගේ ව්‍යාපෘතිය වෙනත් මඟකට ගෙන ඇත.*

*ඉහත සඳහන් කළ පරිදි මෙම ව්‍යාපෘතියේ යම් යම් අඩු ලුහුඬුකම් තිබුණ ද මහා මාර්ග භාවිතයේ දී රියදුරන් මෙන්ම පදිකයන්ට ද බලපාන සියලුම නීති රීති පිළිබඳ සවිස්තරව පැහැදිලි කිරීම තුළින් ව්‍යාපෘතියේ අරමුණ කරා යම් තාක් දුරට ළඟා වීමට සිසුවිය හට හැකි වී ඇත.* ■